24

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

# கமத்தொழில் அபிவிருத்தி அதிகார சபை

# AGRICULTURAL DEVELOPMENT AUTHORITY

1986 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂයේ වාර්තාව

1986 டிசெம்பர் 31 உடன் முடிவுள்ள வருடத்துக்கான ஆண்டு அறிக்கை

Annual Report for year ended 31 December 1986



DEPARTMENT OF AGRICULTURE
CENTRAL
12-6-1990
LIBRARY
PERADENIYA.

# ප ටු න


| පිළිවෙළ | | පිටුව |
|---|---|---|
| 1. | සාමාන්‍ය තොරතුරු<br>ප්‍රධාන කාර්යාලයීය විධායක කාර්ය මණ්ඩලය<br>මැතිවරණ කොට්ඨාශ කාර්ය මණ්ඩලය<br>මැතිවරණ කොට්ඨාශ 110 සඳහා වූ සේවක සංඛ්‍යාව ... ... ... | 1—10 |
| 2. | සභාපතිතුමාගේ සමාලෝචනය ... ... ... | 11—13 |
| 3. | දකුණු පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 14—15 |
| 4. | ඌව පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 16—17 |
| 5. | උතුරු මැද පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 18—19 |
| 6. | වයඹ පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 20—22 |
| 7. | මධ්‍යම පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 23—25 |
| 8. | බටහිර පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 26—27 |
| 9. | උතුරු පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 28—30 |
| 10. | සබරගමුව පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 31—33 |
| 11. | නැගෙනහිර පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 34—36 |
| 12. | පුහුණු හා ප්‍රචාරක කටයුතු භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 37—39 |
| 13. | කෘෂිකාර්මික යෙදවුම් අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 40—44 |
| 14. | අලෙවි අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 45—48 |
| 15. | ව්‍යාපෘති ඇගයීමේ අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 49—51 |
| 16. | 1986.12.31 දිනට ශේෂ පත්‍රය ... ... ... | 52 |
| 17. | 1986.01.01 සිට 1986.12.31 දක්වා ආදයම් සහ වියදම් ගිණුම ... ... ... | 53—57 |
| 18. | විගණකාධිපතිගේ සහතිකය ... ... ... | 58 |
| 19. | විගණකාධිපති වාර්තාව ... ... ... | 59—62 |


298

THIS BOOK / PUBLICATION
WAS PRESENTED TO
Central Library
by Dr. S. D. J. E. Gunawardana Director
Date 90 . 06 . 12

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

**අධ්‍යක්ෂ මණ්ඩලය :**

| | |
|---|---|
| රන්ජන් විජේරත්න මහතා (එෆ්.සී.අයි.පී.) | සභාපති |
| පී. බී. රත්නායක මහතා (සාමාන්‍යාධිකාරී මහජන, බැංකුව) (86.8.1 දක්වා) | අධ්‍යක්ෂ |
| සී. එම්. බී. බෝගොල්ලාගම මහතා (86.12.1 දින සිට) | අධ්‍යක්ෂ |
| ආර්. අයි. ප්‍රනාන්දුපුල්ලේ මහතා (සභාපති — පො:ව:ම:) | අධ්‍යක්ෂ |
| එච්. එම්. සී. කපිලරත්න මහතා (ගොවිජන සේවා කොමසාරිස්) | අධ්‍යක්ෂ |
| ආචාර්ය එස්. ඩී. අයි. ඊ. ගුණවර්ධන මහතා (කෘෂිකර්ම අධ්‍යක්ෂ) | අධ්‍යක්ෂ |
| ආචාර්ය සී. ආර්. පානබොක්ක මහතා | අධ්‍යක්ෂ |
| නීතිඥ ඩී. එච්. එන්. ජයමහ මහතා (86.4.28 දක්වා) | අධ්‍යක්ෂ |
| නීතිඥ මර්වින් සමරවීර මහතා (86.8.26 දින සිට) | අධ්‍යක්ෂ |

**ප්‍රධාන කාර්යාලය :**

තැ. පෙ. 1767 අංක 38, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

**බැංකුකරුවෝ :**

මහජන බැංකුව

**විගණකවරු :**

විගණකාධිපති

**ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය (පළාත් අධ්‍යක්ෂවරු)**

| | | |
|---|---|---|
| දකුණු පළාත | ඒ. ඕ. බී. ද අල්මේද මහතා | බී. එස්. සී. (ස්වාභාවික විද්‍යාව), ඒ. සී. අයි. පී එළවළු බෝග වගාව සහ අලෙවිය පාඨමාලාව, රට්ගර්ස් විශ්ව විද්‍යාලය, ඇමෙරිකා එක්සත් ජනපදය |
| උතුරුමැද පළාත | එන්. ජී. වික්‍රමසිංහ මහතා | බී.එස්.සී. |
| වයඹ පළාත | ජී. ඒ. කුමාරගේ මහතා | |
| මධ්‍යම පළාත | පී. සී. අබේනායක මහතා | |
| බටහිර පළාත | ජී. එල්. ඩී මෙල් මහතා | |
| උතුරු පළාත | අයි. එම්. වේදනායගම් මහතා | බී.එස්.සී. (කෘෂිකර්ම) |
| සබරගමු පළාත | පී. ඒ. ආර්. පතිරණ මහතා | |
| නැගෙනහිර පළාත | ඩී. එච්. එස්. ඩබ්ලිව්. තිලකරත්න මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා |
| ඌව පළාත | මර්වින් එෆ්. ගුණවර්ධන මහතා | |

**නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු**

| | | |
|---|---|---|
| දකුණු පළාත (ගාල්ල) | ඒ. එම්. අබේරත්න මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා |
| (මාතර) | ඒ. එල්. වී. ප්‍රනාන්දු මහතා | බී. එස්. සී. (වතු කළමනාකරණය හා තක්සේරුකරණය). |

| | | |
|---|---|---|
| (හම්බන්තොට) | ඩී. එස්. ඒ. ගමගේ මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා |
| උතුරුමැද පළාත (අනුරාධපුරය) | ජී. කරුණාසේන මහතා | |
| (පොළොන්නරුව) | ඩී. එස්. කේ. විතාන මහතා | බී.ඒ. |
| වයඹ පළාත (කුරුණෑගල | එස්. බී. රැකව මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා (86.4.1 දින සිට) |
| (පුත්තලම) | එල්. පී. පතිරණ මහතා | බී.එස්.සී. (කෘෂිකර්ම) |
| මධ්‍යම පළාත (මාතලේ) | එන්. ලියෝනිදස් මහතා | |
| (මහනුවර) | එන්. එස්. එස්. කේ. සේමසිංහ මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා |
| (නුවරඑළිය) | ආර්. දීප්ත කුලතිලක මහතා | එම්.එස්.සී. (කෘෂිකර්ම) |
| බටහිර පළාත (කළුතර) | ආර්. ජේ. හේරත් මහතා (86.9.30 දක්වා) | |
| (ගම්පහ | ආර්. ඩබ්ලිව්. ඩී. ඩබ්ලිව්. පී. බී. රාජකරුණා මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා |
| උතුරු පළාත (වව්නියාව) | පුරප්පාඩුයි. | |
| සබරගමු පළාත (රත්නපුරය) | ඩී. ඩී. ද එස්. අමරවීර මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා, කෘෂිකර්ම ඉංජිනේරු කරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය (බටහිර ජර්මනිය) |
| (කෑගල්ල) | එස්. බී. රැකව මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා (86.3.31 දක්වා) |
| | එස්. එම්. සෙනෙවිරත්න මහතා | කෘෂි/ඩිප්ලෝමා (86.2.1 දින සිට) |
| නැගෙනහිර පළාත (අම්පාර) | ආර්. මාදවන් මහතා | බී.එස්.සී. |
| (මඩකලපුව) | පුරප්පාඩුයි | |
| (ත්‍රිකුණාමලය) | පුරප්පාඩුයි | |
| ඌව පළාත (මොණරාගල) | ඒ. සී. ආර්. ද සිල්වා මහතා | |
| (බදුල්ල) | ගැමුණු සමරකෝන් මහතා | |

**පුහුණු හා ප්‍රචාරක**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ : | එන්. යූ. අයි. පෙරේරා මහතා | කෘෂිකර්ම ඩිප්ලෝමා ද්විතීය පුහුණු (කෘෂිකර්ම විද්‍යා) පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කෘෂි අධ්‍යාපනය) වූස්ටර්, එක්සත් රාජධානිය |

**කෘෂි යෙදවුම්**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ : | ආර්. ටී. සී. පිරිස් මහතා | බී.එස්.සී. (ඉංජිනේරු) එම්. ඉංජිනේරු (වාරි මාර්ග සහ ජල බලය) එම්.අයි.සී.ඊ. (ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු). |

**නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්**

| | |
|---|---|
| කෘෂිකාර්මික ණය හා රක්ෂණ | එන්. කේ. අධිකාරම්ගේ මහතා (බී.ඒ.) — 1986.10.31 දක්වා. |
| පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය | බී. බී. ඒ. ඊ. මැදිවක මහතා (බී.එස්.සී.) |
| වාරිමාර්ග | එස්. සී. මංචනායක මහතා (වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරි විභාගය, ලෝක බැංකුවේ ආර්ථික සංවර්ධන ආයතනයේ විදේශ සාමාජික) |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

| | |
|---|---|
| සත්ව පාලනය | ජේ. එස්. සොයිසා මහතා, කෘෂිකර්ම ඩිප්ලෝමා (සත්ව පාලනය විශේෂ), කෘෂිකර්ම ඩිප්ලෝමා (සත්ව හා භෝග විවිධාංගීකරණය පිළිබඳ විශේෂ පුහුණුව, කුලෝන්ග් විශ්ව විද්‍යාලය, මලයාසියාව) — 86.9.30 දක්වා. |
| | ආර්. එම්. බී. ප්‍රනාන්දු මහතා, බී.එස්.සී. (කෘෂිකර්ම), එම්.එස්.සී. (කෘෂිකර්ම) (1986.6.1 දින සිට |
| කෘෂි උපකරණ හා ගොවිපළ බලය | ඒ. ඩී. එම්. කරුණාරත්න මහතා, කෘෂිකර්ම ඩිප්ලෝමා, රබර් තාක්ෂණික විද්‍යාව. ක්‍රවුන් සහතිකය. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ නඩත්තුව හා පාලනය (එක්සත් රාජධානිය). |
| බීජ හා රෝපණ ද්‍රව්‍ය | පී. එම්. බී. ඒකනායක මහතා, බී.එස්.සී. (කෘෂිකර්ම) |
| **අලෙවි කටයුතු** | |
| අධ්‍යක්ෂ | ආචාර්ය උපාලි නානායක්කාර මහතා, බී.ඒ. (ආර්ථික විද්‍යාව), ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය, ඩිප්ලෝමා අයි.බී.කේ. (ලන්ඩන්), එම්.ඒ. (සංනිවේදන), එම්.එස්.සී. (කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව, එම්.බී.ඒ. (ආහාර ක්‍රම, ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය) පී.එච්.ඩී. (කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව), මිචිගන් ජනපද විශ්ව විද්‍යාලය, ඇමෙරිකා එක්සත් ජනපදය. |
| **නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්** | |
| ගබඩා හා ගුදම් | ඩී. ටී. කිංග්ස්ලි බර්නාඩ් මහතා, බී.එස්.සී. (සංඛ්‍යායනය හා ගණිතය), පරිගණක විධි සැලසුම් ඩිප්ලෝමා (ජා.ව්‍යා.ක.ආ.) කෘෂි අලෙවි ඩිප්ලෝමා ජාත්‍යන්තර කෘෂිකර්ම අධ්‍යාපන පාසැල, කොළරාඩෝ ප්‍රාන්ත විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය, අලෙවි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා (ජා.ව්‍යා.ක.ආ.) එම්.බී.ඒ., කොළඹ විශ්ව විද්‍යාලය. |
| ප්‍රවාහන හා සංනිවේදන | ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු මහතා, බී.එස්.සී. (සංඛ්‍යායනය හා ගණිතය), අලෙවි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා, (ජා.ව්‍යා.ක.ආ). |
| මිළ හා සංඛ්‍යාලේඛන | පී.ඩී.සී.එෆ්. ලොයිඩ් මහතා—බී.එස්.සී. (සංඛ්‍යායනය හා ගණිතය) |
| සංඛ්‍යාලේඛන නිලධාරී : | ටී. මුතුමාල මහතා, බී.එස්.සී. (සංඛ්‍යායනය හා ගණිතය) |
| **ව්‍යාපෘති ඇගයීම** | |
| අධ්‍යක්ෂ | ආචාර්ය නෙල්සන් විතානගේ මහතා, බී.එස්.සී., කෘෂිකර්මය, (ශ්‍රී ලංකා), එම්.ඒ., කෘෂි ආර්ථික විද්‍යාව, එක්සත් රාජධානිය පී.එච්.ඩී., ආර්ථික විද්‍යාව, එක්සත් රාජධානිය. (86.3.10 දක්වා), |
| අධ්‍යක්ෂ : | ඒ. බී. ඩී. පී. වික්‍රමරත්න මහතා, (විද්‍යාවේදී උපාධි, වරලත් රසායන විද්‍යාඥ, ලංකා රසායන විද්‍යා ආයතනය සාමාජික, 1986.08.05 දින සිට. |
| **ගිණුම්** | |
| ප්‍රධාන ගණකාධිකාරී | එස්. සී. හතරසිංහ මහත්මිය |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

**පරිපාලනය**

| | |
|---|---|
| අධ්‍යක්ෂ | සී. ජේ. පී. ගුණවර්ධන මහතා, බී.ඒ. (ලංකා) |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ : | සුසන්ත පෙරේරා මහතා, බී.එස්.සී. (විද්‍යාලංකාර) |
| සහකාර අධ්‍යක්ෂ/ප්‍රවාහන | ඩී. කන්දඋඩහේවා මහතා බී.ඒ. විශේෂවේදී, ප්‍රවාහන ආර්ථික විද්‍යාව, මෝටර් කාර්මික විද්‍යා සහතිකය (ල.ජ.කා.අ.ආ.) |
| සහකාර අධ්‍යක්ෂ/පරිපාලන | ඩී. ගමආරිය මහතා |
| සභාපතිගේ පෞද්ගලික ලේකම්වරුන් : | ජී. වෛද්‍ය ජීවක මහත්මිය<br>ඒ. එන්. අමරසේකර මෙනෙවිය<br>එච්. කේ. මල්දෙණිය මෙනෙවිය. |

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| දකුණු පළාත | වැලිගම | ඩී. ගුණවර්ධන මහතා, ක්ෂේත්‍ර පර්යේෂණ ඩිප්ලෝමා, බටහිර ජර්මනිය | ගොවිජනසේවා මධ්‍යස්ථානය බොරාල, වැලිගම |
| | අකුරැස්ස | එච්. ඩබ්ලිව්. ගුණසේකර මහතා කෘ. ඩිප්ලෝමා | ගොවිජනසේවා මධ්‍යස්ථානය අකුරැස්ස. |
| | හක්මන | එන්. එච්. පාලිත යාපා මහතා | ගො.සේ.ම., පස්ගොඩ, දෙනියාය හරහා |
| | දෙණියාය | ඒ. පී. රණතුංග මහතා කෘ. ඩිප්ලෝමා | ගො.සේ.ම., මොරවක |
| | මාතර | පී. විනෝදහේවා මහතා, බී.ඒ. | ගො.සේ.ම.,ඉසදීන් නගරය ගොඩගම, මාතර |
| | කඹුරුපිටිය | සිරිල් රාජපක්ෂ මහතා | ගො.සේ.ම. කඹුරුපිටිය |
| | තංගල්ල | එච්. ඒ. පියසිරි මහතා බී.ඒ. (86.11.01, දින සිට) | ගො.සේ.ම නෙටොල්පිටිය |
| | මුල්කිරිගල | එස්. වී. වීරරත්න මහතා | ගො.සේ.ම., වලස්මුල්ල |
| | බෙලිඅත්ත | ඒ. පී. එස්. විජේසිංහ මහතා (86.11.01දින සිට) | ගො.සේ.ම. බෙලිඅත්ත |
| | තිස්සමහාරාම I | එච්. එම්. ඒ. බී. කරුණාරත්න මහතා බී.ඒ. | ගො.සේ.ම. අම්බලන්තොට |
| | තිස්සමහාරාම II | සිරිමල් අබේධීර මහතා බී. ඒ. | ගො.සේ.ම., යෝධකන්ඩිය |
| | අක්මීමන | ජී. කොඩිතුවක්කු මහතා කෘෂි. /ඩිප්ලෝමා | ගො.සේ.ම. ලබුදූව |
| | හිනිදුම | ඒ. එච්. පී. ගුණවර්ධන මහතා | ගො.සේ.ම. නාගොඩ, ඇතුමලේ |
| | කරන්දෙනිය | ජී. ඩී. ගුණරත්න මහතා කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම. උරගස්මංහන්දිය |
| | බද්දේගම | පුරප්පාඩුයි | ගො.සේ.ම., වඳුරඹ |
| | දෙවිනුවර | ඩී. එන්. යාපා මහතා | ගො.සේ.ම. දික්වැල්ල. |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලයීය ලිපිනය |
|---|---|---|---|
| දකුණු පළාත | හබරාදූව | බී. ඩී. ඒ. ද සිල්වා ගාර්දියවසම් මහතා ගුරුපුහුණු සහතිකය (කෘෂිකර්ම විශේෂ) | ගො.සේ.ම. කොග්ගල |
| | බෙන්තර ඇල්පිටිය | ජේ. කොඩිතුවක්කු මහතා කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම. ඇල්පිටිය |
| | අම්බලන්ගොඩ | එම්. එල්. කුලතුංග මහතා කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම අම්බලන්ගොඩ |
| උතුරු මැද පළාත | බටහිර අනුරාධපුරය I | ආර්. එස්. ඩී. මහදිවුල්වැව මහතා | ගො.සේ.ම. ඇල්යාපත්තුව |
| | බටහිර අනුරාධපුරය II | එච්. එම්. පී. හේරත් මහතා කෘෂි./ඩිප්ලෝමා | ගොසේ.ම. නොච්චියාගම |
| | නැගෙනහිර අනුරාධපුරය | ඩබ්ලිව්. ධර්මවර්ධන මහතා | ගො.සේ.ම., ගොඩගේ මාවත නවනගරය, අනුරාධපුරය |
| | කැකිරාව | ටී. එම්. පී. බණ්ඩාරනායක මහතා කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම. කැකිරාව |
| | මිහින්තලේ | කේ. බී. රත්නායක මහතා කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. තිරප්පනේ |
| | කලාවැව | එස්. ආර්. බී. පළුගස්වැව මහතා කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. එප්පාවල |
| | හොරොව්පතාන I | ඒ. ආර්. එම්. ඒ. රත්නායක මහතා කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. ගලෙන්බිඳුනවැව |
| | හොරොව්පතාන II | ආර්. එම්. එස්. රත්නායක මහතා බී.ඒ. | ගො.සේ.ම. හොරොව්පතාන |
| | මැදවච්චිය II | ඩී. සුභසිංහ මහතා බී. ඒ. | ගො.සේ.ම., ඇතාකඩ |
| | මැදවච්චිය I | කේ. එම්. පොඩිඅප්පුහාමි මහතා (ප්‍රා.කෘ.පා. සහතිකය) | ගො.සේ.ම. මැදවච්චිය |
| | මින්නේරිය II | පී. ඩබ්ලිව්. තිලකරත්න බණ්ඩා මහතා බී.ඒ. | ගො.සේ.ම. හිඟුරක්ගොඩ |
| | මින්නේරිය I | යූ. අප්පුහාමි මහතා බී.ඒ. | ගො.සේ.ම. බකමූණ |
| | මැදිරිගිරිය | ඒ. ඩබ්ලිව්. ආරියරත්න මහතා කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම. මැදිරිගිරිය |
| | පොළොන්නරුව I | ඩී. බී. වීරසූරියගෙදර මහතා බී.ඒ. (ගෞ) | ගො.සේ.ම. මනම්පිටිය |
| | පොළොන්නරුව II | පුරප්පාඩුයි | ගො.සේ.ම., නවනගරය පොළොන්නරුව |
| වයඹ පළාත | පඩුවස්නුවර | ආර්. එම්. නිමල් බණ්ඩාර මහතා | ගො.සේ.ම., තුත්තිරිපිටිගම හෙට්ටිපොල |
| | දෙඩම්ගස්ලන්ද | දිලිප ජයසිංහ මහතා කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. රම්බඩගල්ල |
| | බිංගිරිය | ඩබ්ලිව්. ඒ. එන්. විජේසිංහ මහතා කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. දුම්මලසූරිය |
| | යාපහුව | ටී. එස්. ගුණසේකර මහතා කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. මහව |
| | නිකවැරටිය | එස්. ඒ. එල්. සේනානායක මහතා කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. නිකවැරටිය |
| | මාවතගම | එච්. එල්. ජයසිංහ මහතා | ගො.සේ.ම., මාවතගම |
| | දඹදෙණිය | ඒ. වරාගොඩ මහතා බී.ඒ. | ගො.සේ.ම., නාරම්මල |
| | ගල්ගමුව | ටී. එම්. ජයතිලක මහතා, විද්‍යාවේදී රාජ්‍ය මූල්‍ය හා අයබදු | ගො.සේ.ම. ගල්ගමුව |
| | වාරියපොල | ඩබ්ලිව්. ඒ. ජේ. කේ. වාසලමුණි මහතා | ගො.සේ.ම. වාරියපොල |
| | හිරියාල | ඒ. එම්. අබේරත්න මහතා කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම. ගනේවත්ත |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
| --- | --- | --- | --- |
| වයඹ පළාත | පොල්ගහවෙල | එස්. ඒ. කුලරත්න මහතා | ගො.ෙ.ස්.ම.<br>පොල්ගහවෙල |
| | කුලියාපිටිය | පී. එම්. ධර්මසේන මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>කුලියාපිටිය |
| | කටුගම්පොල | සරත් ශ්‍රී රාජවික්‍රම මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ලේකම් කාර්යාල<br>ගොඩනැගිල්ල, පන්නල |
| | කුරුණෑගල | ජී. ආර්. කේ. හේරත් මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. දකුණු රවුම් පාර<br>කුරුණෑගල |
| | ආණමඩුව දකුණ | කේ. ඒ. ඩී. පීටර් මහතා බී.ඒ. | ගො.සේ.ම. ආණමඩුව |
| | ආණමඩුව උතුර | කේ. ඩී. ජයවීර මහතා,<br>බී.ඒ. | ගො.සේ.ම. පුත්තලම<br>තබ්බෝව |
| | පුත්තලම | වි. ජී. කිව් ප්‍රනාන්දු මහතා<br>කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>මදුරන්කුලිය |
| | නාත්තන්ඩිය | පී. ඒ. ප්‍රනාන්දු මහතා<br>බී. එස්.සී., (කෘෂිකර්මය) | ගො.සේ.ම, තබ්බෝව<br>නාත්තන්ඩිය |
| | වෙන්නප්පුව | පී. එම්. පියරත්න මහතා<br>කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>හාල්දඩුවන, දංකොටුව |
| | හලාවත | ඩබ්ලිව්. පී. එස්. වීරසිංහ මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>මුගුණවටවන |
| මධ්‍යම පළාත | තෙල්දෙණිය | එම්. විජේතුංග මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>උඩිස්පත්තුව |
| | උඩුදුම්බර | ආර්. එම්. ආර්. රණවීර මහතා<br>බී.ඒ. | ගම්සභා කාර්යාලය<br>හසලක |
| | හාරිස්පත්තුව | එස්. එම්. එස්. සුලේමාන් මහතා<br>බී.ඒ. | ගො.සේ.ම., යටිවාවල<br>කටුගස්තොට |
| | ගම්පොල | ආනන්ද සමරසිංහ මහතා, බී.ඒ. | ගො.සේ.ම., ගම්පොල |
| | පාතදුම්බර | එස්. එම්. සෙනෙවිරත්න මහතා<br>කෘෂි./ඩිප්ලෝමා 86/1/31 දක්වා | ගො.සේ.ම.<br>වත්තේගම |
| | ගලගෙදර | ඩී. ආර්. කේ. හේනේගම මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>ගලගෙදර |
| | නාවලපිටිය | ඩබ්ලිව්. බී. වීරසිංහ මහතා<br>කෘෂි. /ඩිප්ලෝමා | ගො.සේ.ම., කුරුඳුවත්ත<br>උඩහේන්තැන්න |
| | යටිනුවර | එච්. එම්. ජයවීර බණ්ඩාර මහතා,<br>බී.ඒ. | ගො.සේ.ම.<br>ගිරාගම, පිළිමතලාව |
| | උඩුනුවර | අයි. එම්. ජී. සෙනෙවිරත්න මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම., ඉඹුල්දෙණිය<br>හන්දෙස්ස |
| | කුණ්ඩසාලේ | ගාමිණී ගුණසේකර මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>ගුණ්ණෑපාන |
| | හේවාහැට | එස්. බී. දිසානායක මහතා, බී.ඒ. | ගො.සේ.ම., තලාතුඔය |
| | රත්තොට | ඒ. එම්. විද්‍යාරත්න මහතා<br>බී.ඒ. | ගො.සේ.ම., වේරගම<br>කයිකාවල |
| | දඹුල්ල II | බී. කේ. සෝමසිරි මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>ගලේවෙල |
| | දඹුල්ල I | ඒ. ජී. රංබණ්ඩා මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>දඹුල්ල |
| | මාතලේ | සී. බී. යටවර මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>පලාපත්වල |
| | ලග්ගල I | එච්. එම්. ජී. ඒකනායක මහතා<br>බී.ඒ. | ගො.සේ.ම., අලුගොල්ල<br>නාඋල |
| | ලග්ගල II | එන්. කේ. රත්නින්ද මහතා<br>බී.ඒ. | ගො.සේ.ම. හෙට්ටිපොල,<br>විල්ගමුව |
| | හඟුරන්කෙත | එන්. බී. ඩබ්ලිව්. එන්. පොලොන්වෙල<br>මහතා, බී.ඒ. | ගො.සේ.ම.<br>හඟුරන්කෙත |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකර්ම කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| මධ්‍යම පළාත | කොත්මලේ | ඒ. ඩබ්ලිව්. පියදස මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>පුණ්ඩලූඔය |
| | වලපනේ | පී. බී. එම්. රණවීර මහතා<br>බී.ඒ. | ගො.සේ.ම., මූල්හල්කැලේ<br>වලපනේ |
| | නුවරඑළිය | ඩබ්ලිව්. ආනන්ද වීරසිංහ මහතා<br>කෘෂි./ඩිප්ලෝමා (86/3/31 දක්වා) | ගො.සේ.ම.<br>ලිඳුල |
| | මස්කෙලිය | ජී. කේ. නන්දසේන මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>ගිනිගත්හේන |
| බටහිර පළාත | දෙමපෙ | ජේ. පී. පෙරේරා මහතා<br>බී.ඒ. | ගො.සේ.ම., වැකේ<br>කිරිදිවැල |
| | ගම්පහ | ඩබ්ලිව්. එල්. පී. ආරියසේන මහතා<br>බී. ඒ. | ගො.සේ.ම.<br>මුදුන්ගොඩ |
| | කටාන | ඒ. එච්. එස්. විජේරත්න මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>ආඩිඅම්බලම |
| | කැළණිය | ඩී. ටී. දිසානායක මහතා<br>බී.එස්.සී., (කෘෂි.) | ගො.සේ.ම., කැළණිය<br>මහර, කඩවත |
| | මහර | ආර්. ඒ. ඩී. ඒ. රාමනායක මහතා | ගො.සේ.ම., සූරියපාලුව<br>කඩවත |
| | ජාඇල | ටී. ඩී. එන්. තෝමස් මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>ජාඇල |
| | අත්තනගල්ල | ටී. ඒ. කරුණාතිලක මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම., වේයන්ගොඩ<br>නිට්ටඹුව |
| | මීනුවන්ගොඩ | කේ. ඒ. ඒ. කුරුප්පු මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>මීනුවන්ගොඩ |
| | දිවුලපිටිය | අයි. ඒ. ජී. ආර්. ඉඹුලාන මහතා<br>කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>වල්පිට |
| | මීරිගම | ජී. එම්. එස්. පෙරේරා මහතා<br>කෘෂි. /ඩිප්ලෝමා (86/5/1 දින සිට) | ගො.සේ.ම.<br>මීරිගම |
| | බියගම | කේ. ඩී. වසන්ත කුමාර මහතා<br>කෘෂි./ඩිප්ලෝමා (86/5/1 දින සිට) | ගො.සේ.ම.<br>දෙල්ගොඩ. |
| | වත්තල | පී. එච්. එන්. පෙරේරා මහතා<br>කෘෂි./ඩිප්ලෝමා (86/2/5 දින සිට) | ගො.සේ.ම.<br>පමුණුගම |
| | මතුගම | සී. ඩබ්ලිව්. විජේගුණවර්ධන මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>මතුගම |
| | බණ්ඩාරගම | ටී. ඒ. පෙරේරා මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>බණ්ඩාරගම |
| | හොරණ | ඩී. බී. අබේසිංහ මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>හොරණ |
| | බුලත්සිංහල | එම්. කේ. වික්‍රමරත්න මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>බුලත්සිංහල |
| | අගලවත්ත | ඩී. ඩී. දයාරත්න මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>අගලවත්ත |
| | කළුතර/බේරුවල | එම්. එල්. වීරකෝන් මහතා<br>කෘෂි./ඩිප්ලෝමා (86/2/28 දින සිට) | ගො.සේ.ම.<br>නාගොඩ, කළුතර |
| | හෝමාගම | ටී. ඒ. කේ. රණවීර මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>හෝමාගම |
| | අවිස්සාවේල්ල | එම්. ඩී. සී. වී. ගුණතිලක මහතා<br>බී.එස්.සී. | ගො.සේ.ම.<br>කොස්ගම |
| | කඩුවෙල | එල්. ඩී. එන්. ජයසේකර මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>මාලඹේ |
| | මහරගම | ගුණපාල මහානාම මහතා<br>බී.ඒ. (විශේෂවේදී ජනසංනිවේදන) | ගො.සේ.ම.<br>උඩහමුල්ල |
| | කැස්බෑව | ආර්. ඒ. එස්. ජයවර්ධන මහතා<br>(සං. අධ්‍යයනවේදී විශේෂ උපාධිය) | ගො.සේ.ම.<br>බෝකුන්දර |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| උතුරු පළාත | මුලතිව් I | එන්. සෙල්වරාජා මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. මුල්ලියවලෙයි,<br>මුලතිව් |
| | මුලතිව් II | වී. ශ්‍රීස්කන්දරාජා මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ. ම., පන්ඩියකුලම්<br>වව්නිකුලම් |
| | කිලිනොච්චි I | එස්. සිවගුරු නාදන් මහතා<br>කෘෂි. ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>උරුත්‍රපුරම් |
| | කිලිනොච්චි II | කේ. අරසකුලසිංහම් මහතා<br>කෘෂි. /ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>පුලියම්පොකනෙ |
| | මන්නාරම I | පී. ක්‍රිසෝස්ටම් මහතා<br>කෘෂි. /ඩිප්ලෝමා | ගො.සේ.ම. මන්තායි,<br>තිරුකේස්වරම් |
| | මන්නාරම II | එම්. සාන්තම්පිල්ලේ මහතා<br>කෘෂි. /ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>මුරුන්කන් |
| | වව්නියාව I | පී. කුගදසන් මහතා<br>කෘෂි. /ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>පොම්පයිමඩු |
| | වව්නියාව II | කේ. ගනේෂරත්නම් මහතා<br>බී.එස්.සී. | ගො.සේ.ම., ඕමන්තයි<br>වව්නියා |
| | වව්නියා III | එස්. රාජරත්න මහතා<br>බී. ඒ. (විශේෂ) | ගො.සේ.ම.<br>මඩුකන්ද |
| සබරගමුව පළාත | නිවිතිගල | කේ. එම්. ජේ. බණ්ඩාර මහතා<br>(සංවර්ධන අධ්‍යයනවේදී වී. උපාධිය) | ගො.සේ.ම.<br>නිවිතිගල |
| | රක්වාන | ආර්. ජී. පුංචිමහත්තයා මහතා<br>කෘෂි. /ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>ගොඩකවෙල |
| | බලංගොඩ | ඊ. ඩබ්ලිව්. අබේරත්න මහතා<br>බී.ඒ. | ගො.සේ.ම. බුලත්ගම.<br>බලංගොඩ |
| | කලවාන | පී. ලේකම්ගේ මහතා කෘෂි./ඩිප්ලෝමා<br>(86.3.31 දක්වා)<br>ඒ. ජී. කේ. දව්ගලගම මහතා බී.ඒ.<br>(86.10.1 දින සිට) | කෘෂි. සං. අධිකාරිය<br>කලවාන<br>කෘෂි. සං. අධිකාරිය<br>කලවාන |
| | කොළොන්න | ඒ. පී. ජයසූරිය මහතා<br>බී.ඒ. (ගෞරව) | ගො.සේ.ම.<br>ඇඹිලිපිටිය |
| | රත්නපුරය | එම්. පී. විජේපාල මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>කුරුවිට |
| | පැල්මඩුල්ල | එන්. එස්. ගුණවර්ධන මහත්මිය<br>බී.එස්.සී. | ගො.සේ.ම.<br>පැල්මඩුල්ල |
| | ඇහැලියගොඩ | අයි. ඩී. ජයසිංහ මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>ඇහැලියගොඩ |
| | කෑගල්ල | ඩබ්ලිව්. ජී. විමලරත්න මහතා | ගො.සේ.ම.<br>පරගම්මන |
| | යටියන්තොට | ඒ. ආර්. එම්. එස්. එම්. බී. රණසිංහ මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>යටියන්තොට |
| | අරනායක | කේ. වීරසිංහ මහතා | ගො.සේ.ම., උස්සාපිටිය<br>අරනායක |
| | දැදිගම | එච්. එම්. ජී. එන්. කේ. කලුහැන්දිවල මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>අඹේපුස්ස, වරකාපොල |
| | රුවන්වැල්ල | බී. ඒ. කේ. පී. ගුණසිංහ මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>රුවන්වැල්ල |
| | රඹුක්කන | එස්. ඩී. මාරසිංහ මහතා<br>කෘෂි.ඃඩිප්ලෝමා | ගො.සේ.ම.<br>රඹුක්කන |
| | දැරණියගල | ඊ. ඒ. සමරජීව මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම., පනාවල<br>ඇහැලියගොඩ |
| | මාවනැල්ල | ආර්. එම්. එස්. නොයෙල් මහතා<br>බී.ඇස්.සී. (ගෞරව) | ගො.සේ.ම.<br>බැමිනිවත්ත |
| | ගලිගමුව | එස්. එම්. ජේ. බී. සේනානායක මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>යටටෝගොඩ |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

| | | | |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | පොතුවිල් I | එම්. අයි. අහමඩ් ලෙබ්බෙ මහතා<br>කෘෂි/ඩිප්ලෝමා | උපදිසාපති කාර්යාලය,<br>අඩාලච්චේනයි |
| | පොතුවිල් II | එස්. සුන්දරම්පිල්ලේ මහතා<br>කෘෂි/ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>තම්බිලුවිල් |
| | සමන්තුරේ | අයි. ඒ. ජබාර් මහතා<br>කෘෂි/ඩිප්ලෝමා | "යස්මින්"<br>සමන්තුරේ |
| | අම්පාර I | කේ. ජී. එස්. විජේසිරි මහතා<br>බී.ඒ. (විශේෂ) | ගො.සේ.ම.<br>උහන |
| | අම්පාර II | ඩී. ආර්. ගුණවර්ධන මහතා | ගො.සේ.ම., මහඔය |
| | කල්කුඩා I | පී. ගුණපාලසිංහම් | ගො.සේ.ම.<br>වෙන්කලාඩි |
| | කල්කුඩා II | එන්. තුෂ්යන්දන් මහතා | ගො.සේ.ම.<br>වාලච්චෙනෙයි |
| | ත්‍රිකුණාමලය | පුරප්පාඩුයි | ගො.සේ.ම., උප්පුවේලි |
| | සේරුවිල I | පී. රී. රාජකරුණා මහතා<br>කෘෂි./ ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>කන්තලේ |
| | සේරුවිල II | ජී. බී. රත්නායක මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>පන්කුලම් |
| | පදිරිප්පු | ආර්. තේවේන්දිරරාජා මහතා<br>බී.එස්.සී. | ගො.සේ.ම.<br>කලුවන්චිකුඩි |
| | මුතූර් | ඒ. බී. ලදරුසේන මහතා<br>(ප්‍ර.කෘ.පා.ස.) | ගො.සේ.ම.<br>මොල්ලිපතාන |
| | මඩකලපුව | වී. කනගරත්නම් මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>කල්ලඩි |
| ඌව පළාත | වැලිමඩ | එම්. බී. එම්. ආර්. බණ්ඩාර මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>කැප්පෙටිපොල |
| | බණ්ඩාරවෙල | එස්. එම්. ගුණවර්ධන මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම. විශාඛා මාවත<br>බණ්ඩාරවෙල |
| | හපුතලේ I | කේ. බී. එම්. සෙනෙවිරත්න මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>නිකපොත |
| | හපුතලේ II | ආර්. එම්. එස්. රත්නායක මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>දියතලාව |
| | වියලුව | වයි. එම්. මුතුබණ්ඩා යාපා මහතා<br>බී.ඒ. | පා.ම. කාර්යාලය බාරේ<br>රිදීපාන, බදුල්ල |
| | ඌව පරණගම | වී. ඩබ්ලිව්. එම්. ජයසේන මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>යටිපලාත, අඹගස්දෝව |
| | මහියංගනය I | ටී. එම්. ආරියවංශ මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>මහියංගනය |
| | මහියංගනය II | ඊ. එම්. යූ. එල්. ඒකනායක මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>රිදීමාලියද්ද |
| | බදුල්ල | ඩබ්ලිව්. රංජන් ඩයස් මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>රඹුක්පොත , බදුල්ල |
| | පස්සර | ඩබ්ලිව්. එම්. උභයරත්න මහතා බී.ඒ.<br>(86.6.1. දින සිට) | ගො.සේ.ම.<br>පස්සර |
| | හාලිඇල | කේ. ඒ. ප්‍රේමසිරි මහතා<br>බී.එස්.සී. | ගො.සේ.ම.<br>හාලිඇල |
| | වැල්ලවාය I | එල්. ආර්. එම්. ජී. කඳුරුගමුව මහතා | ගො.සේ.ම.<br>වැල්ලවාය |
| | වැල්ලවාය II | ඩබ්ලිව්. හඳපාන්ගල මහතා බී.ඒ.<br>(86.8.1 දින සිට) | ගො.සේ.ම.<br>තණමල්විල |
| | බිබිල I | ආර්. එම්. බලවර්ධන මහතා<br>බී.ඒ. | ගො.සේ.ම.<br>මැදගම, බිබිල |
| | බිබිල II | ඒ. එම්. ගුණවර්ධන බණ්ඩා මහතා<br>(සංවර්ධන අධ්‍යයනවේදී විශේෂ උපාධිය) | ගො.සේ.ම.<br>බිබිල |
| | මොණරාගල I | එච්. එම්. සමරකෝන් බණ්ඩා මහතා<br>බී. එස්.සී. | ගො.සේ.ම.<br>බඩල්කුඹුර |
| | මොණරාගල II | ඩබ්ලිව්. එස්. පෙරේරා මහතා<br>කෘෂි./ඩිප්ලෝමා | ගො.සේ.ම.<br>මොණරාගල |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සාමාන්‍ය තොරතුරු—වාර්ෂික වාර්තාව—1986

| තනතුර | සේවක සංඛ්‍යාව | පත්කළ සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| පළාත් අධ්‍යක්ෂවරු ... ... ... ... | 09 | 09 | නැත |
| අධ්‍යක්ෂ — කෘෂිකාර්මික යෙදවුම් ... ... ... ... | 01 | 01 | නැත |
| අධ්‍යක්ෂ — පුහුණු හා ප්‍රචාරක ... ... ... ... | 01 | 01 | නැත |
| අධ්‍යක්ෂ — අලෙවි ... ... ... ... | 01 | 01 | නැත |
| අධ්‍යක්ෂ — පරිපාලන ... ... ... ... | 01 | 01 | නැත |
| අධ්‍යක්ෂ — ව්‍යාපෘති අගයීම් ... ... ... ... | 01 | 01 | නැත |
| ප්‍රධාන ගණකාධිකාරී ... ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — පරිපාලන ... ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය පළාත් භාර අධ්‍යක්ෂ ... ... ... ... | 20 | 18 | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — බීජ හා රෝපන ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — ණය හා රක්ෂණ ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — උපකරණ හා ගොවිපල බලය ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — සත්ව පාලන ... ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — වාරිමාර්ග ... ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — මිළ හා සංඛ්‍යාලේඛන ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — ගබඩා හා ගුදම් ... ... ... | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — ප්‍රවාහන හා සංනිවේදන ... ... ... | 01 | 01 | නැත |
| සහකාර අධ්‍යක්ෂ — ප්‍රවාහන ... ... ... ... | 01 | 01 | නැත |
| සහකාර අධ්‍යක්ෂ — පරිපාලන ... ... ... ... | 01 | 01 | නැත |
| සංඛ්‍යාලේඛණ නිලධාරී ... ... ... ... | 01 | 01 | නැත |
| සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් ... ... ... | 03 | 03 | නැත |
| කෘෂිකර්ම කළමණාකරුවන් ... ... ... ... | 157 | 151 | 06 |
| පොත් තබන්නා ... ... ... ... | 02 | 02 | නැත |
| පරිවර්තක ... ... ... ... | 01 | 01 | නැත |
| ලිපිකරු — ප්‍රධාන කාර්යාලය (දෙවන හා තුන්වන ශ්‍රේණිය) ... ... | 12 | 12 | නැත |
| ලිපිකරුවන් — මැතිවරණ කොට්ඨාශ ... ... ... | 157 | 155 | 02 |
| ලිපිකරුවන් — නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ කාර්යාල ... ... ... | 20 | 19 | 01 |
| ලඝු ලේඛක (සිංහල හා ඉංග්‍රීසි) | | | |
| ලේකම් ශ්‍රේණිය ... ... ... ... | | 03 | නැත |
| ඉහල ශ්‍රේණිය ... ... ... ... | 28 | 13 | නැත |
| පහල ශ්‍රේණිය ... ... ... ... | | 11 | 01 |
| යතුරු ලේඛක ... ... ... ... ... | 02 | 02 | නැත |
| පිළිගැනීමේ නිලධාරිනි/දුරකථන ක්‍රියාකරවන්නී ... ... ... | 01 | 01 | නැත |
| රියැදුරු — (ප්‍රධාන කාර්යාලය) ... ... ... | 22 | 22 | නැත |
| රියැදුරු — (මැතිවරණ කොට්ඨාශ) ... ... ... ... | 157 | 155 | 02 |
| රියැදුරු — (නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරුන්) ... ... ... | 20 | 18 | 02 |
| කාර්යාල කාර්ය සහායක — (11 ශ්‍රේණිය) ... ... ... | 12 | 12 | නැත |
| සහකාර ආරක්ෂක නියාමක ... ... ... ... | 01 | 01 | නැත |
| කම්කරුවන් ... ... ... ... ... | 01 | 01 | නැත |
| | 644 | 628 | 16 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිතුමාගේ සමාලෝචනය—1986

මගේ පසුගිය සමාලෝචනයෙහි සඳහන් කරන ලද පරිදි, වර්ෂ 1986 දී සියලුම කෘෂිකාර්මික මැතිවරණ කොට්ඨාශ මෙම අධිකාරිය යටතට පත් කොට එය මැතිවරණ කොට්ඨාශ 130 ක ක්‍රියාත්මක විය. මෙයින් පරිබාහිර වූයේ දැනට පවත්නා අස්ථිර තත්ත්වය හේතුකොටගෙන වැඩ කටයුතු ආරම්භ කළ නොහැකි වූ යාපනේ අර්ධද්වීපයේ මැතිවරණ කොට්ඨාශ දහය පමණි. කළුතර සහ බේරුවල මැතිවරණ කොට්ඨාශ එක් කෘෂිකාර්මික කළමනාකරුවකු යටතේ ක්‍රියාත්මක වූයේ වී නමුදු කල් යත්ම, එම මැතිවරණ කොට්ඨාශ දෙක වෙන වෙනම පිහිට වූ ඒකක දෙකක් වශයෙන් ක්‍රියාත්මක කළ යුතු බැව් පෙනී ගියේය. මේවා මුහුදු බඩ මැතිවරණ කොට්ඨාශ වුවත්, මෙම මැතිවරණ කොට්ඨාශ දෙකම අතිශයින් ජනාකීර්ණ බවත්, එක් කළමනාකරුවකුට මැතිවරණ කොට්ඨාශ දෙකම සම්බන්ධීකරණය කළ නොහැකි වන තරමට අභ්‍යන්තරික ප්‍රදේශවල සැලකිය යුතු ප්‍රමාණයක කෘෂිකාර්මික වැඩ කටයුතු පවත්වාගෙන යන බවත් අවබෝධ විය. එබැවින් වර්ෂ 1987 දී මෙම මැතිවරණ කොට්ඨාශ දෙක වෙන්කර, කළුතර වෙනුවෙන් වෙනම කළමනාකරුවකු පත් කිරීමට යෝජනා කර තිබේ.

පොදුවේ ගත් කල, මෙම අධිකාරිය විසින් උතුරු පළාතේ මැතිවරණ කොට්ඨාශ සහ නැගෙනහිර පළාතේ ඇතැම් මැතිවරණ කොට්ඨාශ හැර, වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීමෙ තවත් සාර්ථක වර්ෂයක් සම්පූර්ණ කර තිබේ.

### ආහාර බෝග අංශය

ශ්‍රී ලංකාව සහල්වලින් ස්වයංපෝෂිත කිරීම කරා යන ගමනේදී ඉලක්කය වී ඇත්තේ, වර්ෂයකට වී බුසල් මිලියන 140 ක් නිපදවීමයි. මෙවැනි ඉලක්කයක් හමුවේ, ලබා ඇති වී අස්වැන්න මෙසේ විය :

| | | |
|---|---|---|
| 1985/86 මහ කන්නයේ වී බුසල් මිලියන | ... | 80.8 |
| 1986 යල කන්නයේ වී බුසල් මිලියන | ... | 43.5 |
| මුළු ප්‍රමාණය | | 124.3 |

අප රටේ සහල් නිෂ්පාදනයට අර්ථවත් ලෙස දායක වන ප්‍රදේශ දෙකක් වන උතුරු හා නැගෙනහිර පළාත්වල නිෂ්පාදනය අඩපන වීමේ ප්‍රතිඵලයක් වශයෙන් උද්ගත විය හැකි කවර හෝ ආපද තත්ත්වයකට මුහුණ දීමේ අරමුණ ඇතිව, 1986 දී ආහාර කොමසාරිස් විසින් සහල් මෙට්රික් ටොන් 2,20,300 ක් ආනයන කරන ලදී.

ස්වයංපෝෂිත කිරීමේ අරමුණ ළඟාකර ගැනීමේ අටියෙන් මේ රටේ වී ගොවිතැන් කරන ගොවි ජනතාවට වර්ෂ 1977 සිට මෙම රජයේ උපරිම අවධානය ලැබී ඇති අතර, ඔවුනට යෙදවුම් පිළිබඳ පහසුකම්, අවම මිළ ගණන් මෙන්ම වඩා හොඳ සැලකිල්ලක් සැලසී ඇත. ගොවියන් විසින්, ඔවුනට සැලසී ඇති පහසුකම්වලින් නිසි ප්‍රයෝජන ලබා ගන්නේ නම් සහල් නිෂ්පාදනය තවදුරටත් වැඩි වනවා ඇත. රටේ දේශපාලන ස්ථාවරත්වයක් ඇතිවී කාලගුණ තත්ත්වය ද යහපත් වුවහොත්, වී වගා අංශයේ වැඩ කටයුතු ස්ථාවර විය යුතුයි. තම මූලික ආහාරය වශයෙන් ජනතාව විසින් බත් හා සහල්වලින් සාදගත් ආහාර තවදුරටත් පරිභෝජනය කරන බැවින්, වඩා හොඳ ප්‍රෝටීන් පදර්ථ අන්තර්ගත වැඩි පෝෂ්‍ය ගුණයකින් යුතු ආහාර ජනතාවට ලබා ගැනීමට සැලැස්වීමේ අවශ්‍යතාව රජය විසින් සළකා බැලිය යුතුවේ. කව්පී, සෝයා, මුං ඇට, දඹල, උඳු හා බඩ ඉරිඟු වැනි අතිරේක ආහාර බෝග වගා කිරීම අප දිරි ගන්වයි. වර්ෂ 1986 තුළ ප්‍රධාන මාංශ භෝග සමහරක නිෂ්පාදන සංඛ්‍යා ලේඛන පහත දැක්වේ:

| | | | හෙක්ටයාර් | නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|
| කව්පී | ... | ... | 18,104 | 12,555 |
| සෝයා | ... | ... | 4,841 | 5,243 |
| මුංඇට | ... | ... | 16,918 | 10,673 |
| උඳු | ... | ... | 9,406 | 6,840 |

විශාල ඉඩම් ප්‍රමාණයක් ලබාගත හැකි බැවින්, උතුරු හා උතුරු මැද පළාත්වල මාංශ බෝග වගා කිරීම සඳහා බෙහෙවින් ඉඩ පහසුකම් හා අවස්ථා තිබේ. එහෙත් මෙම ඉඩම් විශේෂයෙන්ම උස් ඉඩම්, ජලය නොමැතිකම නිසා වියළි භූමි ප්‍රදේශ බවට පත් වී ඇති බැවින්, එම ඉඩම්වල වගා කළ නොහැකිය. ඒ අනුව කනින ලද නොගැඹුරු ළිං ඉදිකිරීම සඳහා සහනාධාර ක්‍රමයක් ඇතිකිරීම පිණිස යෝජනාවක් කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේ. මෙවැනි එක ළිඳකින් ඉඩම් අක්කර දෙකකට පමණ ජලය සැපයිය හැක. මෙම යෝජිත ජලය සැපයීමේ ක්‍රමය සලසා දෙනු ලැබුවහොත් එමගින්, අදාල මැතිවරණ කොට්ඨාශ 11 තුළ එක් කන්නයකදී අක්කර 22,000ක් වගා කළ හැකි යැයි ගණන් බලා තිබේ. අක්කර 22,000 බිම් ප්‍රමාණයක් අවුරුද්දකට දෙවරක් වගා කිරීමෙන් ලබාගත හැකි අස්වනු ප්‍රමාණය ටොන් 44,000 කි.

එවැනි අතිරේක ආහාර ලබාගත හැකිවීම, භෝජනයෙහි විවිධත්වය වැඩි දියුණු කරන අතරම මිළ අඩු ප්‍රෝටීන් මගින් ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමෙහි ලා බෙහෙවින් ආධාර වනවා ඇත. ආරම්භයේ දී නියාමක ව්‍යාපෘතියක් වශයෙන් ළිං 500 ක් ඉදිකර, එම ව්‍යායාමයේ සාර්ථකත්වය අනුව, මුළු අක්කර 22,000 පුරාම පහසුකම් ව්‍යාප්ත කරනවා ඇත. මෙයද සාර්ථක වුවහොත්, අතිරේක ආහාර නිෂ්පාදනය සඳහා මේ ආකාරයෙන් අක්කර 50,000 ක ඉඩම් ප්‍රමාණයක් ඵලදායක ලෙස ප්‍රයෝජනයට ගත හැකි වනවා ඇත. ළිං 500 ක් සඳහා වන මුළු වියදම රුපියල් මිලියන 16.5 ක් හෙවත් එක ළිඳක් සඳහා රු. 33,000 ක් වන්නේය. යෝජනා කර ඇත්තේ ගොවියාට 50% ක සහනාධාර සැපයීමටය. ඒ අනුව රජයට වන වියදම රුපියල් මිලියන 8.25 කි. අක්කරයකින් එක පවුලකට ලැබිය හැකි යැයි ගණන් බලා ඇති වාර්ෂික ශුද්ධ ආදයම රු. 10,000 කි.

### පර්යේෂණ

තේ, රබර් සහ පොල් ඇතුළු සියලුම බෝග ඇතුළත් කෘෂිකාර්මික පර්යේෂණ මණ්ඩලයක් පත් කිරීම සඳහා රජය විසින් නියත පියවර ගෙන තිබේ. මෙම සංවිධානය පිහිටුවනු ලබන්නේ ලෝක බැංකු ආධාර වලිනි.

### වාරිමාර්ග

වර්ෂ 1977 සිට 1985 දක්වා සුළු පරිමාණයේ හා විශාල පරිමාණයේ වාරිමාර්ග සඳහා වැය කරන ලද මුළු වියදම පහත දක්වා ඇත:

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිතුමාගේ සමාලෝචනය—1986

| | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982 | 1983 | 1984 | 1985 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | (සංඛ්‍යා දක්වා ඇත්තේ රුපියල් මිලියන වලින්) | | | | | | | | |
| බස්නා වාරිමාර්ග වැඩ ... ... | 27.3 | 109.4 | 260.3 | 317.3 | 457.6 | 507.9 | 542.0 | 559.3 | 671.0 |
| උත්ථාන වාරිමාර්ග ව්‍යාපෘතිය ... | 1.9 | 0.5 | 0.2 | — | — | — | — | — | — |
| ජලප්‍රවාහන හා වගුරුබිම් ගොඩකිරීමේ වැඩ | 11.5 | 24.4 | 34.3 | 95.5 | 42.7 | 36.3 | 38.2 | 74.6 | 191.4 |
| විමධ්‍යගත අයවැය යටතේ වැඩ ... | 61.9 | 76.3 | 58.2 | 46.5 | 37.1 | 36.0 | 34.2 | 9.7 | 12.5 |
| ඒකාබද්ධ කළ ග්‍රාමසංවර්ධන ව්‍යාපෘති ... | — | — | 14.3 | 31.9 | 70.0 | 72.0 | 94.0 | 72.5 | 96.2 |
| සුළු වාරිමාර්ග වැඩ ... ... | — | — | 9.1 | 22.4 | 17.9 | 36.2 | 34.2 | 34.7 | — |
| මුළු ගණන ... ... | 102.6 | 210.6 | 376.4 | 513.6 | 625.3 | 688.4 | 742.6 | 750.8 | 1000.1 |

1986 වර්ෂය සඳහා වූ වියදම් මෙය මුද්‍රණය කරන අවස්ථාවේ ලැබී නොතිබුණි.

මතුපිට ජලය ලබාගත නොහැකි ප්‍රදේශවල නළ ළිං ඉදිකිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් තමන් වෙත ඇති නළ ළිං ඉදිකිරීමේ උපකරණ උපයෝගී කරගත යුතු බව අවධාරණයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. මෙයද ප්‍රමුඛතාව ලැබිය යුතු තවත් අංශයක් වන්නේය.

### සත්ත්ව පාලනය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, මස් කුකුළන් මෙන්ම බිත්තර නිෂ්පාදනය කිරීම සඳහා සුළු පරිමාණයේ කුකුළු ගොවිපළවල් පිහිටුවීම සඳහා ග්‍රාමීය ගොවියන්ගෙන් ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් ලැබුණි. මෙහිදී මුහුණ පෑමට සිදුවූ ප්‍රධාන බාධකය වූයේ අවසරලත් නියෝජිතයන් විසින් සපයනු ලබන කුකුළු පැටවුන් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීමයි. ඊට හේතු වූයේ අවසර ලත් නියෝජිතයන්ගේ සංඛ්‍යාව සීමාසහිත වීමත් බිත්තර රකින ඉන්කියුබේටර්වල ධාරිතාව ප්‍රමාණවත් නොවීමත්ය. දැනටමත් මෙම ව්‍යාපාරයෙහි යෙදී සිටින සැපයුම් කරුවන් කිප දෙනා තම මනාප පරිදි මිළ ගණන් හා කොන්දේසි නියම කිරීමේ තත්ත්වයකට පත් වී සිටිති. කුකුළු පැටවුන් සඳහා වන ඉල්ලීමක් සපුරාලීමට මාස 3 සිට මාස 6 දක්වා කාලයක් ගතවී තිබේ. අවුරුද්ද මුලදී මස් කුකුළු පැටවකුගේ මිළ රු. 9.00 හා බිත්තර කුකුළු පැටවකුගේ මිළ රු. 9.50 ක් තරම් විය. අවුරුද්ද අවසානයේදී මෙම මිළ ගණන් පිළිවෙලින් රු. 10 හා රුපියල් 10.50 දක්වා වැඩි විය. 1982 සංසන්දනාත්මක වශයෙන් මෙම මිළ ගණන් රුපියල් 7 සහ රු. 7.50 ක් විය.

මෙය ලියන අවස්ථාව වන විට සැපයුම අධික වීමේ ප්‍රතිඵලයක් වශයෙන් බිත්තර වෙළඳපොළ බිඳ වැටී තිබේ. උදවී ඇති මෙම තත්ත්වය යටතේ, කුකුළු පැටවුන් ලබා ගැනීම සඳහා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති සමහර ගොවියන් විසින් තම ඉල්ලීම් අවලංගු කර ඇත. කුකුළු කර්මාන්තයේ මූලික ගැටළුව වී ඇත්තේ කුකුළු පැටවුන් ගේ මිළත් ඒ සමගම කුකුළු ආහාරවල මිළත් ක්‍රමයෙන් ඉහළ නැගීමයි. නිෂ්පාදනය අධික වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සැපයුම වැඩි වී ඇති බැවින් වෙළෙන්දෝ අඩු මිළ ගණන්වලට මස් කුකුළන් හා බිත්තර මිළට ගනිති. එබැවින් මෙම කර්මාන්තය නිෂ්පාදකයාට ලාභදායක නොවන තත්ත්වයකට පත් වී ඇත. මෙම තොග පාරිභෝගිකයාට අලෙවි කිරීමේදී අතරමැදියා එම තොග ශීත කාමරවල රැස්කර තබා සීමා සහිත ප්‍රමාණ වශයෙන් වෙළඳපොළට නිකුත් කිරීම මගින්, පාරිභෝගික මිළ ගණන් කෘත්‍රිම වශයෙන් ඉහළ මට්ටමක රඳවා ගනී.

### ගස් වගා අංශය

තේ හා රබර් කුඩා වතු හිමියන්ට සහාය වීම සඳහාත් ඔවුනගේ නිෂ්පාදනවල තත්ත්වය උසස් කිරීම සඳහාත් කුඩා වතුවල තේ දළු හා රබර් කිරි රජයේ කර්මාන්තශාලාවල සකස් කිරීම සඳහා මෙම අධිකාරිය විසින් කටයුතු සලසා තිබේ. යෙදවුම් සඳහා වන වියදම් අඩු කිරීමේ අරමුණ ඇතිව මෙම කුඩා වතු හිමියන්ට අවශ්‍ය යෙදවුම් ද එම මාර්ගවලින් සැපයීමට කටයුතු යොදගෙන යනු ලැබේ.

### අනාගතය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය මූලික වශයෙන් කෘෂිකාර්මික ආර්ථිකයක් වන බැවින්, 'සකස් කළ' කෘෂිකාර්මික නිෂ්පාදන සංවර්ධනය කිරීමේ හා කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත පිහිටුවීමේ අවශ්‍යතාව, අනාගත සංවර්ධනය සඳහා සලකා බැලිය යුතු කරුණු වන්නේය. සෞඛ්‍ය අතින් සලකා බැලීමේදී අප ජනතාවට පිරිසිදු එමෙන්ම සනීපාරක්ෂක ආහාර සැපයීම වැදගත් වන්නා සේම අප රටේ වැඩිපුර නිපදවනු ලබන ආහාර ද්‍රව්‍ය අපනයන කිරීමට නම් ඉහත සඳහන් කරුණු ඒ තරමටම වැදගත් වන්නේය. අප දිවයිනේ කාලගුණ තත්ත්වයන් අනුව බොහොමයක් බෝග ඵල දරන්නේ සෘතු අනුවය. ඒ ඒ සෘතුවේදී පලතුරු, එළවළු මෙන්ම ඇතැම් විට මාංශ බෝග පවා, ඉල්ලුම මදවීම නිසා ඉතා අඩු මිළ ගණන්වලට අලෙවි කෙරේ. එමගින් අපතේ යෑම පසෙක තිබියදී, ගොවියන්හටද දුෂ්කරතාවලට මෙන්ම පාඩුවීම් වලට මුහුණ දීමට සිදුවේ. අපගේ නිෂ්පාදන අපනයන කිරීමට නම් තත්ත්වය හා ප්‍රමිති කෙරෙහි අවධානය යොමු කරමින් කෘෂිකාර්මික නිෂ්පාදන

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිතුමාගේ සමාලෝචනය—1986

සුරක්ෂණය කිරීම හා සකස් කිරීම කෙරෙහි සිත් යොමු කළ යුතුයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, ආහාර තාක්ෂණ ආයතනයක් පිහිටුවීම අත්‍යවශ්‍ය වන්නේය. ආහාර තාක්ෂණය පිළිබඳ යම් යම් වැඩ කටයුතු සිදු කරන අංශයක් දැනටමත් ගන්නොරුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති නමුදු වර්ධනය වෙමින් පවතින අපගේ අවශ්‍යතා සපුරා ලීමට එය කිසිසේත් ප්‍රමාණවත් නො වේ. එබැවින්, කෘෂි කාර්මික නිෂ්පාදනවලින් නිසි පරිදි ප්‍රයෝජන ලබා ගනිමින් දැනට සිදුවන අපතේ යෑම වළක්වා ගැනීම සඳහා, ආහාර තාක්ෂණය පිළිබඳ සුදුසු ආයතනයක් පිහිටුවීමේ ප්‍රශ්නය සැලකිල්ලට භාජනය කරන මෙන් ගරු කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ ඇමතිතුමාගෙන් අවධාරණයෙන් ඉල්ලා සිටිමි.

ජාතිවාදී අසහනකාරී තත්ත්වයන් හේතුකොටගෙන ඇති වූ අවහිරකම් ගැන මවිසින් මීට පෙර නැවත නැවතත් සඳහන් කරන ලදී. 1986 දී ඇති වූ මීට පෙර නොවූ විරූ නියඟය නිසා මෙම තත්ත්වය තුවත් උග්‍ර වී තිබේ. මේ නියඟයේ බලපෑම දීපව්‍යාප්ත වන අතර, 1978 සිට ඉතා සමෘද්ධිමත් කෘෂිකාර්මික ප්‍රදේශයක් බවට සංවර්ධනය වෙමින් ආ කුරුණෑගල දිස්ත්‍රික්ක යට මෙම වර්ෂයේදී බරපතල ලෙස හානි පැමිණීම විශේෂයෙන් අධෛර්යමත් කරවන සුලු වන්නේය. සුළු පරිමාණයේ වැව් සිඳී යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් උද වී ඇති තත්ත්වය ඇත්ත-වශයෙන්ම කණගාටුදයක වේ. මෙවැනි ස්වාභාවික විපත් හේතු කොට ගෙන බොහෝවිට ඔහු අසරණ තත්ත්වය කට පත්වෙයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති වී තිබෙන ශීඝ්‍ර සංවර්ධනය ගැන සලකා බලා, 1986/87 මහ කන්නයේ දී හා 1987 යල කන්නයේ දී මුහුණ පෑමට සිදුවූ ආකාරයේ ආපදු වලදී සහනයක් සලසනු වස්, මෙම දිස්ත්‍රික්කයට අතිරේක වාරි මාර්ග ක්‍රම සලසා දීම රජයේ දැඩි අවධානයට ලක්වීම වැදගත් වන්නේය. 1983 සිට අපගේ ප්‍රගතියට බාධාවක්ව පවතින ජාතිවාදී ප්‍රශ්න අවසන් වී නීතිය හා සාමය නැවත ඇතිවේවායි අපගේ පැතුමයි. හානි වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීම සීඝ්‍රයෙන් සිදුවුවහොත්, එම ප්‍රදේශවල කෘෂිකාර්මික වැඩ කටයුතු යථා තත්ත්වයට පත්වනවා ඇත. එය එසේ සිදුවුව හොත්, විශාල පරිමාණයක කෘෂිකාර්මික නිෂ්පාදනයක් අපට අපේක්ෂා කළ හැක.

### පොදු කරුණු

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මෙම අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලයේ පහත සඳහන් වෙනස්වීම් සිදු විය. නීතිඥ ඩී. එච්. එන්. ජයමහ මහතා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අවුරුදු තුනක් පමණ සේවය කිරීමෙන් පසු 1986 අප්‍රේල් මාසයේදී ඉල්ලා අස්විය. ජයමහ මහතාගේ ඉල්ලා අස්වීමෙන් හිස් වූ මණ්ඩලයේ එම තනතුරට නීතිඥ මර්වින් සමරවීර මහතා 1986 අගෝස්තු මාසයේ සිට පත් කරනු ලැබීය. 1978 දී මෙම අධිකාරිය ආරම්භ කළ තැන් පටන් එම මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සේවය කළ මහජන බැංකුවේ සාමාන්‍යාධිකාරී පී. බී. රත්නායක මහතා බැංකුවෙන් විශ්‍රාම යෑමත් සමග 1986 අගෝස්තු පළමු වැනි දින සිට මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය. රත්නායක මහතාගේ ඉල්ලා අස්වීමෙන් හිස් වූ තනතුරට සී. එම්. බී. බොගොල්ලාගම මහතා 1986 දෙසැම්බර් පළමුවැනි දින සිට පත් කරනු ලැබීය. ඩී. එච්. එන්. ජයමහ සහ පී. බී. රත්නායක යන මහතුන් විසින් කරන ලද අගනා සේවයට මෙහි ලා මගේ කෘතඥතාව ප්‍රකාශ කරමි. මෙම අවස්ථාවේදී මම මර්වින් සමරවීර හා සී. එම්. බී. බොගොල්ලාගම යන මහතුන් දෙපල පිළිගන්නා අතර, එම දෙපලගෙන් මෙම අධිකාරියේ උන්නතියට අගනා මෙහෙයක් ඉටුවනු ඇතැයි අපේක්ෂා කරමි.

මෙම සමාලෝචනයෙන් පසු මෙහි ඇතුළත් අධිකාරියේ විධායක අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවලින් මෙම අධිකාරියේ ඒ ඒ අංශ මගින් ඉටු කරන ලද වැඩ පිළිබඳ විස්තර පැහැදිළි වේ.

අතිගරු ජනාධිපතිතුමන් සහ කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍ය ගරු ගාමිණී ජයසූරිය මැතිතුමන් විසින් මෙම අධිකාරියේ වැඩ කටයුතු 1986 වර්ෂය තුළ පවත්වාගෙන යෑම සඳහා තවදුරටත් දෙන ලද සහයෝගය, සහ ආධාර පිළිබඳව මගේ අතිශය කෘතඥතාව ප්‍රකාශ කරමි. තවත් වර්ෂයක් තුළ අධිකාරියේ වැඩ කටයුතු සතුටුදායක ලෙස ඉටු කිරීමට සහාය වූ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ට, කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්ට, සෙසු අමාත්‍යාංශවල ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට සහ සංස්ථා හා රාජ්‍ය බැංකුවල සභාපතිවරුන්ට මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සෙසු සංවිධානවල ප්‍රධානීන්ට ද මගේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

තවද 1986 වර්ෂය තුළ සහයෝගයෙන් හා කැපවීමකින් යුක්තව කරන ලද සේවය ගැන මගේ සියලුම සම අධ්‍යක්ෂ වරුන්ට හා විධායක නිලධාරීන්ටත් අධිකාරියේ සෙසු කාර්ය මණ්ඩලයටත් ස්තුති කරමි.

මේ රටේ කෘෂිකාර්මික නිෂ්පාදනය තවදුරටත් දියුණු කර ගෙන යෑමට නම් අප විසින් ප්‍රමාදයකින් තොරව තීරණය ගැනීමේ හා ක්‍රියා කිරීමේ අවශ්‍යතාව අවසාන වශයෙන් අවධාරණයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. 'ටෙම්පස් පූජිට්' හෙවත් 'කාලය ඉගිලෙයි' යනු ලතින් කියමනකි. 'අප්පමාදෝ අමතපදං'' හෙවත් 'අප්‍රමාදව ඉදිරියට යන්න' යි බුදුරජාණන් වහන්සේ විසින් ධම්ම පදයෙහි දේශනා කල සේක. මෙම අධිකාරිය පිහිටුවන ලද්දේ කෘෂිකාර්මික ප්‍රගතිය සම්බන්ධීකරණය හා කඩිනම් කිරීමේ අරමුණ ඇතිවය. එබැවින් අපගේ තීරණ ගැනීම් හා ක්‍රියාකාරකම් ප්‍රමාද කළ නොහැකි වේ. අප ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා රටේ ඇති සම්පත්වලින් ප්‍රයෝජනය ගැනීමට අපට හැකිවන පරිදි, තීරණ ගන්නා අය මෙන්ම එම තීරණ ක්‍රියාවට නංවන අය කඩිනමින් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරමි.

කොළඹ,
1987 මාර්තු 27.

රන්ජන් විජේරත්න,
සභාපති.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## දකුණු පළාත වාර්ෂික වාර්තාව—1986

### 1. පරිපාලනය

ගාල්ල, රත්ගම, සහ බලපිටිය හැර දකුණු පළාතේ සෙසු සියලුම මැතිවරණ කොට්ඨාශ වල සැලසුම් පරිදි කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය දැනට සේවය කරයි.

අවශ්‍ය මැතිවරණ කොට්ඨාශ කාර්ය මණ්ඩල පත් කර තිබේ.

කෘෂිකාර්මික කළමනාකරුවන්ගේ සේවක සංඛ්‍යාවෙහි බද්දේගම පුරප්පාඩු වී ඇත. වසර තුළ ඇතිවූ තංගල්ලේ හා බෙලිඅත්තේ පුරප්පාඩු සම්පූර්ණ කරන ලදි. අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ කටයුතු නිම කරන තුරු, ජනවාරි මාසයේ සිට තිස්සමහාරාම කලාප 2 හි කළමනාකරුගේ වැඩ තහනම් කර තිබේ.

දිස්ත්‍රික්ක පරිපාලනය සඳහා දිස්ත්‍රික්ක තුන භාරව නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු තිදෙනෙක් සිටිති.

### 2. ක්‍රියාකාරිත්වය

#### i. ගොවිජන සේවා මධ්‍යස්ථාන

කෘෂිකාර්මික සංවර්ධන වැඩි දියුණු කිරීම සඳහා, මතුවී එන අවශ්‍යතා අනුව ගොවි ජන සේවාවන් ක්‍රමයෙන් වැඩි දියුණු කර තිබේ. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ තංගල්ලේ උඩයාල තවත් සේවා මධ්‍යස්ථානයක් පිහිටුවන ලදි. වඩා හොඳ යෙදවුම් හා ව්‍යාප්ති සේවා සපයමින් ග්‍රාමීය ගොවියාට සේවය කිරීම සඳහා දැන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන 16 ක් ගාලු දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන 33 හා මාතර දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන 22 පිහිටුවා තිබේ.

ගොවි ජන සේවා වැඩි දියුණු කිරීමත් සමග, කළමනාකරණ කාර්යයන් ද සීඝ්‍ර ප්‍රගතියක් වාර්තා කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ප්‍රශංසාව හිමිවිය යුතුයි. එය එසේ වුවද, මනා පාලනයක් සහතික කිරීම සඳහා නිතර නිතර අධීක්ෂණය කළයුතු යම් යම් මධ්‍යස්ථාන නැත්තේ නොවේ. එවැනි මධ්‍යස්ථාන වල අඩුපාඩු සොයා බලා පියවර ගැනීමට දෙපාර්තමේන්තුව සූදානමෙන් සිටිය යුතුය.

#### ii. වගා අංශ

(අ) වී — වර්ෂය තුල යල හා මහ කන්න දෙකේදීම මෙම දිස්ත්‍රික්ක තුනේ වී වගාව අහිතකර කාලගුණ තත්ත්වයන්ට භාජනය වූ බැවින්, මෙම අංශයේ නිසි පරිදි වගා හා නිෂ්පාදන කටයුතු වලට හිතකර තත්ත්වයක් නොපැවතුනි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දැනට කෙරෙන මහ කන්නයේ වගා කටයුතු පවා ජල හිඟයකට භාජනය වී තිබේ. මෙම අංශයේ ක්‍රියාකාරිත්වය, නිෂ්පාදනය අතින් සුළු වැඩිවීමක් පමණක් වාර්තා කර ඇති අතර, දැනට කෙරිගෙන යන මහ කන්නයේ වගාව අසාර්ථක වුවහොත් එම වැඩිවීමද නිෂ්ඵල වනවා ඇත.

වී වගා කරන ලද අක්කර ගණන හා ලැබූ අස්වැන්න, මීට කලින් කන්නයේ සංඛ්‍යාව සමග තුළනය කිරීමේ විස්තර වැඩ සටහනක් පහත දැක්වේ :

| දිස්ත්‍රික්කය | | යල කන්නය අක්කර | | සාමාන්‍ය අස්වැන්න අක්කර/බුසල් | මහ කන්නය අක්කර | | සාමාන්‍ය අස්වැන්න අක්කර බුසල් |
|---|---|---|---|---|---|---|---|
| ගාල්ල | ... | 1985 | 48551 | 37.31 | 1985/86 | 50602 | 45.4 |
| | | 1986 | 50348 | 40.55 | *1986/87 | 54596 | 32.0* |
| මාතර | ... | 1985 | 43213 | 47.69 | 1985/86 | 44897 | 50.45 |
| | | 1986 | 44999 | 51.68 | *1986/87 | 46833 | 45.0* |
| හම්බන්තොට | ... | 1985 | 31086 | 76.22 | 1985/86 | 48190 | 81.35 |
| | | 1986 | 38365 | 83.48 | *1986/87 | 57448 | 70.0* |

මූලාශ්‍රය — ජනගහන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
* තාවකාලික

(ආ) අතිරේක ආහාර බෝග

තෙත් කලාපයට අයත් ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්ක දෙකේ මෙම අංශයේ ප්‍රගතිය සතුටුදායක විය. පැවති සාමාන්‍ය කාලගුණ තත්ත්වයත් යෙදවුම් හා ව්‍යාප්ති සේවා ලබා ගත හැකිවීමත් මෙම අංශයේ වගා කටයුතු වැඩ සටහනට අනුකූලව සිදු කිරීමට ආධාර විය.

කලට වැසි නොලැබී යාම හේතුකොටගෙන යල හා මහ යන වගා කන්න දෙකේදීම හම්බන්තොට දිස්ත්‍රික්කයේ අතිරේක ආහාර බෝග නිෂ්පාදනයට බරපතල හානි සිදු විය. 1986/87 මහ කන්නය සඳහා වගා කරන ලද අක්කර 23,800 න් 60% වැඩි ප්‍රමාණයක්, පැවති නියං තත්ත්වයන් හේතුකොටගෙන අසාර්ථක වූ බව වාර්තා වී තිබේ.

(ඉ) ගස් වගා අංශය (තේ, රබර්, පොල් සහ සුළු අපනයන බෝග)

විවිධ වගාවන් සඳහා වගකිව යුතු අදාල දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සහනාධාර වැඩ සටහන් යටතේ මෙම අංශය ලබා ඇති සාමාන්‍ය ප්‍රගතිය සතුටුදායක විය. ගාලු හා මාතර දිස්ත්‍රික්කවල පැවති සාමාන්‍ය කාලගුණ තත්ත්වය මෙම අංශයේ වගා හා සංවර්ධන වැඩ කටයුතු නගාලීමට හේතු වූ නමුදු, ක්‍රියාත්මක කිරීමේ හා කළමනාකරණයේ වියදම් අධිකවීමත්, ආදායම් අඩුවීමත් හේතු කොට ගෙන මෙහි ප්‍රගතිය මන්දගාමී විය.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## දකුණු පළාත වාර්ෂික වාර්තාව—1986

පසුගිය වර්ෂයේ මිල ගණන් හා සසඳා බලන කල, මෙම වර්ෂයේ පසු භාගයේදී නිෂ්පාදන මිළ ගණන්වල වැඩිවීමක් ඇති වී තිබෙන බව පෙනෙන්නට තිබේ. මෙම අංශය කුඩා ඉඩම් හිමියන්ට නඩත්තු කළ හැකි ලාභදායක අංශයක් බවට පත්වන පරිදි මෙම නැඹුම තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### III. සත්ව පාලනය

ගාලු දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්ක දෙකේ මෙම අංශය, මූලික පහසුකම් හා අධාරක සේවා අතින්, සංවර්ධනයෙහි ලා අඩු ප්‍රමුඛතා අංශයක් වශයෙන් තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ.

ලබාදිය හැකි සතුන්ගේ බරපතල හිඟයක් පැවතීම හේතු කොට ගෙන, මෙම අංශයට සේවා පහසුකම් සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතු බලධාරීන්ගේ සහාය ඇතිව, ව්‍යාප්ත කටයුතු සඳහා සතුන් සැපයීමට අප ගත් උත්සාහයන්ගේ සාර්ථකත්වය සීමා සහිත විය. අවශ්‍ය යෙදවුම් හා ව්‍යාප්ත සේවා ලබාගත නොහැකිවීම මෙම අංශයේ සැලකිය යුතු ප්‍රගතියක් ඇති කිරීමෙහි ලා තවදුරටත් බාධකයක්ව පවතිනු ඇත.

### IV. කෘෂිකාර්මික ණය/බැංකු

ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බැංකුවක් සහ එහි අනුබද්ධ ශාඛා මාතර පිහිටුවීමත් සමඟ, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වඩා සරල කොන්දේසි යටතේ ණය පහසුකම් සලසා දීමේ අරමුණ ඇතිව ග්‍රාමීය ණය අංශයෙහි පැවති අඩුවක් සම්පූර්ණ කරන ලදි. කෘෂිකාර්මික ණය දීම තරමක් අප්‍රසන්නතාවයකින් සලකන රාජ්‍ය බැංකු දෙක, කෘෂිකාර්මික සංවර්ධනය ව්‍යාප්ත කිරීම සඳහා සෙසු බැංකු සමග එක්වී, තමන්ට තවදුරටත් වැඩිම ඉතිරි කිරීමේ මුදල් ප්‍රමාණයක් උපයා දෙන මෙම අංශයෙහි මුදල් ප්‍රති ආයෝජනය කළ යුතු වන්නේය.

### V. වාරිමාර්ග

වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් මෙම වර්ෂය තුළ විශාල/කුඩා වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීමේ, ඉදි කිරීමේ හා නඩත්තු කිරීමේ වැඩ පිළිවෙල යටතේ, වී නිෂ්පාදනය මෙන්ම ඉඩම් ප්‍රයෝජන යට ගැනීම උපරිම මට්ටමට නැංවීම සඳහා වඩා දියුණු වාරි මාර්ග හා ජලාපවාහන පහසුකම් ද අවශ්‍යතා අනුව, ගංවතුරෙන් ආරක්ෂාවද සලසා දෙන ලදි.

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති, එනම්, නිල්වලා ගඟේ ගංවතුරෙන් ආරක්ෂා කිරීමේ යෝජනා ක්‍රමය, කිරිදි ඔය වාරිමාර්ග හා ජනපද යෝජනා ක්‍රමය මෙන්ම හම්බන්තොට ඒකාබද්ධ කළ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමයේ වාරිමාර්ග වැඩ කටයුතු සහ ගාලු හා මාතර දිස්ත්‍රික්කවල ගම්බද වාරිමාර්ග පුනරුත්ථාපන වැඩ සටහන්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සීඝ්‍ර ප්‍රගතියක් පෙන්නුම් කළේය.

දකුණු ඉවුරේ පහළ කොටසේ කුඹුරු ඉඩම් අක්කර 4,000 ක් පමණ අයත් වන නිල්වලා ගඟේ ගංවතුරෙන් ආරක්ෂා කිරීමේ I වන අදියරේ වැඩ සම්පූර්ණයෙන්ම වාගේ නිම කර තිබේ. දැනට වැඩ කෙරී ගෙන යන II අදියර මගින් නිල්වලා ගඟේ පහල වම් ඉවුරේ කුඹුරු ඉඩම් අක්කර 4,600 ට පමණ හා අකුරැස්ස නගරයට ගංවතුරෙන් ආරක්ෂාව සලසා දෙන අතර, අකුරැස්ස ප්‍රදේශයේ ඉඩම් අක්කර 7,500 පමණ අළුතෙන් වාරිමාර්ග පහසුකම් ලබාදෙනවා ඇත. රුපියල් කෝටි 130 ක් වැය වනු ඇතැයි ගණන් බලා ඇති මෙම ව්‍යාපෘතිය 1990 දී නිම කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කිරිදිඔය ව්‍යාපෘතියේ I අදියර යටතේ අළුත් ඉඩම් අක්කර 10,000 ට හා දැනට ඇති ඉඩම් අක්කර 11,400 ට වාරිමාර්ග පහසුකම් සැපයීම නිමකර තිබේ.

II වෙනි අදියර යටතේ තව ඉඩම් අක්කර 10,900 වාරිමාර්ග පහසුකම් සැපයීමටත් ගොවි පවුල් 4,400 පදිංචි කරවීමටත් නියමිතය. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ වියදම රුපියල් මිලියන 940 කි.

### 3. සාමාන්‍ය කරුණු

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් සම්බන්ධීකරණය කරනු ලබන යෙදවුම්, අළෙවිය හා පුහුණු කිරීමේ කාර්යයන් සම්බන්ධයෙන් අදාල අංශවල වැඩ කටයුතු පිළිබඳ ප්‍රගතිය හා වෙනත් විස්තර ඒ ඒ අංශ මගින් ඉදිරිපත් කරනවා ඇත.

කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය සමස්තයක් වශයෙන් සලකා බැලීමේදී සඳහන් කළ යුතු වන්නේ පසුගිය වසර හා සසඳා බලන කළ, වගා නිෂ්පාදනය උපරිම මට්ටමකට ගෙන ඒමෙහි ලා, පැවති කාලගුණ තත්ත්වය හිතකර නොවූ බවයි. මෙය වඩාත්ම බලපෑවේ වී වගාව කෙරෙහිය.

කෘෂිකාර්මික නිෂ්පාදන මට්ටම රටේ ආර්ථික සංවර්ධනයේ පදනම වන බැවින්, ජාතික කෘෂිකර්ම, ආහාර හා පෝෂණ ක්‍රියා මාර්ගය යටතේ, රජය විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන වර්තමාන ප්‍රතිපත්තීන් සකස් වී ඇත්තේ, මෙම ප්‍රධාන අංශයේ නිෂ්පාදනය, ආදායම හා රැකියා නියුක්තිය වැඩි දියුණු කිරීම අරමුණු කරගෙනය.

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් කෘෂි කාර්මික සංවර්ධන වැඩ කටයුතු සාර්ථක ලෙස සම්බන්ධී කරණය කිරීමෙන් හා තහවුරු කිරීමෙන් තම වගකීම් ඉටු කළේය. මෙම කාර්යය සඳහා තම වගකීම් ක්ෂේත්‍ර මට්ටමේදී කාර්යක්ෂම ලෙස ඉටු කළ කෘෂිකාර්මික කළමනාකරුවන්ට කෘතඥතාව හිමිවිය යුතුයි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගෙන් ලැබුණු මග පෙන්වීම හා උපදෙස් අගය කරන අතරම ඒ සම්බන්ධයෙන් එතුමාට ස්තුති කරමි. තවද, ඒ ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්, දිසා සංවර්ධන ලේකම්වරුන්ගෙන්, දෙපාර්තමේන්තු නිල ධාරීන්ගෙන් සහ අවසාන වශයෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය ගැන කෘතඥතාවය පළ කරමි.

1987.02.10.

ජේ. ඕ. බී. ද අල්මේද
පළාත් අධ්‍යක්ෂ — දකුණු පළාත

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ඌව පළාත වාර්ෂික වාර්තාව—1986

### 1. පරිපාලනය

සමාලෝචනයට භාජනය වූ කාලපරිච්ඡේදය තුළ මෙම අධිකාරිය ඌව පළාතේ මැතිවරණ කොට්ඨාශවලට කෘෂි කාර්මික කළමනාකරුවන් පත් කිරීමේ කාර්යය නිම කිරීමත් සමග, ග්‍රාමීය ගොවියන්ගේ කෘෂිකාර්මික වැඩ කටයුතු සම්බන්ධී කරණය කිරීමෙහි ලා මුළු ශක්තියම යොදා ක්‍රියා කළේය.

පස්සර හා වැල්ලවාය කලාප II යන කොට්ඨාශවල කලින් සේවය කළ කෘෂිකාර්මික කළමනාකරුවන් තම නියමිත සේවා කාලය නිම කිරීමෙන් අනතුරුව තම ස්ථිර තනතුරුවල සේවය සඳහා ඉවත්ව ගියෙන් ඒ සඳහා නව කෘෂිකාර්මික කළමනාකරුවන් පිළිවෙලින් 1986.06.01 සහ 1986.08.01 යන දිනවල පත් කරන ලදි.

### 2. පරිපාලන ඒකක

ගොවි ජන සේවා මධ්‍යස්ථානවල කළමනාකරණයේ ඇති වී තිබෙන පොදු වැඩි දියුණුව ගැන මෙහි ලා සඳහන් කරන්නේ අගය කිරීමකින් යුක්තවය. මෙම මධ්‍යස්ථාන 40 (බදුල්ලේ 28 හා මොණරාගල 12) ත්වදුරටත් ග්‍රාමීය ගොවි ජනතාවගේ කෘෂිකාර්මික වැඩ කටයුතු පිළිබඳ ජීවනාලිය වශයෙන් ක්‍රියා කළේය.

දුරස්ථ කෘෂිකාර්මික ප්‍රදේශ වන, මහියංගනය, වැල්ලවාය හා මොණරාගල මැතිවරණ කොට්ඨාශවලට අයත් නාගදීප, ඔක්කම්පිටිය, ඇතිමලේ හා හිඟුරුකඩුව යන ප්‍රදේශවල 1987 මුල් භාගයේදී නව මධ්‍යස්ථාන පිහිටුවීමෙන් පසු ඒවා පළාතේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ, නිලධාරීන්ගේ හා ගොවි ජනතාවගේ සහභාගිත්වය ඇතිව සියලුම මැතිවරණ කොට්ඨාශ ඇතුළත් වන පරිදි මෙම නව මධ්‍යස්ථාන පිහිටුවීමට නිර්දේශ කිරීමෙහි ලා නොපසුබට උත්සාහයකින් ක්‍රියා කළ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපති තුමාගේ සිහිවටන බවට පත්වනවාට සැකයක් නැත.

### 3. වගා කටයුතු

#### වී වගාව

වී වගා අංශයේ ප්‍රගතිය සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩි වූ බව ඒ පිළිබඳව කෙරෙන පූර්ණ අගැයීමකදී පෙනේ. ඒ සම්බන්ධයෙන් වී වගා කිරීම මුළු හිතින්ම කරන කාර්යයක් බවට පත් කර ගෙන සිටින ගොවීන්ටත් ඒ සඳහා තම ප්‍රයත්න යන් කැප කළ ව්‍යාප්ත කාර්ය මණ්ඩලයටත් කෘතඥතාවය හිමිවිය යුතුයි. වගා කරන ලද දෙකන්නය තුළ පැවති කාල ගුණ තත්ත්වය එතරම් හිතකර නොවූ නමුදු, වී වගා කටයුතු පිළිබඳ මනා අවබෝධයක් වර්තමාන ගොවියා තුළ ඇති බවට, ලැබූ ප්‍රතිඵල සාක්ෂියක් වන්නේය. දිස්ත්‍රික්ක දෙකේම වගා කරන ලද කුඹුරු ප්‍රමාණය හා අස්වැන්න නෙලා ගන්නා ලද කුඹුරු ප්‍රමාණය සසඳා බැලීමේ දී හානි වූ අස්වැන්න ඉතා අවම මට්ටමක පැවති බැව් පෙනේ.

#### අර්තාපල්

අප රටේ ජනතාව විසින් පරිභෝජනය කරනු ලබන අර්තාපල් ප්‍රමාණයෙන් සැලකිය යුතු කොටසක් නිපදවනු ලබන්නේ බදුල්ල දිස්ත්‍රික්කයෙ තුළ බැව් ප්‍රකාශ කිරීම අතිශයෝක්තියක් නොවේ. එබැවින් නිෂ්පාදනය වැඩි කිරීම සඳහාත් එහි තත්ත්වය උසස් කිරීම සඳහාත් උනන්දුවීම අදල සියලු දෙනාගේ ම යුතුකම වන්නේය. වටිනා විදේශ විනිමය ඉතිරි කරගැනීමේ රජයේ තීරණයට අනුකූලව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ආනයනය කළ බීජ අර්තාපල් වෙනුවට දේශීය බීජ අර්තාපල් ක්‍රමයෙන් යොදා ගැනීමේ වැඩ පිළිවෙලක් දියත් කරන ලදි. මෙම ප්‍රතිපත්තිය අනුව දෙපාර්තමේන්තුව විසින් බදුල්ල දිස්ත්‍රික්කයට දෙනු ලැබුවේ ආනයන කළ බීජ අර්තාපල් මෙට්රික් ටොන් 250 ක් පමණි. (දෙසිය පණහක් පමණි). ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව (17,982 ) අනුව සලකා බලා ප්‍රමාණවත් නොවූ මෙම බීජ අර්තාපල් තොගය භාර නොගැනීමට බදුල්ලේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම කමිටුව සිය කැමැත්තෙන්ම එකඟ විය.

දේශීය බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 1,438 ක් නිකුත් කර ඇති අතර, කාඩිනල් වර්ගයේ බීජ මෙට්‍රික් ටොන් 129.31 ක් නුසුදුසු තත්ත්වයක පැවති බැව් සොයා ගන්නා ලදි. දෙපාර්තමේන්තුව විසින් ඒ වෙනුවට වෙනත් බීජ තොගයක් සපයන ලදි. නුසුදුසු තත්ත්වයක පැවති මෙම තොගය මුළු බීජ අර්තාපල් තොගයෙන් ආසන්න වශයෙන් 9% ක් වූයේ වී නමුදු ගොවියන් විසින් කරන ලද උද්ඝෝෂණය තත්ත්වය ඉතා බරපතල බව මවා පෑ ඇත.

#### එළවළු

අධික වර්ෂාව හේතුකොටගෙන වර්ෂය ආරම්භයේදී තාව කාලික පසුබෑමක් ඇති වූයේ වී නමුදු, එළවළු වගා කරන ගොවියෝ ඉතා හොඳ ආදායමක් ලබා ගත්හ. ඇතැම් පෞද්ගලික සමාගම් මගින් යල් පනින ලද එළවළු බීජ අලෙවි කරන බවට ගොවියෝ පැමිණිලි කරති. එවැනි අයථා වැඩ කටයුතු නතර කිරීම සඳහා අදාල නිලධාරීහු විමසිල්ලෙන් සිටිති. තවද, අලෙවි දෙපාර්තමේන්තුව හෝ රජයේ වෙනත් ආයතනයක මිළට ගැනීමේ ඒකකයක් නොමැතිවීම නිසා පෞද්ගලික වෙළඳුන් විසින් එළවළු ගොවීන් ගෙන් අනිසි එල ලබන බව ගොවියෝ ඇවිටිලි කරති.

#### කුඩා තේ වතු

තේ මිළ ක්‍රමයෙන් පහත බැසීම, තම කුඩා තේ වතු සංවර්ධනය කිරීමෙහි ලා කුඩා තේ වතු හිමියන් උදාසීන තත්ත්වයකට පත් කළේය. තම කුඩා ඉඩම්වල තේ වගා කළ හැකි ඉඩම් හිමියෝ, වඩා ආරක්ෂා සහිත වූත් වහා ප්‍රතිඵල ලබා දෙන්නා වූත් එළවළු හා අර්තාපල් වගා කෙරෙහි සිත් යොමු කළහ. එය එසේ වුවද, මිල ගණන් වඩා යහපත් තත්ත්වයකට පත් වූ පසු මෙම තත්ත්වය වෙනස් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

#### උක්

විවෘත වෙළඳපොළේ උක් ගස් වල මිළ පහත වැටීම, තම උක් ගස් සීනි නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවලට සැපයීම කෙරෙහි උක් වගා කරුවන්ගේ නෙත් යොමු වීමට හේතුවක් වී තිබේ. උක් වගා කරුවන් තුළ හටගෙන ඇති මෙම අනපේක්ෂිත ලැදියාව නිසා තව තවත් උක් දඬු සපයන්නන් ලියාපදිංචි කිරීමට මෙම කර්මාන්තශාලා හිමියන් උනන්දු කර තිබේ.

#### පැල්වත්ත සංකීර්ණය

ජනාධිපති උතුමාණන් විසින් 1986 ජූනි 8 වැනි දින පැල්වත්ත සීනි කර්මාන්තශාලව විවෘත කරන ලදී. එම විවෘත කිරීමෙන් පසු 1986 අවසානය දක්වා මෙම කර්මාන්ත ශාලාව මගින්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ඌව පළාත වාර්ෂික වාර්තාව—1986

නිෂ්පාදනය කරන ලද මුළු සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 16,000ක් විය.

මෙම ව්‍යාපෘතියේ වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණය වී ඇත්තේ එක් එක් පදිංචිකරුවකු තම ප්‍රථම උක් අස්වැන්න සඳහා රු. 55,000 සාමාන්‍ය ආදායමක් ලබා ගැනීමයි. පැල්වත්ත අවට ගම්වාසීහු දැන් මෙම ව්‍යාපෘතියේ ඵල නෙලා ගනිති.

### මොණරාගල ව්‍යාපෘතිය

''ඉඩම් කළමනාකරු'' වශයෙන් වැදගත් පත් කිරීමක් සිදු කිරීම හැරෙන්නට, සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ මෙම සංකීර්ණයේ අන් කිසිදු සැලකිය යුතු සිද්ධියක් ඇති නොවීය. මෙම ක්‍රියාව වැඩ කටයුතු සීඝ්‍ර කිරීමෙහි ලා ගන්නා ලද නිවැරදි පියවරක් වශයෙන් සැලකිය හැකිවේ. මෙම සංකීර්ණය ද නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### බඩ ඉරිඟු

මහ කන්නය තුළ පැවති කාලගුණ තත්ත්වයන් බඩ ඉරිඟු වගාව සඳහා හිතකර වී තිබේ. මුළු මොණරාගල දිස්ත්‍රික්කය තුළත්, බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගන හා වියළුව මැතිවරණ කොට්ඨාශ තුළත් විශාල ප්‍රදේශ තුළ බඩ ඉරිඟු වගා කරන ලදී. මිළට ගන්නා කාල සීමාව සඳහා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලයට සූදානම් වී සිටීමට හැකිවීම බඩ ඉරිඟු ගොවීන්ට වරප්‍රසාදයක් විය හැකිය.

### දෙහි දෙඩම්

අක්කර විශාල ප්‍රමාණයක් දෙහි දෙඩම් වගාව යටතට පත් කළ හැකි බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක තුළ මෙම දෙහි දෙඩම් කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා පියවර ගෙන තිබේ.

උදව් ඇති ප්‍රශ්නය හොඳින් අවබෝධකර ගත් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා මොණරාගල දිස්ත්‍රික්කයේ පලතුරු සහනාධාර යෝජනා ක්‍රමය භාරව සිටීමට කෘෂිකර්ම නිලධාරි ශ්‍රේණියේ නිලධාරියකු පත් කිරීමට පෙළඹී විය. මෙම පියවර මීට කලින් ගනු ලැබුයේ නම්, ප්‍රගතිය මීට වඩා සතුටුදායක වීමට ඉඩ තිබුණි.

### දෙහි අපනයන කිරීම

පසුගිය අවුරුදුවලදී මුහුණ පෑමට සිදුවූ පසුබෑම් නිසා, අස්වැන්න නෙලීමේ උපරිම කාල සීමාව තුළ කළමනාකාර මට්ටමේ නිලධාරියෙක් මෙම ස්ථානයෙහි සිටීමේ අවශ්‍යතාව, අපනයන සමාගමට අවබෝධ කරදීමට අපට සිදුවිය. මීලඟ මිලට ගැනීමේ කාල සීමාව තුළ කුවෙට්හි විදේශීය සහයෝගී සමාගමේ කළමනාකරුවෙකු මොණරාගලට එවීමට එකඟත්වය ප්‍රකාශ කර තිබේ. මෙම පියවර මෙම ව්‍යාපෘතියට මෙන්ම පොදුවේ මොණරාගල දෙහි කර්මාන්තයට ද රුකුලක් වනවා ඇත.

### 4. වාරිමාර්ග

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමේ ඒ ඒ දෙපාර්තමේන්තු විසින් සුළු මහ පරිමාණයේ වාරිමාර්ග පුනරුත්ථාපන වැඩ සටහන් සතුටුදායක ලෙස ක්‍රියා කරන ලදී. දිවයිනේ ආරක්ෂක කටයුතු සපුරාලීම පිණිස ආරක්ෂක හමුදාවල අවශ්‍යතා වෙනුවෙන් මුදල් වෙන් කිරීමට සිදුවූයෙන්, ප්‍රමුඛතා ලේඛනයේ වැඩ කටයුතුවලට ප්‍රමාණවත් මුදල් වෙන්කර දීමට උනන්දුවක් දක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, අවසානයේදී ඒ සඳහා අඩු මුදල් ප්‍රමාණයක් වෙන් කර දුන්හ.

ලෝක බැංකුවේ මුදල් වලින් කරනු ලබන මහා පරිමාණයේ වාරිමාර්ග වැඩ සටහන සතුටුදායක ලෙස කෙරීගෙන යන බැවින් මෙම පළාතේ මහා පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රමවලට අයත් ගොවීනට දශකයකින් පසු සැනසිල්ලදායක වසරක් උදා විය.

### 5. අනවසරයෙන් ඉඩම් අත්පත් කර ගැනීම

ග්‍රාමීය ගොවි ජනතාවගේ ආර්ථිකය නගා සිටුවීමෙහි ලා වැදගත් ප්‍රශ්නයක් වන මෙය නිවැරදි කෝණයකින් මෙතෙක් සොයා බලා නැත. අවසානයේදී බිම් කොටස් හිමියන්ට ඔප්පු ලැබෙන තෙක් සැලකිය යුතු ප්‍රමාද වීමකට මුහුණු පෑමට ඔවුන්ට සිදු වී ඇත. සියලු අවස්ථාවලදීම මෙම ප්‍රමාදය මග හරවා ගත යුතුයි. නොඑසේ නම් මෙය අවසානයක් නොදකින ප්‍රශ්නයක් වනවා ඇත.

### 6. සාමාන්‍ය කරුණු

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය සතු සම්බන්ධීකරණ කාර්යයන්, දිස්ත්‍රික්ක තුළ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය සමග සම්බන්ධතා පවත්වන විවිධ ආයතන විසින් දුන් නිසි පරිදි වටහාගෙන තිබේ.

ගොවි ජනතාවට වඩා හොඳින් සේවය කරන ලෙස කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය දිරි ගන්වන දිසා ඇමතිවරු දෙදෙනාටත් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් මගේ අවංක ස්තුතිය පුදකරමි.

නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු දෙදෙනාත්, දිස්ත්‍රික්ක දෙකේ කෘෂිකාර්මික කළමනාකරුවනුත් සතුටුදායක ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා වෙහෙස නොබලා ක්‍රියාකර ඇති බැවින් පළාතේ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියට අයත් කාර්ය මණ්ඩලයට මගේ අවංක ස්තුතිය පුද කරමි. කවර හෝ අවස්ථාවකදී අපි පිළිගෙන අපට ආධාර කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක දෙකේ දිසාපති වරුන් දෙදෙනාටත් මගේ කෘතඥතාවය මෙහි ලා වාර්තාගත කරමි.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගෙන් මටත් මගේ කාර්ය මණ්ඩලයටත් ලැබුණු දිරිගැන්වීම, මග පෙන්වීම හා උපදෙස් ඉතා අගේ කොට සලකන බැව් මෙහි ලා සඳහන් කරමි. තවද, ඉදිරි කාලය තුළ එවැනිම ආකාරයකින් නොඉහොත් ඊට වඩා උසස් ආකාරයකින් ග්‍රාමීය ගොවි ජනතාවට සේවය කිරීමට බලාපොරොත්තු වෙමි.

අවසානව අවුරුදු 12 ක් බදුල්ලේ දිසාපති වශයෙන් සේවය කර, මෙම සමාලෝචන වාර්තාව සමාප්ත කරන අවස්ථාවේදී බදුල්ල මහා දිසාපති පිහිල්ලෙගෙදර මහතාගේ අභාවප්‍රාප්තවීමේ පුවත් අප වෙත ලැබීම කණගාටුවට කරුණකි. ඒ මහතා අතින් ඉටුවූ අවංක සේවය මෙහි ලා සඳහන් කිරීම උචිත යැයි විශ්වාස කරමි.

මර්වින් ඒ්ජ්. ගුණවර්ධන
පළාත් අධ්‍යක්ෂ — ඌව
1987 පෙබරවාරි 20.
කොළඹ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## උතුරුමැද පළාත—වාර්ෂික වාර්තාව—1986

### වී

1986 වර්ෂය තුළ දිවයිනේ වී නිෂ්පාදනය බුසල් මිලියන 124.3 පමණ විය. මේ වනාහි වර්ෂ 1985 දී ලැබූ බුසල් මිලියන 127.5 ක් වූ වාර්තාගත නිෂ්පාදනයට වඩා බුසල් මිලියන 3.2 හෙවත් 2.6% ක් අඩුවීමකි. එතකුදු වුවත්, උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති අසහනකාරී තත්ත්වයන් සහ වසර තුළ පැවති අහිතකර කාලගුණ තත්ත්වය අනුව සලකා බැලීමේදී මෙය ප්‍රශංසනීය ප්‍රතිඵලයක් වන්නේය.

**ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය**

| වගා කන්නය | නිෂ්පාදනය (බුසල් මිලියන) | අස්වැන්න (අක්කරයකට/බුසල්) |
|---|---|---|
| 1984/85 මහ | 83.9 | 67.8 |
| 1985 යල | 43.6 | 64.5 |
| 1985 මුළු ප්‍රමාණය | 127.5 | |
| 1985/86 මහ | 80.8 | 69.5 |
| 1986 යල | 43.5 | 63.7 |
| 1986 මුළු ප්‍රමාණය | 124.3 | |

උතුරු මැද පළාතේ මුළු වී නිෂ්පාදනය 1985 දී බුසල් මිලියන 24.1 ක් වූ අතර එය 1986 දී බුසල් මිලියන 26.5 ක් වීමෙන් 10% ක පමණ වැඩිවීමක් පෙන්නුම් කළේය.

1985/86 මහ කන්නයේදී පොළොන්නරුව, අනුරාධපුරය සහ මහවැලි 'එච්' ප්‍රදේශයේ යන මහ පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රම පිළිවෙලින් අක්කරයකින් බුසල් 96.5, 96.06 හා 91.88 යන වැඩි අස්වනු ප්‍රමාණයන් තවදුරටත් ලබා දුන්නේය. 1986 යල කන්නයේදී අස්වනු ප්‍රමාණයේ සුළු අඩුවීමක් වාර්තා විය.

උතුරු මැද පළාතේ අස්වද්ද ඇති අක්කර 3,50,000 පමණ වූ කුඹුරු ප්‍රමාණයෙන් 1986 මහ සහ යල යන කන්න දෙකේදී දළ වශයෙන් වගා කරන ලද මුළු කුඹුරු ප්‍රමාණය පිළිවෙලින් අක්කර 2,48,000 හා 1,22,000 විය. මෙම කාල පරිච්ඡේදය තුළ අස්වනු නෙලාගනු ලැබූ ශුද්ධ කුඹුරු අක්කර ගණන පිළිවෙලින් 2,07,000 ක් හා 1,02,300 ක් විය. මහ කන්නයේදී ගොවියන්ට බිත්තර වී බුසල් 36,000 ක් නිකුත් කරන ලදී, මෙය මීට කලින් මහ කන්නයේදී නිකුත් කරන ලද වී ප්‍රමාණයට වඩා බුසල් 9,000 ක පමණ වැඩිවීමකි. සහතික කල බීත්තර වී කලට වේලාවට ලබාගත හැකිවීම උතුරු මැද පළාතේ වී වගාව සාර්ථක වීමට හේතු වූ එක් කරුණක් විය.

උතුරු හා නැගෙනහිර පළාත්වල පවතින අසහනකාරී තත්ත්වයන් නිසා, එම ප්‍රදේශවල අඩුපාඩු සපුරාලීම පිණිස උතුරු මැද පළාතේ, විශේෂයෙන්ම පොළොන්නරුවේ, බිත්තර වී නිෂ්පාදනය වැඩි කිරීමට සිදු විය.

### අතිරේක ආහාර බෝග

1985/86 මහ කන්නයේදී අක්කර 55,000 සිට 60,000 දක්වා ප්‍රමාණයක අතිරේක ආහාර බෝග වගා කරන ලදී. මෙය ඊට කලින් වර්ෂයේදී අතිරේක ආහාර බෝග වගා කරන ලද බිම් ප්‍රමාණයට වඩා මදක් වැඩි වූ අතර, 1982/83 හා 1983/84 යන වර්ෂවල මහ කන්න තුළ වගා කරන ලද බිම් ප්‍රමාණවලට වඩා 50% කින් පමණ අඩුවිය. එම වර්ෂ වලදී අක්කර ලක්ෂයකට වැඩි බිම් ප්‍රමාණයක වෙනත් ක්ෂේත්‍ර බෝග, විශේෂයෙන් බඩ ඉරිඟු, උඳු, සෝයා සහ කුරක්කන් වගා කරන ලදී. 1986 යල කන්නයේදී අක්කර 35,000 ක පමණ මිරිස් වගා කරන ලදී. මහවැලි 'එච්' කලාපයේ වැඩිම අක්කර ගණනක් තිබුණු අතර, එය අක්කර 35,000 ක් විය. මිරිස් වගාව කෙතරම් ව්‍යාප්තව සිදු කරන ලද්දේ ද යත්, හරියාකාරව හඳුනාගැනීමට නොහැකිවූ රෝගයකට මෙම වගාව භාජනය විය. අහිතකර කාලගුණ තත්ත්වයන් නිසා පසුගිය අවුරුදු කීපය තුළ තල වගාව බෙහෙවින් පහත වැටුණි. 1985 යල කන්නයේදී අක්කර 13,000 ක තල වගා කරන ලද අතර, 1986 යල කන්නයේදී තල වගා කළ බිම් ප්‍රමාණය අක්කර 6,000 ක් විය. මීට පෙර සඳහන් කළ පරිදි අතිරේක ආහාර බෝග වගා අංශය කෘෂි කාර්මික අංශයේ වඩාත්ම හොඳ වගා අංශය බැව් පෙනී යයි. පර්යේෂණ සඳහාත් වඩාත් හොඳ අස්වැන්නක් ගෙන දෙන අළුත් බීජ වර්ග සංවර්ධනය සඳහාත් වැඩි අවධානයක් යොමු කළ යුතු වන්නේය. ගොවියන්ට උසස් වර්ගයේ බීජ සැපයීමට නොහැකිවීම සෙසු ක්ෂේත්‍ර බෝග වැඩ සටහන්වල එක් දුර්වල පුරුකක් වශයෙන් තවදුරටත් පවතී.

අනුරාධපුරයේ සුළු පරිමාණයේ වාරිමාර්ග යටතේ අස්වද්ද ඇති කුඹුරු ප්‍රමාණය අක්කර ලක්ෂයක් පමණ වේ. යල කන්නයේදී වැව් ජලය උපයෝගී කරගෙන මෙම ඉඩම්වල වී හා වෙනත් අතිරේක ආහාර බෝග වගා කරනු ලබන බිම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවේ. ජල මට්ටම තරමක් ඉහළින් පිහිටා ඇති මෙම ඉඩම්වලින් සමහරක නොගැඹුරු ළිං තනා ගතහොත්, අවුරුද්දේ මෙම කාල සීමාව තුළ කිසිම වැඩක නොයෙදී සිටින ගොවියන්ට කෙටි කාලීන බෝග වර්ග සාර්ථක ලෙස වගා කිරීමට හැකිවෙනවා ඇත. මුදල් ඉපයිය හැකි බෝග වගා කිරීම සඳහා නොගැඹුරු ළිං ඉදිකිරීම පිණිස මෙම ගොවියන්ට කිසියම් සහනාධාරයක් සලසා දීමට මෙම අධිකාරියේ සභාපතිතුමා පසුගිය අවුරුදු කීපය තුළ පරිශ්‍රමයක් දරා 'තිබේ. දැනට මෙම ගොවියන්ගෙන් වැඩි දෙනෙකුට ණය ලබා ගැනීම පහසු කාර්යයක් නොවන්නේය.

### පශු සම්පත්

කුකුළු පාලනය දැනට හොඳින් දියුණුවීගෙන යන අතර, මෙතෙක් ලබා ඇති ප්‍රතිඵල දිරිගන්වන සුලුවේ. දිනක් වයසැති දෙමුහුන් කුකුළු පැටවුන්ගේ සාමාන්‍ය හිඟයක් පවතින්නේ වී නමුදු, මෙම වර්ෂය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීනට උසස් වර්ගයේ කුකුළු පැටවුන් සැපයීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියට හැකි විය. උතුරු මැද පළාතේ ගොවීනට 1987 හා 1988 වර්ෂවලදී කුකුළු පැටවුන් නොකඩවා ලබා දීම සහතික කිරීම පිණිස කටයුතු යොද ඇත.

කුකුළු පාලනය පිළිබඳ විශේෂ අත්පොතක් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් පිළියෙල කර උතුරු මැද පළාතේ කුකුළන් ඇති කරන ගොවියන් අතර නොමිළේ බෙද දෙන ලදී.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කළමනාකාරවරුන්ගේ කාර්යක්ෂම සම්බන්ධීකරණයේ සහ මනා ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් මැතිවරණ කොට්ඨාශවල මෙම කර්මාන්තය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී තිබේ. ගොවිපළ උපකරණ උසස් තත්ත්වයේ කුකුළු ආහාර සහ ඖෂධ වර්ග දැන් මෙම දිස්ත්‍රික්ක තුළ ලබාගත හැක.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## උතුරුමැද පළාත–වාර්ෂික වාර්තාව–1986

1986 වර්ෂය තුළ බිත්තර සඳහා ලැබුණු මිළ ගණන් සතුටුදායක වූ අතර, එම තත්ත්වය තරමක් දුරට ස්ථාවරව අවුරුද්ද පුරාම පැවතුනි. කුකුළු පාලනය ඉදිරි වර්ෂ කීපය තුළ සංවර්ධනය කළ යුතු ඉතා ඵලදයි කර්මාන්තයක් සේ පෙනේ.

**ණය**

1962 දී මහජන බැංකුව පිහිට වූ අවස්ථාවේ, එහි අරමුණු එමගින් සම්පූර්ණයෙන් ඉටු කරන ලද්දේ නම් මෙවැනි යෝජනාවක් අවශ්‍ය නොවන්නට තිබුණේ යැයි ග්‍රාමීය සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා පනතක් ඉදිරිපත් කිරීමේදී මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා විසින් පෙන්වා දෙන ලදී. රාජ්‍ය බැංකු මගින් ප්‍රධාන වශයෙන් මුදල් ණයට දෙනු ලබන්නේ දැනටමත් මුදල් ඇති අයට බැව් පෙනේ. දැතින් කරන වැඩක යෙදී සිටින පුද්ගලයෙකුට මුදල් ණයට දීම 'බෙහෙවින් අවදනම්' කාර්යයක් සේ සැලකේ. රාජ්‍ය බැංකු පිහිටුවන ලද්දේ බෙහෙවින් අවදනම් ණය දීම් සඳහා බව අමතක වී තිබේ.

ග්‍රාමීය අංශයේ ගොවියන් කෙරෙහි බැංකු මීට වඩා ප්‍රතිචාරි සහ අනුකම්පා සහගත විය යුතුයි. අනෙක් අතට, ග්‍රාමීය ජනතාවගේ ඉතිරි කිරීම් වලින් වැඩි කොටසක් එක්රැස් වන්නේ මෙම බැංකුවලය.

**සාමාන්‍ය කරුණු**

ආර්ථිකය නංවාලීම සඳහා රජය විසින් විවිධ පියවර ගනු ලැබුයේ වී නමුදු දුගී මට්ටමෙන් පහළ ජීවත්වන ජනතාවගේ අනුපාතයේ සැලකිය යුතු අඩු වීමක් සිදුවී නොමැත. මන්දපෝෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් උතුරු මැද පළාතේ ජීවත්වන ජනතාවගෙන් විශාල කොටසක් නීරක්තයෙන් පෙළෙන බව පෙනේ. කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය හා කුකුළන් ඇති කිරීම වැඩි කිරීම සඳහා ගෙන ඇති පියවර මගින් මෙම ඌනතාවයන් සමහරක් මග හැරී යනවා ඇත.

ශ්‍රී ලංකාවේ දිනකට බිළිඳුන් දහසකට අධික සංඛ්‍යාවක් බිහිවන බව ගණන් බලා තිබේ. ඵලදායක ලෙස ජනගහන වර්ධනය පාලනය නොකළහොත් විසි එක්වන සියවස ආරම්භයේදී අපරට බරපතල ව්‍යසනයකට මුහුණ පානවා ඇත. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් උතුරු මැද පළාතේ පවත්වාගෙන යනු ලබන පවුල් සංවිධාන වැඩ පිළිවෙලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැත. ඇතැම් අතිරේක ආහාර බෝග සඳහා අවම මිළක් පවතී. අවාසනාවකට මෙන් කිසියම් බෝගයක නිෂ්පාදනය වැඩි වන සෑම අවස්ථාවකදීම අවම මිළ අහෝසි වී යයි. සෝයා හා බඩ ඉරිඟු මෙහි ලා නිදසුන් වශයෙන් සඳහන් කළ හැක. ආනයන කිරීම හේතුකොටගෙන ද දේශීය මිළ ගණන් පහත වැටුනි. මෙම අංශය පුළුල් කිරීමට නම් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන අතිරේක ආහාර බෝග සඳහා කිසියම් ආරක්ෂාවක් සැලසිය යුතුයි.

ගාමණී වික්‍රමසිංහ
පළාත් අධ්‍යක්ෂ — උතුරු මැද පළාත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## වයඹ පළාත—වාර්ෂික වාර්තාව—1986

1. **සාමාන්‍ය තොරතුරු**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් දිස්ත්‍රික්කවල මැතිවරණ කොට්ඨාශ කළමනාකරුවන්ගේ හා නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරුන්ගේ මාර්ගයෙන් වයඹ පළාතේ සියලු කෘෂිකාර්මික වැඩ කටයුතු තවදුරටත් සම්බන්ධීකරණය කර ගෙන යන ලදී. මෙම වර්ෂය තුළ සාලින්ද බී. රැකව මහතා කුරුණෑගල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ වශයෙන් වැඩ බාර ගත්තේය.

2. **පරිපාලන ඒකක — ව්‍යාප්ති යෙදවුම් කාර්ය මණ්ඩල**

මැතිවරණ කොට්ඨාශ තුළ පරිපාලන වැඩ කටයුතු ගොවි ජන සේවා මධ්‍යස්ථාන මගින් පවත්වාගෙන යනු ලැබූ අතර ගොවීන්ගෙන් හා නිලධාරීන්ගෙන් සමන්විත වූ කාරක සභා, තම තමන්ගේ අදාල මධ්‍යස්ථාන වලට අයත් පරිපාලන ප්‍රදේශ යන් තුළ තීරණ ගැනීමේ කාර්යයන්හි යෙදී සිටියෝය. පොහොර, කෘෂි රසායන, බීජ සහ උපකරණ යන සියලු යෙදවුම් මෙම මධ්‍යස්ථාන මගින් ගොවීන්ට සපයන ලදී.

3. **වී**

නොකඩවා පැවති නියඟය හේතුකොටගෙන මෙම වර්ෂය තුළ දිස්ත්‍රික්ක දෙකේම වී වගාවට බරපතල හානි පැමිණියේය. ජලය නොමැතිවීම හේතුකොට ගෙන මහ පරිමාණයේ හා සුළු පරිමාණයේ වාරි මාර්ග යෝජනා ක්‍රම ඇ තුළ සියලුම වගාවල පසුබෑමක් ඇති විය. බිත්තර වී නිෂ්පාදනය කෙරෙහි ද අහිතකර බලපෑමක් ඇති වූ අතර, ගොවීන්ගේ අවශ්‍යතා වෙනත් දිස්ත්‍රික්කවලින් ලබා ගැනීමට කටයුතු සැලැස්වීමට සිදුවිය.

**වගා කරන ලද කුඹුරු ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ:**

| | 1986 යල (අක්කර) | සාමාන්‍ය අස්වැන්න (අක්කර 1/බුසල්) | 1986/මහ (අක්කර) |
|---|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය ... ... ... | 1,07,625 | 49.4 | 1,40,456 |
| පුත්තලම දිස්ත්‍රික්කය ... ... ... | 14,988 | 47.0 | 29,148 |
| | 1,22,613 | | 1,69,604 |

1986/87 මහ කන්නයේ වගා කරන ලද කුඹුරු ප්‍රමාණයෙන් 60%ක් පමණ විනාශ විය. යල කන්නයේ සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණයත් මුළු අස්වැන්න ප්‍රමාණයත් බෙහෙවින් අඩු විය.

4. **පොල්**

පොල් වගා මණ්ඩලයට අයත් පැළ තවාන් සතුටුදායක ලෙස තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. එහෙත් දිගින් දිගටම පැවති නියඟය නිසා බලාපොරොත්තු වූ පරිදි, පොල් පැළ ගොවීන්ට සැපයිය නොහැකි විය. නියඟය නිසා පොල් වතු වලට ද අහිතකර බලපෑමක් ඇති වූ අතර, එමගින් දිස්ත්‍රික්ක දෙකේම පොල් වගාවන්ට හානි සිදු විය. නිෂ්පාදන සඳහා අඩු මිළක් ලැබීම තම ඉඩම් නිසි පරිදි, නඩත්තු කිරීමෙහි ලා ඉඩම් හිමියන් මන්දෝත්සාහී කළේය. අහිතකර කාලගුණ තත්ත්වය නිසාත් පොල් ඉඩම්වලින් ලැබෙන ආදායම අඩුවීම නිසාත්, පොහොර යෙදීමේ විශාල අඩුවීමක් දක්නා ලදී. පොල් වගා මණ්ඩලයේ සහනාධාර වැඩ පිළිවෙල යටතේ නව යටි වගා කළ අක්කර 7,927 ක් වගා කිරීම සහ අක්කර 12,267 ක් පුනරුත්ථාපනය කිරීම නිම කරන ලදී. වර්ෂය තුළ සඳ පීඩනයකට භාජනය වූ තම පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම සඳහා එම ඉඩම් හිමියන්ට කිසියම් සහනාධාරයක් සලසා දිය යුතු වන්නේය.

**පොල් ඉඩම්වල අතුරු බෝග වගා කිරීම**

වයඹ පළාතේ පොල් ඉඩම්වල අතුරු බෝග වශයෙන් සුළු අපනයන බෝග වගා කිරීම සම්පූර්ණයෙන් අසාර්ථක වී තිබේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සාමාන්තික වශයෙන් සුදුසු වූ ඉඩම් වලට ද නියඟයෙන් හානි පැමිණියේය. ඉඟුරු සහ අන්නාසි වගා කරන ලද ඉඩම් ප්‍රමාණයේ සැලකිය යුතු වැඩිවීමක් පෙනෙන්ට තිබුණි.

5. **සුළු අපනයන බෝග**

දෙපාර්තමේන්තුව විසින් අක්කර 136 ක සුළු අපනයන බෝග වගා කරන ලද අතර, මිශ්‍ර ගෙවතු 411 ක් පිහිටුවන ලදී. වර්ෂය තුළ අස්වැන්න අඩුවීම හේතුකොටගෙන ගොවියන් විසින් තම නිෂ්පාදන සඳහා තරමක් සාධාරණ වූ මිළ ගණන් ලබා ගන්නා ලදී.

6. **පළතුරු වගාව**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහනාධාර යෝජනා ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යනු ලැබූ අතර, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ අක්කර 551 ක පලතුරු බෝග වගා කරන ලදී. පැළ සඳහා වූ ඉල්ලුම තව තවත් වැඩි වූයෙන් එම ඉල්ලුම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ එම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ පෞද්ගලික තවාන් මගින් සපුරාලන ලදී. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දිගින් දිගටම මෙම පළාතේ පැවති දැඩි නියඟය හේතුකොටගෙන මෙම අංශයේ වගා කටයුතුවලට විශාල වශයෙන් අලාභ හානි සිදුවිය.

7. **අතිරේක ආහාර බෝග/එළවළු**

**වගා කළ බිම් ප්‍රමාණය (අක්කර වලින්):**

| | |
|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය ... | 56,148 |
| පුත්තලම දිස්ත්‍රික්කය ... | 31,055 |
| | 87,203 |

කන්න දෙකේම වගා කටයුතුවලට නියඟෙන් බරපතල හානි සිදුවූයෙන්, යල කන්නයේදී කුඹුරු ඉඩම්වල බහුල වශයෙන් වගා කිරීම අවධාරණය කරන ලදී. පුත්තලම දිස්ත්‍රික්කයේ රතුලූනු හා බොම්බයි ලූනු වගා කිරීමේ වැඩිවීමක් තවදුරටත් පෙන්නුම් කරන ලදී. මෙම නිෂ්පාදන ගොවිපළවලදීම මිලට ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය කටයුතු යොදා තිබුණි. ඉහත සඳහන් ගොවියන් විසින් කෘෂිකාර්මික ළිං පිහිටුවීම මෙම වර්ෂයේ වැදගත් සිද්ධියක් වූ අතර, ඔවුහු දැන් එම ළිං බැඳීම සඳහාත්, අවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහාත් කිසියම් ආධාරයක් අපේක්ෂා කරති.

### 8. අලෙවි කිරීම/අපනයන නිෂ්පාදන ගම්

අපනයන නිෂ්පාදන ගම් යෝජනා ක්‍රමය යටතේ මෙම අංශය මගින් ලබා ඇති ප්‍රගතිය සතුටුදායක යැයි සැලකිය නොහැක. අලෙවි කිරීමේ නිසි වැඩ පිළිවෙලක් නොමැතිවීම නිසා ඉහුරු වගාකරුවෝ ප්‍රකෝපවත් වූහ. අපනයනකරුවන්, අපනයන සංවර්ධන මණ්ඩලය සහ අපනයන නිෂ්පාදන ගම් අතර සම්බන්ධතාවයක් නිසි පරිදි ඇතිකරගෙන නොමැති බවත්, මෙම මුළු යෝජනා ක්‍රමය පිළිබඳව ගොවියන් තුළ කිසියම් සැකයක් පහළ වී ඇති බවත් පෙනී යයි. අපනයන නිෂ්පාදන ගම් පිළිබඳ ආකල්ප සාර්ථකවීමට නම්, ගොවියන් හා අපනයනකරුවන් අතර වඩා සමීප සම්බන්ධතාවයක් ගොඩ නැංවීමෙන්, අපනයන සංවර්ධන මණ්ඩලය මීට වඩා වැදගත් මෙහෙයක් ඉටු කළ යුතු වන්නේය. තවදුරටත් තම තමන්ගේ නීති රීති හා කොන්දේසි පනවන අපනයනකරුවන් කණ්ඩායමක ග්‍රහණයට අපනයන නිෂ්පාදන ගම් අසුවීමට ඉඩ ඇති බැවින්, විදේශීය වෙළඳපොළවල් හා ඒවායේ ව්‍යාපෘතිය ගැන මනා අවබෝධයක් ඇති අපනයන සංවර්ධන මණ්ඩලය විසින්, භාණ්ඩවල තත්ත්වය, ප්‍රමාණය හා මිළ ගණන් සම්බන්ධයෙන් අපනයන නිෂ්පාදන ගම්වලට මග පෙන්වා දිය යුතු වන්නේය.

### 9. උපකරණ හා ගොවිපළ බලය

ක්‍රමයෙන් ඉහළ නගින යෙන් මුදලේ අනුපාතය හේතුකොට ගෙන ඇතැම් ගොවියන්ට තම වැඩ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය උපකරණ පවා මිළට ගත නොහැකි තත්ත්වයක් උදාවූයේ වී නමුදු ඉහත සඳහන් උපකරණ සඳහා විශේෂයෙන්ම රෝද දෙකේ ට්‍රැක්ටර් සඳහා ඇති ඉල්ලුම වර්ෂය පුරා තවදුරටත් වැඩිවිය. වර්ෂය තුළ වගා කටයුතු අසාර්ථකවීම උපකරණ අලෙවිය කෙරෙහි එක එල්ලේම බලපෑවේය.

### 10. බැංකු වැඩ කටයුතු/ණය යෝජනා ක්‍රම

රාජ්‍ය බැංකු විසින්, වගා කටයුතු සඳහාත්, කෘෂිකාර්මික උපකරණ මිළට ගැනීම සඳහාත් ගොවීනට තවදුරටත් මුදල් ආධාර සලසා දෙන ලදී. එතකුදුවුවත්, තවදුරටත් තම වගා කටයුතු පාලුවීම නිසා කලින් ලබාගත් ණය ආපසු ගෙවීමට නොහැකිවීම හේතුකොටගෙන ඔවුනගේ මුදල් ණයට ගැනීමේ හැකියාව අඩු වූයේය. ලබන වගා කන්නවලදී සියලුම ගොවියන්ට ණය පහසුකම් සලසා දීම සඳහා විශේෂ ආධාර යෝජනා ක්‍රම සම්පාදනය කළ යුතු වන්නේය. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීමත් සමග ගොවියන් වැඩි පිරිසක් බැංකු කටයුතුවල නිරතවන බැව් පෙනේ.

### 11. වාරිමාර්ග

**ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව :**

| | | පුත්තලම දිස්ත්‍රික්කය රු. ශ. | කුරුණෑගල දිස්ත්‍රික්කය රු. ශ. |
|---|---|---|---|
| වෙන් කරන ලද මුළු මුදල | ... | 17,81,700 00 | 88,50,251 00 |
| මුළු වියදම | ... | 16,67,259 00 | 1,25,80,283 00 |

මෙම වැඩ සම්බන්ධයෙන් මෙම වර්ෂය තුළ ඉතා සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. ඊට මූලික හේතුව වූයේ වැඩි දින ගණනක් වැඩ කළ හැකි වන පරිදි වර්ෂය පුරාම වියළි කාල ගුණ තත්ත්වයක් පැවතීමයි. සියලුම සුළු පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රමවල නඩත්තුව, පුනරුත්ථාපනය හා ජලය පාලනය කිරීමේ වැඩ කටයුතු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් සතුටුදායක ලෙස පවත්වාගෙන යන ලදී. එක් එක් ඒකාබද්ධ කළ ව්‍යාපෘතියක් යටතේ පුනරුත්ථාපනය කරන ලද වැව් ජල පාලන දෙපාර්තමේන්තුව විසින් බාරගන්නා ලදි. වාරිමාර්ග පුනරුත්ථාපනය වැඩ සම්බන්ධයෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය නිතරම විමසිලිමත් වූ අතර, කොන්ත්‍රාත්කරුවන් විසින් සතුටුදායක මට්ටමකින් තම වැඩ නිම කිරීමට එය හේතු විය.

**බුල්ඩෝසරය — වැව්වල රොන්මඩ ඉවත් කිරීම**

ගොවියන් තුළ ඇති උනන්දුව තවදුරටත් වැඩිවෙමින් පැවත් නමුදු, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් ඔවුනට සලසා දෙන ලද සේවාවන් සතුටුදායක වූයේ යැයි සැලකිය නොහැක. යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම, අමතර කොටස් නොමැතිවීම ආදී හේතූන් නිසා නුවුවමනා ප්‍රමාදවීම් ඇති විය. මෙම වැඩ පිළිවෙල අඛණ්ඩව පවත්වාගෙන යෑමට නම් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව විසින් සුදුසු තාක්ෂණික සේවා මණ්ඩලයක සේවය පූර්ණ වශයෙන් ලබාගත යුතු වන්නේය. ගොවීන්ගෙන් එකතු කරගත් මුදල් යොදා ගනිමින් වර්ෂය තුළ වැඩ 37 ක් නිම කරන ලදි. වර්ෂ 1987 තුළ සෑම මැතිවරණ කොට්ඨාශයකටම නිත්‍ය වශයෙන් එක් යන්ත්‍රය බැගින් ලබා දීමට අපේක්ෂා කෙරේ.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

| | | පුත්තලම දිස්ත්‍රික්කය රු. ශ. | කුරුණෑගල දිස්ත්‍රික්කය රු. ශ. |
|---|---|---|---|
| වෙන් කරන ලද මුළු මුදල | ... | 4,70,42,000 00 | 2,88,98,000 00 |
| මුළු වියදම | ... | 4,48,01,000 00 | 2,85,45,000 00 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වාරිමාර්ග ඇළවල් පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු තවදුරටත් සතුටුදායක ලෙස කරගෙන යන ලදි. එම වැඩ වලින් 90% ක් සඳහා වැය කරන ලද්දේ ඒ ඒ ඒකාබද්ධ කළ දිස්ත්‍රික් ව්‍යාපෘති යටතේ වෙන් කරන ලද මුදල්ය. අවුරුදු ගණනාවක් තුළ මුහුණ පෑමට සිදුවූ මූලික ප්‍රශ්නවලින් එකක් වන, ජල පාලන වැඩ කටයුතු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමෙහි ලා මහ පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රමවලට ව්‍යාපෘති කළමනාකරුවන් පත් කිරීම මගින් සමීප සම්බන්ධතාවයක් ඇති කර තිබේ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## වයඹ පළාත—වාර්ෂික වාර්තාව—1986

12. **පශු සම්පත් සංවර්ධනය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරයා පශු සම්පත් සංවර්ධනය කිරීමෙහි ලා තවදුරටත් පෙරමුණ ගෙන සිටියේය. එය එසේ වුවද, නිලධාරීන්ගේ තනතුරු ඇබෑර්තුවී තිබීම පළාතේ සංවර්ධනයට බාධාවක් විය.

**කුකුළු පාලනය**

දවසක් වයසැති කුකුළු පැටවුන් සඳහා පෙර නොවූ විරූ ඉල්ලුමක් පැවති අතර, කෘත්‍රිම හිඟයක් ඇති කිරීමෙන් පෞද්ගලික පැටවුන් රකින ස්ථාන විසින් අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් බව හැඟී ගියේය. වර්ෂයේ පසු භාගයේදී රජයේ සහ රජය සම්බන්ධ පැටවුන් රකින ස්ථාන පිහිටුවීම නිසා කුකුළු පැටවුන් සඳහා ඇති අධික ඉල්ලුම ලිහිල් විය. මැතිවරණ කොට්ඨාශ කීපයක් තුළ කුකුළන් බෝ කරන්නන්ගේ සමිති පිහිටුවා ඇති අතර, එම සමිති මගින් යෙදවුම්, අළෙවිකරණය ආදී සියලුම අංශ සම්බන්ධීකරණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**එළුවන්/බැටළුවන්**

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මෙම ක්ෂේත්‍රයෙහි පැහැදිලි වර්ධනයක් පෙනෙන්ට තිබුණු අතර, අදාල දෙපාර්තමේන්තු මගින් අවශ්‍ය සහාය සලසා දෙන ලදී. අතිරේක ආදායමක් ලබා දෙන මෙම කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ආධාර හා මාර්ගෝපදේශ පොල්වතු හිමියන්ට සහ රජයේ වතුවලට ලබා දී තිබේ. මෙම වැඩ සටහන් තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ගොවියන් අතර එළුවන් බෝ කිරීමේ සමිති ගණනාවක් පිහිටුවා තිබේ.

**කිරිපට්ටි සංවර්ධනය/කිරි එක් රැස් කිරීම**

මෙම අංශයේ ප්‍රගතිය තවදුරටත් දිරි ගන්වන සුලු තත්ත්වයක පැවතුනි. ගම් මට්ටමේදී සංවිධානාත්මකව කිරි එක් රැස් කිරීමේ වැඩ පිළිවෙල මගින් තව තවත් ගොවීන්ට කිරි පට්ටි සංවර්ධනයට අවස්ථාවක් සලසා දී තිබෙ. කිරි දෙනුන් සඳහා ගොවියන්ගෙන් ලැබෙන ඉල්ලුම සපුරා ලීමට රජයේ ගොවිපළවල් අසමත් වූ නමුදු, එක් රැස් කරගනු ලබන මුළු කිරි ප්‍රමාණයේ වැඩිවීමක් පෙනෙන්නට තිබුණි. විශේෂ ලක්ෂණයක් වූයේ ගම් මට්ටමේ යෝගට්, මුදවාපු කිරි හා වෙනත් කිරි නිෂ්පාදන නිපදවීම වැඩි වීමයි.

**සාමාන්‍ය කරුණු**

නොකඩවා පැවති නියඟ නිසා වර්ෂය තුළ වගා කටයුතු අතින් ලැබූ ප්‍රගතිය පහත් මට්ටමක පැවතුණි. වයඹ පළාතේ ගොවි ජනතාවගේ ඉල්ලීම වනුයේ තම කෘෂිකාර්මික වැඩ කටයුතු නොකඩවා පවත්වාගෙන යෑමට හැකිවන පරිදි මුළු වර්ෂය පුරාම අඛණ්ඩ ජල සැපයුමක් එම පළාතට ලබා දීමයි. වාරිමාර්ග පුනරුත්ථාපනය සහ පශු සම්පත් සංවර්ධනය සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කළේය.

වයඹ පළාතේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි ලා, අදල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන්ගෙන්, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගෙන්, මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගෙන් සහ කෘෂිකාර්මික කළමනාකරුවන්ගෙන් ලැබුණු සහාය ගැන මගේ කෘතඥතාව ඒ සියලු දෙනා වෙත පුද නොකළහොත් මගේ වාර්තාව අසම්පූර්ණ වන්නේය.

ඉදිරි වර්ෂයේදී මීටත් වඩා උසස් ප්‍රතිඵල අත්කර ගැනීම මගේ අපේක්ෂාව වන්නේය.

**ඒ. ජී. කුමාරගේ**
පළාත් අධ්‍යක්ෂ — වයඹ පළාත

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## මධ්‍යම පළාත—වාර්ෂික වාර්තාව—1986

### 1. පරිපාලනය

මහනුවර දිස්ත්‍රික්කයේ සෙන්කඩගල හා මහනුවර මැතිවරණ කොට්ඨාශ හැර ගණනින් දහනවයක් වන මධ්‍යම පළාතේ සෙසු සියලුම මැතිවරණ කොට්ඨාශ දැන්, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සේවය යටතට පත් කර තිබේ.

වැඩ කටයුතු නිසි පරිදි, පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය, මැතිවරණ කොට්ඨාශ මට්ටමේ කාර්ය මණ්ඩල ලබා දී ඇත. දිස්ත්‍රික්ක මට්ටමේ පරිපාලනය සඳහා දිස්ත්‍රික්ක තුන භාර නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් පත් කරනු ලැබ සිටිති.

### 2. ගොවි ජන සේවා මධ්‍යස්ථාන

දේවහුවේ නව මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් මාතලේ දිස්ත්‍රික්කය තුළ ග්‍රාමීය මට්ටමේ ගොවි ජන සේවාවන් තවදුරටත් ශක්තිමත් කරන ලදි. සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ මෙම මධ්‍යස්ථානවල කළමනාකරණයේ සාමාන්‍ය දියුණුවක් පෙනෙන්නට තිබුණි. සතුටුදායක යෙදවුම් සේවාවන් සලසා දෙන ලදි. ගොවි ජන සේවා කමිටු තවදුරටත් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක විය. එහෙත් නොසලකා හැර ඇති ඉඩම් අධීක්ෂණය කිරීමෙහි ලා තාක්ෂණික සේවා කමිටු මගින් සේවයක් ඉටු නොවූ බව නැවත නැවතත් සඳහන් කළ යුතුව ඇත.

### 3. වගා කටයුතු

**වී වගාව**

1986 යල හා 1986/87 මහ වගා කන්න තුළ පැවැති කාලගුණ තත්ත්වයන් වී වගාවට අහිතකර විය. පමා වී වැසි ලැබීමත්, මාරුවෙන් මාරුවට වියළි කාල ගුණයක් හා අධික වර්ෂා පතනයක් ඇතිවීම, නිසි පරිදි වගා කටයුතු පවත්වාගෙන යෑමට බාධාවක් වූ අතර, එනිසාම වගා හානි වී, වී නිෂ්පාදනය අඩු විය.

**තේ**

සාමන්තික ඉඩම්, වගා විවිධකරණ වැඩ පිළිවෙල යටතට පත් කර ඇති අතර, දිස්ත්‍රික්ක තුනේම රජයේ පාලනය යටතේ ඇති ඉඩම් තවදුරටත් මනාව පාලනය කරගෙන යන ලදි. තේ දළු මිළ ගණන් කෙරෙහි එක එල්ලේම බලපෑමක් ඇති කරමින්, තේ මිළ ගණන් පහත වැටීම නිසා, කුඩා තේ වතු පුනරුත්ථාපනය කිරීම අතින්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය සතුටුදායක නොවීය. සහනාධාර යෝජනා ක්‍රමය යටතේ තම ඉඩම් පුනරුත්ථාපනය කිරීමෙහි ලා කුඩා තේ වතු හිමියන් මැළි බවක් පෙන්නුම් කළ අතර, පොහොර යෙදීමෙදී පැහැදිලි අඩුවීමක් පෙනෙන්නට තිබුණි. තමන්ට අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා තම තමන්ගේම තවාන් පිහිටුවා ගන්නා ලෙස කුඩා තේ වතු හිමියන් උනන්දු කරවීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හා රාජ්‍ය වැවිලි සංස්ථාවේ නිලධාරීන් සමත් වී ඇත. අවශ්‍ය වගා පිළිවෙත් අනුගමනය කිරීමට තරම් සම්පත්, කුඩා තේ වතු හිමියන් සතුව නොමැති බැවින්, තේ දළු මිළට ගනු ලබන මිළ ගණන් වල වැඩි කිරීමක් සිදු නොවුව හොත් කුඩා තේ වතු හිමියන් විසින් තම තේ වතු තවදුරටත් නොසලකා හරිමට ඉඩ තිබේ.

**සුළු අපනයන බෝග**

මෙම අංශය යටතේ ලබා ඇති ප්‍රගතිය සතුටුදායක යැයි සඳහන් කළ හැකි අතර, මේ රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතා අතින් දැන් මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක ස්වයංපෝෂිත තත්ත්වයක් ලබා ඩබේ. මිශ්‍ර ගෙවතු පදනමක් මත වගා කිරීම මෙම පළාතේ අතිශයින් ජනප්‍රිය වී ඇත.

වගා කටයුතු සඳහා ලබා ගත හැකි ඉඩම් ප්‍රමාණය සීමා සහිත වීම නිසා, මධ්‍යම පළාතේ සහනාධාර යෝජනා ක්‍රමය ව්‍යාප්ත කළ හැකි ප්‍රමාණය සීමා සහිත වන බැවින්, දැන් අවශ්‍ය වී ඇත්තේ උපරිම ප්‍රතිඵල ලබා ගත හැකි වන පරිදි, තියුණු විද්‍යාත්මක වගා වැඩ පිළිවෙලක් බව අවධාරණයෙන් සඳහන් කරමි. මෙම අරමුණ ඇතිව, පොහොර නිසි පරිදි භාවිත කිරීම හා මේරූ කෝපි වගා කප්පාදු කිරීම පිළිබඳ ආදර්ශ බිම් කට්ටි සියලුම මැතිවරණ කොට්ඨාශ තුළ පිහිටුවා ගෙන යනු ලැබේ.

පසුගිය අවුරුදු හතර තුළ මහනුවර හා මාතලේ යන දිස්ත්‍රික්ක දෙකේම කරාබු නැටි අස්වැන්නේ සැලකිය යුතු අඩුවීමක් පෙනෙන්නට තිබුණි. මීට හේතුව සොයා ගැනීම සඳහා විද්‍යාත්මක සමීක්ෂණයක් කළ යුතු වේ. සමාලෝචනයට භාජනය වූ කාලපරිච්ඡේදය තුළ ගම්මිරිස් සහ කෝපි වෙනුවෙන් සතුටුදායක මිළ ගණන් ලැබුණි.

**දුම්කොළ**

අංශක 60 ට වැඩි බෑවුම් සහිත කඳුවල දුම්කොළ වගා කිරීමට අනුබල නොදෙන බවට වගා කරුවන් මෙන්ම නිෂ්පාදකයන්ද සහතික කර තිබියදීත් එවැනි කඳුවල තව දුරටත් දුම්කොළ වගා කිරීම කණගාටුවට කරුණකි. යල හා මහ යන කන්න දෙකේදීම තව තවත් කුඹුරු ඉඩම් දුම්කොළ වගාව සඳහා යොදා ගැනීමේ අවැඩදායක නව නැම්මක් පෙනෙන්නට තිබේ. මේ සඳහා අවසර නොදිය යුතුයි. මයිලපිටිය, හුන්නස්ගිරිය, හඟුරන්කෙත, සහ වලපනේ යන ප්‍රදේශ වල තවදුරටත් අනවසරයෙන් දුම්කොළ වගා කරන බව පැහැදිලිය. දුම්කොළ වගා කරන ඉඩම් වලින් විශාල කොටසක් එක එල්ලේම් නොහොත් අනියම් ආකාරයකින් මහවැළි ජලාශ ආශ්‍රිත ප්‍රදේශයේ පිහිටා තිබියදීත්, පෙරදී මෙන් පස සංරක්ෂණය කිරීමේ වැඩ ක්‍රමානුකූලව නොකරන බවක් පෙනෙන්නට තිබේ. මෙම තත්ත්වය තවදුරටත් පවත්වාගෙන යෑමට ඉඩ ඇරියහොත් එය පරිසරයට හානිකර වන අතරම, ඉඩම් උපයෝගී කර ගැනීම පිළිබඳ නිසි පාලනයක් ද නොමැති වී යනවා ඇත.

**අතිරේක ආහාර බෝග**

විශේෂයෙන්ම මාතලේ දිස්ත්‍රික්කයේ අතිරේක ආහාර බෝග වගාවේ වැඩිවීමක් දකින්නට ලැබුණි. දඹුල්ල මැතිවරණ කොට්ඨාශයේ බොම්බයිලූනු වගා කළ බිම් ප්‍රමාණයේ ශීඝ්‍ර වැඩිවීමක් වාර්තා වීම විශේෂයෙන් සඳහන් කළ යුතුවේ. සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ සියලුම නිෂ්පාදන සඳහා සතුටුදායක මිළ ගණන් ලැබුණි.

### 4. පොහොර

වී වගා අංශයේ පොහොර භාවිත කිරීම ජනප්‍රිය වී ඇති බැව් පෙනේ. ගොවියන් විසින් ලබා හන්නා ලද වැඩි අස්වැන්න ප්‍රමාණවලින් මෙය පැහැදිලි වන්නේය. සැපයුම් තත්ත්වය අතින්, සියලුම දිස්ත්‍රික්කවලට කාර්යක්ෂම ලෙස පොහොර සපයා තිබේ. පොහොර හිඟයක් ගැන කිසිම වාර්තාවක් ලැබී නැත. ගොවි ජන සේවා මධ්‍යස්ථාන හා එක් වී, සමුපකාර

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## මධ්‍යම පළාත—වාර්ෂික වාර්තාව—1986

ගබඩා සමූහය මගින් ප්‍රමාණවත් පොහොර හා කෘෂි රසායන තොග බෙදා හරින ලදි. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ අර්ධ මාසික සමීක්ෂණ වැඩ පිළිවෙල මගින්, මෙම නිෂ්පාදන ක්‍රමවත් පරිදි, ගම් මට්ටමේදී ලබා ගැනීම සහතික කරන ලදි.

### 5. ග්‍රාමීය ණය

සීමා සහිත ණය දීමේ ප්‍රතිපත්තිවල සාධාරණ ලිහිල් කිරීමක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රාජ්‍ය බැංකු මගින් ග්‍රාමීය කෘෂිකාර්මික ණය සම්බන්ධයෙන් යම් යම් වෙනස් කිරීම් සිදු කර ඇති බැව් පෙනේ. මේ සඳහා මාතලේ ග්‍රාමීය සංවර්ධන බැංකුවක් පිහිටුවා ඇත.

කලින් සිදුවූවාක් මෙන් ක්‍රමවත් අධීක්ෂණයක් නොමැති වීමේ හේතුවෙන් ගොවියෝ ණය ආපසු ගෙවීම පැහැර හැරියහ. ග්‍රාමීය ගොවියා චනාහි ආත්ම ගරුත්වයකින් යුත්, සාඩම්බර උදාර පුද්ගලයකු වන බවත්, ක්‍රමවත් අධීක්ෂණයක් යටතේ කොන්දේසි ක්‍රියාත්මක කගරන්නේ නම් ඔහු විසින් ආයතනික ණයක් ආපසු ගෙවීම පැහැර හැරීම කලාතුරකින් සිදු විය හැක්කක් බවත් අමතක නොකළ යුතුයි. මේ සඳහා අවශ්‍යවී ඇත්තේ රාජ්‍ය බැංකු දෙක විසින් අධීක්ෂණ හා ව්‍යාප්ති නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් සේවයට බඳවා ගැනීමයි. ග්‍රාමීය අංශයේ ඉතිරි කිරීමේ පුරුද්ද අතින්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සතුටුදායක වර්ධන වේගයක් වාර්තා වී තිබේ. මෙය සංවර්ධනයේ මිම්මක් වශයෙන් සලකන්නේ නම්, මැතිවරණ කොට්ඨාශ තුළ මූලධන එක්රැස් වීම හිතකර ලක්ෂණයක් වන්නේය.

### 6. වාරිමාර්ග

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා මහා පරිමාණයේ හා සුළු පරිමාණයේ වාරිමාර්ග නඩත්තු කිරීමේ, පුනරුත්ථාපනය කිරීමේ හා ඉදි කිරීමේ වැඩ පිළිවෙල අදාල දෙපාර්තමේන්තු විසින් සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර තිබේ. වැව් අමුණු හා ඇළ මාර්ග පුනරුත්ථාපනය සඳහා ප්‍රමුඛතාව දෙන ලදි. වාරිමාර්ග ක්‍රම නඩත්තු කිරීමෙහි ලා වැඩදයක දියුණුවක් ලබා ඇති අතර, එය හේතු කොටගෙන අමතර බිම් ප්‍රමාණයක් වගා කර එමගින් කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීමට හැකි වී තිබේ.

පසුගිය අවුරුදු හය ඇතුළත සුළු වාරිමාර්ග වෙනුවෙන් වැය කරන ලද මුදල්, ගම් මට්ටමේ බලපෑමක් ඇතිකර තිබෙන අතර, ගම් මට්ටමේදී වාරිමාර්ග ප්‍රශ්න විසඳීම සඳහා ඵලදායක ක්‍රියා මාර්ගයක් අනුගමනය කර ඇති බව ගොවීන්ට අවබෝධ වී තිබේ.

### 7. සත්ව පාලනය

සභාපතිතුමාගේ උපදෙස් පරිදි, කිරි ආහාර ආනයනය කිරීම සඳහා පිටරටවලට ඇදී යන විදේශ විනිමය ප්‍රමාණය අඩු කිරීමේ සහ ජනතාවගේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව්, හැකිතරම් කෙටි කාලයක් තුළ කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ උත්සාහයක් වශයෙන්, කිරි පට්ටි වැඩි දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, මෙම අංශයේ සංවර්ධනය කෙරෙහි ප්‍රමුඛතාව ලබා දෙන ලදි. කිරි නිෂ්පාදනය කිරීමේ/බර ඇදීමේ කාර්යයන් සඳහා එක් ගොවි පවුලකට ගවයන් දෙදෙනෙක් යන පදනම මත බැංකු ණය යෝජනා ක්‍රමයක් යටතේ හෝ අත්පිට මුදලකට හෝ ගවයන් ලබාදීම සඳහා සභාපති තුමා විසින් සකස් කරන ලද යෝජනා ක්‍රමයක් දැන් ක්‍රියාත්මක වෙමින් පවතී. සුදුසු වර්ගවලට අයත් ගවයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලබා ගත නොහැකි වීම මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑමට සිදුවූ ප්‍රධාන බාධකයක් විය. සභාපතිතුමා විසින් පෙන්වා දෙනු ලැබූ තවත් කරුණක් වනුයේ, පශු සම්පත් සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වූ දැනට ඇති පශු පාලන පහසුකම් වැඩි දියුණු කිරීමේ අදිසි අවශ්‍යතාවයි. දැනට පවත්නා කිරි අලෙවි කිරීමේ ක්‍රමය සමීප අවධානයට ලක්විය යුතු තවත් අංශයක් වන බැවින්, අළුත් සමාගම (මිල්කෝ) පිහිටුවීමත් සමගම, එම අංශය කෙරෙහි ද අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 8. නැවත පදිංචි කරවීම

මීට කලින් වාර්තාවල ද සඳහන් කළ පරිදි, ගොවීන්ට තම මැතිවරණ කොට්ඨාශ තුළ මුහුණ පෑමට ඇති ආර්ථික දුෂ්කරතා හේතුකොටගෙන, ඔවුන් සංවර්ධිත මහවැළි ප්‍රදේශවලට ගෙන යන මෙන් එම ගොවියන් විසින් සාධාරණ ඉල්ලීමක් කර තිබේ. දඹුල්ල හා ලග්ගල හැර සෙසු මැතිවරණ කොට්ඨාශ හැමෙකක්ම පාහේ අතිශයින් ජනාකීර්ණය. මෙහි ලා හාරිස්පත්තුව විශේෂයෙන් සඳහන් කළ හැක්කේ එහි ජනගහනය පුපුරා යන තරම් අධික වී ඇති බැවිනි.

ජනගහන වර්ධනය හා ජනාකීර්ණ වීම ජාතික ප්‍රශ්න වන අතර, එම කරුණු සුපරික්ෂාකාරී ලෙස අධ්‍යයනය කර, ප්‍රශ්නය වඩාත්ම බරපතල ප්‍රදේශවල ජනාකීර්ණභාවය ලිහිල් කිරීම කෙරෙහි ප්‍රමුඛතාවය දිය යුතුවේ. එසේ නොකළහොත්, ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට නොහැකි වනවා ඇත. එමනිසා ඔවුන් සතු ඉතා සුළු බිම් ප්‍රමාණයකින් දුක සේ දිවි රැක ගැනීමට ඔවුන්ට අනිවාර්යයෙන්ම සිදුවනවා ඇත.

### 9. සමාප්තිය

කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය සම්බන්ධීකරණය කරනු ලබන යෙදවුම්, අලෙවිකරණය හා පුහුණු කිරීමේ කාර්යයන් පිළිබඳ ඒ ඒ අංශවල ක්‍රියාකාරකම් වල ප්‍රගතිය හා ඒ පිළිබඳ විස්තර අදල අංශ මගින් ඉදිරිපත් කරනවා ඇත. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය ආරම්භ කරන ලද අවස්ථාවේ සිටම එය කෘෂිකාර්මික අංශයේ ප්‍රගතිය වර්ධනය කිරීම සඳහා එම වර්ධන වේගය පවත්වා ගෙන යෑම සඳහාත් එමගින් ඉටුවිය යුතු සේවය ඉටුකර තිබේ. සභාපතිතුමාගේ උනන්දු කරවීමෙන් දිරි ගැන්වුනු අපි, අපගේ උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කර වඩා හොඳ අනාගත ජීවිතයක් සඳහා අප ජනතාව තුළ ඇති අපේක්ෂාවන් සපුරාලීමට උත්සාහ දරමු.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ අරමුණු හා පරමාර්ථ දැන් පැහැදිලි බැවින්, එහි කාර්යයන් හා වගකීම් පිළිබඳව

ව්‍යාකූලතාවියක් හෝ වැරදි අවබෝධයක් හෝ ඇතිකර ගැනීමට හේතුවක් නොමැත.

නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු හා කෘෂිකාර්මික කළනමාකරුවන් වෙත පැවරී ඇත්තේ ඇත්ත වශයෙන්ම පහසු කාර්යයක් නොවන අතර, ඔවුන් අතින් ඉටුවූ උසස් සේවය මම අගේ කොට සළකමි. තවද මා වෙත දක්වන ලද සහයෝගය ගැන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ටත්, දිසාපතිවරුන්ටත්, සෙසු රජයේ නිලධාරීන්ටත් කෘතඥතාව පළ කරමි.

අවසාන වශයෙන්, මැතිවරණ කොට්ඨාශවල වැඩ කටයුතු සංවිධානය කිරීමෙහි ලා සභාපතිතුමාගෙන් ලත් ධෛර්යය, මග පෙන්වීම හා උපදෙස් අවංකව අගය කොට සලකමි.

1987.02.17.
කොළඹ.

පැට්‍රික් සී. අබේනායක
පළාත් අධ්‍යක්ෂ — මධ්‍යම පළාත

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## බටහිර පළාත—වාර්ෂික වාර්තාව—1986

### 1. සාමාන්‍ය තොරතුරු

සමාලෝචනයට භාජනය වූ කාලපරිච්ඡේදය තුළ බටහිර පළාතේ වැඩ කටයුතු තව මැතිවරණ කොට්ඨාශ හතරක් තුළ ආරම්භ කරන ලදි. එම මැතිවරණ කොට්ඨාශ නම් කැස්බෑව, වත්තල, කළුතර හා බේරුවලය. කළුතර හා බේරුවල මැතිවරණ කොට්ඨාශ තුළ වැඩ කටයුතු සම්බන්ධීකරණය සඳහා පත් කර ඇත්තේ එක් කළමනාකරුවකු පමණි. මීරිගම හා බියගම මැතිවරණ කොට්ඨාශවල ඇබෑර්තු ද සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේද තුළ සම්පූර්ණ කරන ලදි.

කළුතර නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ සමාලෝචනයට භාජනය වූ කාලපරිච්ඡේදය තුළ ඉල්ලා අස්විය. එම ඇබෑර්තුව 1987 මුල් භාගයේදී පුරවනවා ඇත.

### 2. වී වගාව

යල මහ දෙකන්නය තුළදීම යහපත් කාලගුණ තත්ත්වයක් පැවතුනි. දිස්ත්‍රික්ක තුනෙන්ම ලබාගත් අස්වැන්න ප්‍රමාණයන් සතුටුදායක විය. එය කෙසේ වුවද, ජල බැස යාමේ ප්‍රශ්න හේතුකොටගෙන කුඹුරු ඉඩම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් තවමත් වගා කළ නොහැකි තත්ත්වයක පවතී. මෙම ප්‍රශ්න මගහරවා ගතහැකි නම්, වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමට පුළුවන.

''කලට වේලාවට වගා කිරීමේ'' ක්‍රමය ගම්පහ දිස්ත්‍රික්කය තුළ තවදුරටත් සාර්ථකව පවතී. මෙම වගා කිරීමේ ක්‍රමය කොළඹ හා කළුතර දිස්ත්‍රික්ක මගින්ද අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 3. පොල් වගාව

වර්ෂ 1986 දී පොල් මිල මඳ වශයෙන් වැඩි විය. එහෙත් නිසි වගා පිළිවෙත් අනුගමනය කිරීමට නම්, දැනට ලැබෙන මිළ ගණන් නිෂ්පාදන වියදම දැරීමට ගොවීන්ට ප්‍රමාණවත් නොවේ. පොහොර භාවිතාව අඩුවීමක් ඇති වී තිබෙන බව සංඛ්‍යාලේඛන වලින් පෙනේ. මෙම තත්ත්වය තවදුරටත් පවත්වාගෙන ගියහොත් අනාගතයේදී අස්වැන්න අඩුවනවා ඇත. වගා කටයුතු සතුටුදායක තත්ත්වයක පවත්වා ගෙන යා හැකි වන පරිදි නිසි වගා පිළිවෙත් අනුව තම පොල් ඉඩම් නඩත්තු කරන මෙන් ඉඩම් හිමියන්ට උපදෙස් දෙනු ලැබේ.

### 4. රබර් වගාව

පැරණි රබර් ඉඩම් නැවත වගා කිරීම සතුටුදායක ලෙස සිදු කරගෙන යනු ලැබේ. පැළ සැපයීම ද සතුටුදායක විය.

සොරණ රාජ්‍ය වතුයායේදී සුළු ඉඩම් හිමියන්ගේ රබර් කිරි නිෂ්පාදනය තවදුරටත් කරගෙන යනු ලැබේ. සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය අවසානයේ දී, සොරණ රාජ්‍ය වතු යායේ කර්මාන්තශාලාව සුළු ඉඩම් හිමියන්ගේ රබර් කිරි පමණක් නිෂ්පාදනය කරනු ලැබූ අතර, රබර් කිලෝ ග්‍රෑම් 1,000 කට ආසන්න ප්‍රමාණයක් දිනපතා නිෂ්පාදනය කරන ලදි. සුළු ඉඩම් හිමියන්ට ගෙවන ලද මිළ ගණන් ඔවුන් එම රබර් තනි තනිව අළෙවි කළේ නම් ලැබෙන්නට තිබුනු මිළ ගණන් වලට වඩා වැඩි විය. 1987 දී මෙම යෝජනා ක්‍රමය කළුතර දිස්ත්‍රික්කයේ වෙනත් මැතිවරණ කොට්ඨාශ කරා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ. දැනට ඇති එකම ප්‍රශ්නය ප්‍රවාහනයයි. මෙම ප්‍රශ්නය විසඳා ගත හැකි වුවහොත්, කළුතර දිස්ත්‍රික්කයේ සුළු ඉඩම් හිමියන්ගේ රබර් කිරි එක් රැස් කර තෝරාගත් රාජ්‍ය වතුයායන්ට අයත් කර්මාන්තශාලාවල නිෂ්පාදනය කර, කුඩා ඉඩම් හිමියන්ට හොඳ මිළක් ලබා දිය හැක.

### 5. සුළු අපනයන බෝග

1986 දී අතිරේක කාර්ය මණ්ඩල පත් කරන ලදි. ඉතිරි ඇබෑර්තු 1987 දී පුරවනු ලබන බව සැලයි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ගෙවතු වගා ක්‍රමය සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව මගින් අත් හිටුවන ලදි. මෙය සුළු වගා කරුවන් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේ වී නමුදු, ලැබෙන ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව අතිශයින් අධික වූ බැවින්, ගෙවතු වගා පරීක්ෂා කිරීම කළ නොහැකි කාර්යයක් වූ බව දෙපාර්තමේන්තුවේ මතය විය. එබැවින් ගෙවතු වගා කරුවන් සුළු අපනයන බෝග වගා කරන්නේ නම් අවශ්‍ය පැළ ඔවුන් විසින්ම මිළට ගත යුතු වන්නේය.

### 6. සත්ව පාලනය

සමීක්ෂණයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ ආසියානු සංවර්ධන බැංකු වැඩ පිළිවෙල කළුතර සහ කොළඹ දිස්ත්‍රික්ක කරා ව්‍යාප්ත කරන ලදි. දිස්ත්‍රික්ක තුන තුළ කිරි නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති, කුකුළන් ඇති කරන්නන්ගේ සමුපකාර සමිති සහ ඌරන් ඇති කරන්නන්ගේ සමුපකාර සමිති පිහිටුවා තිබේ.

කුකුළු පැටවුන් බෙද දීමද වැඩි දියුණු වී තිබේ. එහෙත් ගොවියන්ගේ අවශ්‍යතා සපුරාලීමට බලය ලත් ආයතනවලට නොහැකි වී ඇත. මෙම තත්ත්වය 1987 යහපත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගම්පහ ඒකාබද්ධ ග්‍රාමසංවර්ධන ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්කය තුළ බිත්තර රකින යන්ත්‍රාගාරයක් පිහිටුවීමට යෝජනා කර ඇත. මෙය ගොවියන්ට බොහෝ සෙයින් ආධාර වනවා ඇත. කුකුළන් බෝකරන ගොවියන්ට මුහුණ පෑමට සිදුවී ඇති තවත් ප්‍රශ්නයක් වනුයේ කුකුළු මස් සඳහා ඔවුනට ඉතා අඩු මිළක් ලැබීමයි. කුකුළු මස් සඳහා පාරිභෝගිකයන්ට ගෙවීමට සිදු වී ඇති අධික මිළ ගොවියන් අතට පත් වන්නේ නැත. මෙය වනාහි සොයා බලා විසඳිය යුතු එක් ප්‍රශ්නයකි.

කිරි දෙනුන් සඳහා බස්නාහිර පළාතේ ඇති ඉල්ලුම බෙහෙවින් අධික වන්නේය. එය එසේ වුවද, එම ඉල්ලුම සපුරාලීමට රජයේ ගොවිපළවලට හැකියාවක් නොමැත. තම කිරි අලෙවි කිරීමේ ප්‍රශ්නයක් කිරි පට්ටි හිමියන්ට නොමැති බැවින් කිරි දෙනුන් සැපයීමෙහි ලා උද වී ඇති මෙම ප්‍රශ්නය ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය යටතේ සලකා බැලීම වඩා සුදුසු වන්නේ ය.

### 7. වාරිමාර්ග

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ යහපත් කාලගුණ තත්ත්වයක් පැවතුන බැවින්, සැලකිය යුතු වාරිමාර්ග වැඩ කොටසක් නිම කරන ලදි. දෙපාර්තමේන්තු දෙක මගින් භාරගෙන ඇති වැඩ සතුටුදායක විය.

ගම්පහ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ I අදියර යටතේ, අත්තනගලු ඔය වාරිමාර්ග යෝජනා ක්‍රමයේ මොරන්න

වාරිමාර්ග යෝජනා ක්‍රමයේ වැඩ ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. මෙම වාරිමාර්ග යෝජනා ක්‍රම දෙක සම්පූර්ණයෙන්ම සංවර්ධනය කිරීමට නියමිතය. මෙම ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ II වන හා III වන අදියරවල වැඩ ආරම්භ කිරීමේදී, මහර මූදුන් ඇළ ජලාපවහන යෝජනා ක්‍රමයද ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

8. පොදු කරුණු

කෘෂිකර්මය හා සම්බන්ධ නිලධාරීන් තුළ විශාල හැඟීමක් මෙන්ම කැපවීමක් පෙනෙන්නට තිබේ. අවබෝධය හා සාමූහික හැඟීම ඉතා අගනේය. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය භාරය බෙහෙවින් පහසුවීමට මෙය හේතු වී ඇත.

නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරුන් හා කෘෂිකාර්මික කළමනාකරුවන් විසින් ඉටුකරන ලද කාර්ය භාරය මවිසින් අගය කරන බැව් මෙහි ලා වාර්තා ගත කිරීමට කැමැත්තෙමි. සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ බස්නාහිර පළාතේ ක්ෂේත්‍ර නිලධාරීන්ට, ප්‍රධාන කාර්යාලයේ විධායක නිලධාරීන්ගෙන් හා සෙසු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය හා අනුග්‍රහය සම්බන්ධයෙන් ඔවුනට ස්තූති කරමි.

මා වෙත පැවරී ඇති වැඩ කටයුතු ඉටු කිරීමෙහි ලා සභාපති තුමාගෙන් ලත් සහායට හා මග පෙන්වීමට එතුමාට මේ අවස්ථාවේදී ස්තූති කිරීම මා සතු යුතුකමක් සේ සලකමි. තවද, සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ මා වෙත පුද කරන ලද සහාය සම්බන්ධයෙන් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, දෙපාර්තමේන්තුවල හා වෙනත් සංවිධානවල කාර්ය මණ්ඩලවලටත් මේ අවස්ථාවේදී ස්තූති කරමි.

ජී. එල්. ඩී මෙල්
පළාත් අධ්‍යක්ෂ — බස්නාහිර පළාත
1987.02.20.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## උතුරු පළාත—වාර්ෂික වාර්තාව—1986

යාපනේ අර්ධද්වීපය හැර උතුරු පළාතේ සෙසු සියලුම මැතිවරණ කොට්ඨාශ දැන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සේවය යටතට පත් කර තිබේ. 1985 දී අධිකාරියේ සේවය යටතට පත් කිරීමට නියමිතව තිබුණු යාපනේ අර්ධද්වීපය, දැන් පවතින අසහනකාරී තත්ත්වය නිසා කල් දමන ලදී. උතුරු පළාතේ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් සම්බන්ධීකරණය කරනු ලබන මැතිවරණ කොට්ඨාශ තුළ ගොවි ජන සේවා මධ්‍යස්ථාන තිස්හතක් පිහිටා තිබේ. මුලතිව් මැතිවරණ කොට්ඨාශයේ උදයර්කට්ටු සහ මන්නාරම මැතිවරණ කොට්ඨාශයේ එරුකලම්පිඩ්ඩි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නව මධ්‍යස්ථාන දෙකකි. මුලතිව් මැතිවරණ කොට්ඨාශයේ කොකුතොඩුවයි ගොවි ජන සේවා මධ්‍යස්ථානය විනාශකර දමා ඇති අතර, දැනට පවතින අසහනකාරී තත්ත්වය හේතුකොටගෙන කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශයේ පිහිටි කිලිනොච්චි ගොවි ජන සේවා මධ්‍යස්ථානය අක්‍රියව පැවතුනි. ගොවියන්ට අවශ්‍ය පොහොර හා කෘෂිරසායන සැපයීමෙහි මෙතෙක් නිරතව තිබුණු ගොවි ජන සේවා මධ්‍යස්ථාන, මෙම පළාතේ පවතින නොසන්සුන් තත්ත්වයන් හේතුකොටගෙන අක්‍රිය තත්ත්වය කට පත්ව තිබීම බෙහෙවින් අධෛර්යමත් කරවන සුලු වේ. ප්‍රවාහන සේවාවන් අඩපණ වීම සහ කෘෂිකාර්මික කම්කරුවන් ප්‍රදේශයෙන් ඉවත්වීම ගොවිතැන් කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ වෙනත් කරුණු විය.

### ආහාර බෝග

#### වී වගාව

1985/86 මහ කන්නයේ උතුරු පළාතේ නිෂ්පාදනය කරන ලද මුළු වී අස්වැන්න ප්‍රමාණය බුසල් දස ලක්ෂ 7.5 ක් විය. මෙය වූ කලී මීට කලින් වර්ෂයේ ලබාගත් බුසල් දස ලක්ෂ 6.9 යේ අස්වැන්නට වඩා බුසල් දස ලක්ශ 0.6 කින් හා 1983/84 මහ කන්නයේ ලබා ගත් බුසල් දස ලක්ෂ 4.2 ක් වූ අස්වැන්නට වඩා බුසල් දස ලක්ෂ 3.3 කින් වැඩිවීමකි. නිෂ්පාදනය වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූ කරුණ වශයෙන් එම කන්නය තුළ පැවති යහපත් කාලගුණ තත්ත්වය සඳහන් කළ හැක.

වැඩිම සාමාන්‍ය අස්වනු ප්‍රමාණය වාර්තා වී ඇත්තේ මන්නාරම දිස්ත්‍රික්කයෙනි. එය 1985/86 මහ කන්නය සඳහා අක්කරයකින් බුසල් 78 කි. 1986 යල කන්නයේදී කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් අක්කරයකින් බුසල් 76.5 ක සාමාන්‍ය අස්වැන්නක් වාර්තා වූ අතර, එය 1982 න් පසු මෙම දිස්ත්‍රික්කයෙන් ලබාගත් දෙවැනි හොඳම සාමාන්‍ය අස්වනු ප්‍රමාණය විය. 1986 යල කන්නයේ උතුරු පළාතේ මුළු වී නිෂ්පාදනය බුසල් දස ලක්ෂ 1.89 ක් විය. මෙය වූ කලී මීට කලින් වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණය වූ බුසල් දස ලක්ෂ 1.12 ට වඩා බුසල් දස ලක්ෂ 0.77 වැඩිවීමකි. මෙහිදී ද නිෂ්පාදනය වැඩිවීමට ප්‍රධාන හේතුව වශයෙන් සඳහන් කළ හැක්කේ එම කන්නය තුළ ඇති වූ යහපත් වර්ෂාපතනයයි. මෙම පළාතට පොහොර සහ වෙනත් කෘෂිකාර්මික යෙදවුම් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් යම් යම් සීමා කිරීම් පනවා තිබුනේ වී නමුදු සතුටුදායක අස්වනු ප්‍රමාණයන් ලබා ගන්නා ලදී.

මෙම වාර්තාව සකස් කරන අවස්ථාව වන විට, අස්වද්ද ඇති අක්කර 2,32,040 ක කුඹුරු ප්‍රමාණයෙන් අක්කර 1,15,295 ක් 1986/87 මහ කන්නයේ වගා කර තිබුණි. වගා කරන ලද කුඹුරු ප්‍රමාණය අඩුවීමට හේතු වශයෙන් පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැක:

(1) දැනට පවතින ජාතිවාදී වියවුල් නිසා ගොවියන් තුළ ඇති අසහනය.

(2) ණය ලබා ගැනීමේ හා බඩු උගසට තබා ණය ලබා ගැනීමේ පහසුකම් නොමැතිවීම.

(3) පසුගිය තෙවස තුළ වන සතුන්ගේ බෝවීම බෙහෙවින් අධික වී ඇති බැවින්, ඔවුන්ගෙන් තම වගාවලට හානි පැමිණීමේ භීතිය.

(4) ප්‍රවාහනය කරන හා ගබඩාකර තබන අතර වාරයේදී තොග නැතිවීමේ භීතිය නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවීන්ට, සහතික කළ බිත්තර වී බෙදා නොදීම හේතුකොට ගෙන, බිත්තර වී ලබා ගැනීමේ දුෂ්කරතාව මෙන්ම අවශ්‍ය බිත්තර වී සඳහා තම තමන් අතර කටයුතු පිළියෙල කරගැනීමට ගොවීන්ට සිදු වේ. එය එසේ වුවද වව්නියා දිස්ත්‍රික්කයේ ගොවියන්ට අවශ්‍ය බිත්තර වී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී.

(5) වගා කටයුතු සඳහා යන වියදම විශේෂයෙන්ම ට්‍රැක්ටර් කුලිය අධිකවීම, වගා කටයුතු වලින් ගොවීන් ඈත් කිරීමට තවත් හේතුවක් විය.

පසුගිය කන්න කීපය තුළ උතුරු පළාතේ නිෂ්පාදන වියදම, විශේෂයෙන්ම කම්කරු හා ට්‍රැක්ටර් කුළිය, සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී තිබේ. ට්‍රැක්ටර් කුලිය වැඩිවීමට මූලික හේතුව වූයේ ඩීසල් හිඟයයි. මන්නාරම් දිස්ත්‍රික්කය තුළ ප්‍රවර්තන මහ කන්නයේදී ගොයම් අක්කරයක්සඳහා නිෂ්පාදන වියදම මඩ කුඹුරු සම්බන්ධයෙන් රු. 6,500/- පමණවන අතර මීට අවුරුදු තුනකට පෙර එය රු. 4,500/- විය. ඒ ආකාරයෙන්ම, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගොයම් අක්කරයක් සඳහා නිෂ්පාදන වියදම ගොඩ කුඹුරු සඳහා ප්‍රවර්තන කන්නයේදී රු. 5,000/- වන අතර අවුරුදු තුනකට පෙර එය රු. 3,500/- ක් විය.

බිත්තර වී සම්බන්ධයෙන්, පසුගිය කන්න කීපය තුළ, තම තමන්ගේම බිත්තර වී පාවිච්චි කිරීමට ගොවියන්ට සිදුවූ අතර, එම බිත්තර වී තරමක් මිශ්‍රවී තිබුණි. ආරක්ෂක හේතූන් මත බිත්තර වී අවශ්‍යතා සපුරාලීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අපොහොසත් විය. වැඩි අස්වැන්නක් ලබා දෙන නිසාත්, එහි ඇති වැඩි රසවත් බව නිසාත්, මන්නාරම දිස්ත්‍රික්කය තුළ මාස 4 1/2 බීජී 11–11 වී විශේෂය ජනප්‍රිය වී තිබේ. කොටසකට පමණක් සීමා වීම හේතුකොට ගෙන, මෙම විශේෂ වී වර්ගයේ මූලික බිත්තර වී නිෂ්පාදනය කිරීමේ ප්‍රශ්නයට දැන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මුහුණ පා සිටින බව දැනගන්නට ලැබී ඇත. දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති අළුත් වී වර්ගයක් වන බීජී 450 ඒ සඳහා ආදේශයක් වශයෙන් යොදගත හැකි වෙනත් වී වර්ගයක් විය හැක.

මීට කලින් දෙවස තුළ මෙන් නොව, 1986/87 මහ කන්නය තුළ වර්ෂාපතනය අල්ප විය. ඊසාන දිග මෝසම් වැසි නොලැබීම හේතුකොටගෙන අස්වැන්න අසාර්ථක වීමක් අපේක්ෂා කළ හැක. මන්නාරම දිස්ත්‍රික්කයේ වගා කරන ලද අක්කර 34,314 න්, නියඟ හේතුකොටගෙන දැනටමත් අක්කර 10,941 ක් හානි වී තිබේ. ඒ ආකාරයෙන් වව්නියා දිස්ත්‍රික්කයේ වගා කරන ලද අක්කර 15,728 න් අක්කර 5,762 ක් හානි වී තිබේ. කිලිනොච්චි දිස්ත්‍රික්ක ගොවියන් වගා කාල සටහනට අනුකූලව ක්‍රියාකර ඇති බැවින්, කිසිදු හානියකින් තොරව මුළු වගා ප්‍රමාණයම ආරක්ෂා වීමට ඉඩ තිබේ. මෙම වාර්තාව සකස් කරන අවස්ථාවේ යෝධ වැවේ ජල මට්ටම අඩි 4 දක්වා අඩු වී තිබුණි. එහි අවම ජල මට්ටම අඩි 3 කි. මල්වතු ඔයෙන්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## උතුරු පළාත—වාර්ෂික වාර්තාව—1986

යෝධ වැවට ජලය ගලා ඒම මුළුමනින්ම වාගේ නතර වී ඇති අතර, යෝධ වැවෙන් පෝෂණය වන මුළු ඉඩම් ප්‍රමාණයම අනතුරුදායක තත්ත්වයකට පත් වී තිබේ. ඩීසල් ලීටරයක මිළ රු. 20/- ක්ව තිබියදීත් තම වගාවන් බේරා ගැනීමේ අටියෙන් ගොවීහු තම නළ ළිංවලින් ජලය පොම්ප කරති.

### අතිරේක ආහාර බෝග

අතිරේක ආහාර බෝග වගා ක්ෂේත්‍රයෙහි ලා ලබා ඇති ප්‍රගතිය කිසිසේත් ලගන්නා සුලු නොවේ. මිරිස්, රතු ලූනු සහ රට කජු වගා කළ බිම් ප්‍රමාණයේ අඩුවීමක් වාර්තා විය. ජාති වාදී කෝලාහල නිසා ගොවියන් අතර පැවති අසහනකාරී තත්ත්වයන්, උත්ථාන වාරිමාර්ග කටයුතු සඳහා ඉන්ධන හිඟ වීමත්, මුදල් දුෂ්කරතා ඇතිවීමත්, වගා කරන බිම් ප්‍රමාණය අඩු වීමට හේතු වූ සාධක විය. වර්ෂාවෙන් පෝෂණය වන තත්ත්වයන් යටතේ කරනු ලබන වගාවක් වන, වව්නියා දිස්ත්‍රික්කයේ උඳු වණාව සඳහා යොදගත් බිම් ප්‍රමාණයේ සුළු වැඩිවීමක් වාර්තා විය. උඳු වගා කළ බිම් ප්‍රමාණය අක්කර 11,362 ක් වූ අතර, පසුගිය වසරේදී එය අක්කර 7,800 ක් විය.

### පොල්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පොල් කර්මාන්තයේ සාමන්තික නොහොත් අකර්මන්‍ය වර්ධනයක් දකින්ට ලැබුණි. නඩත්තු කිරීමේ වියදම අධිකවීම හේතුකොටගෙන ඉඩම් හිමියන් බොහෝ දෙනෙක් තම වගාවන් නොසලකා හැර තිබුණු බැවින්, දැනට වගා කර ඇති ඉඩම් නඩත්තු කිරීම ඉතා පහත් මට්ටමක පැවතුනි. උතුරු පළාතේ දැනට ඇති කිසිම තවානක පොල් පැල වගා නොකරන ලදි. ඊට හේතු වූයේ බන්ඩිරිප්පුව පර්යේෂණ ආයතනයේ සිට අලම්පිල් හා කිලි-නොච්චිහි පිහිටි තවාන් කරා බීජ පොල් ප්‍රවාහනය කිරීමෙහි ලා දුෂ්කරතා පැවතීමයි. ගොවියන්ගේ පොල් පැළ අවශ්‍යතා පෞද්ගලික- තවාන් මගින් සපුරාලනු ලැබීය. පෞද්ගලික තවාන් මගින් බෙද දෙන ලද පොල් පැළ පහත් තත්ත්වයක පැවති බැව් පෙනී ගියේය.

### පොහොර සහ කෘෂි රසායන

උතුරු පළාතේ දිස්ත්‍රික්ක තුළ පිහිටා ඇති පොහොර ගබඩා පසුගිය වර්ෂයේ මැද භාගයේදී ලංකා පොහොර සංස්ථාව විසින් පෞද්ගලික අංශයට භාර දෙන ලදි. උතුරු පළාතේ දිස්ත්‍රික් කවල පොහොර අවශ්‍යතා මෙම පෞද්ගලික සංවිධාන මගින් සපුරා ඇති අතර, දිස්ත්‍රික්ක වලින් ලැබුණු තොරතුරු අනුව සැපයුම් තත්ත්වය සතුටුදායක වූ බැව් පෙනේ. කිසිදු පැමිණිල්-ලක් ගැන වාර්තා වී නොමැත.

ගම්මට්ටමෙන් පොහොර බෙද දීම සම්බන්ධයෙන් සඳහන් කළ යුතුව ඇත්තේ, ආරක්ෂක හේතූන් නිසාත්, පෞද්ගලික බෙද හරින්නන් විසින් ණය පහසුකම් සලසා නොතිබුණු නිසාත් ගොවි ජන සේවා මධ්‍යස්ථාන මගින් පොහොර අලෙවි නොකළ බවයි. දිස්ත්‍රික්කවල ස්ථාන තුනක හෝ හතරක, පෞද්ගලික බෙදහරින්නන් විසින් නියෝජිතයන් පත් කර සිටි අතර, පොහොර මල්ලක් සඳහා වැඩිපුර රු. 5/- නොහොත් රු. 10/- ගෙවා එම නියෝජිතයන්ගෙන් පොහොර ලබා ගැනීමට ගොවියන්ට සිදුවිය. ඒ අනුව, අතිරේක ප්‍රවාහන ගාස්තුව පමණක් ගෙවීමට ඔවුන්ට සිදු විය.

කෘෂි රසායන සම්බන්ධයෙන් කිසිදු හිඟයක් ගැන වාර්තා නොවූ අතර, එම ද්‍රව්‍ය පිළිගත් සමාගම්වල නියෝජිතයන් මගින් වෙළෙඳපොළෙන් ලබාගත හැකි විය. ගොවි ජන සේවා මධ්‍යස්ථාන මගින් ද, තම තමන් වෙත ඇති ප්‍රමාණයන් බෙද දෙන ලදි.

### කිරි පට්ටි පාලනය

පශු සම්පත් කර්මාන්තය සම්බන්ධයෙන් ලබා ඇත්තේ මන්දගාමී ප්‍රගතියකි. උසස් තත්ත්වයේ ගවයන් නොමැතිවීම, මෙම කර්මාන්තය සංවර්ධනය කිරීමෙහිලා මුහුණ පෑමට සිදුවූ ප්‍රධාන බාධකය විය.

බැංකු ණය යෝජනා ක්‍රමයක් මත හෝ අත්පිට මුදලට හෝ, කිරි නිෂ්පාදනය සඳහා සහ බර ඇදීම සඳහා එක පවුලකට ගවයන් දෙදෙනෙක් බෙද දීමේ යෝජනා ක්‍රමයක් දියත් කර තිබේ. ඒකාබද්ධ කළ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නවීන තාක්ෂණ ක්‍රම උපයෝගී කරගෙන දැනට සිටින ගව පට්ටිවල තත්ත්වය උසස් කිරීමට ද අපේක්ෂා කෙරේ.

### වාරිමාර්ග

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ඇති උතුරු පළාතේ දිස්ත්‍රික්ක හතර තුළ පිහිටි සුළු වාරිමාර්ග වැඩ සඳහා රු. 25,23,236/- ක් සහ මහ පරිමාණයේ වාරිමාර්ග වැඩ සඳහා රු. 23,818,023/-ක් වැය කරන ලදි. ඒකාබද්ධ කළ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය, මහ පරිමාණයේ වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය හා දෙපාර්තමේන්තුවේ වෙන් කළ මුදල් මේ සඳහා මුදල් ලබාගත් ප්‍රධාන ව්‍යාපෘති විය. මහ පරිමාණයේ වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉරනමඩුවේ සහ මන්නාරම දිස්ත්‍රික්කයේ යෝධ වැවේ වැඩ දැන් කෙරීගෙන යයි.

වාරිමාර්ග වැව් පුනරුත්ථාපනය කිරීම සඳහා වර්ෂය තුළ වෙන් කරන ලද මුදල් සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවීම අවාසනාවන්ත සිදුවීමකි. ග්‍රාමීය වාරිමාර්ග පුන-රුත්ථාපන ව්‍යාපෘතිය සහ ඒකාබද්ධ කළ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වූ වැඩ කටයුතු දැන් පවත්නා ආරක්ෂක තත්ත්වය මත වර්ෂය මැද අත්හිටුවීම, ගොවියන් තුළ පැවති උද්යෝගය හා දැඩි උනන්දුව බෙහෙවින් අඩපණ කිරීමට හේතු විය. එතකුදු වුවත්, පළාත තුළ විශේෂ ව්‍යාපෘති මගින් ඵලදායක ජල පාලන වැඩ සටහන් ඇති කිරීමට සෑම උත්සාහ-යක්ම ගනු ලැබේ.

### ජනපද යෝජනා ක්‍රම

වව්නියා මැතිවරණ කොට්ඨාශයේ පාවත්කුලම් ජනපද යෝජනා ක්‍රමය අතහැර ගිය ගොවියන් සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ රජයෙන් ලැබුණු සහාය යටතේ නැවත පදිංචි කරවන ලදි. මෙම ගොවියන්ට තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ආහාර සලාක සහ වගා කටයුතු සඳහා මුදල් ආධාර දෙන ලදි. මේ ආකාරයෙන්ම, මහත්තන් කුලම් ජනපද යෝජනා ක්‍රමය අත්හැර ගිය ගොවියෝ ද තම ජනපදවලට ආපසු පැමිණෙමින් සිටිති.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## උතුරු පළාත—වාර්ෂික වාර්තාව—1986

**සාමාන්‍ය කරුණු**

අඩු වර්ෂාපතනය, නිතර පවතින නියඟය සහ වගාවන් විනාශ කරමින් වරින් වර ඇතිවන ජල ගැලීම් නිසා උතුරු පළාතේ ජීවිතය නිතරම දුෂ්කර කාර්යයක් වී තිබේ. වියළි කලාප යේ ගොවියා ජීවත්වන්නේ දුෂ්කර තත්ත්වයන් යටතේ ය. ඊට අමතරව, දැනට පවතින ජාති වාදී වියවුල් නිසා ගොවියෝ, ආරක්ෂා රහිත භාවයකට, අස්ථිර තත්ත්වයකට හා අනේක දුෂ්කරතාවලට මැදිවී සිටිති.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින්, ලබා ගත හැකි සම්පත් යොදා ගනිමින් තම තමන්ට හැකි ප්‍රමාණයෙන් වගා කටයුතු කරගෙන යෑම සඳහා ග්‍රාමීය ගොවියන්ට හැකි හැම ආධාරයක්ම දෙන ලදී. වගා කරන ලද කුඹුරු ඉඩම්වලින් අඩකට වැඩි ප්‍රමාණයක් විනාශ වී යෑමේ ලකුණු පහළ වී ඇති බැවින්, සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ වැස්ස වලාහක දෙවියෝ ද උතුරු පළාතට අකාරුණික වී තිබේ.

අවසාන වශයෙන්, මගේ යුතුකම් නිසි පරිදි ඉටු කිරීමෙහි ලා සභාපතිතුමාගෙන් ලැබුණු අගනා උපදෙස් හා දිරි ගැන්වීම අවංකව අගය කොට සලකමි.

අයි. එම්. වෙදනායගම්
පළාත් අධ්‍යක්ෂ — උතුරු පළාත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සබරගමුව පළාත—වාර්ෂික වාර්තාව—1986

**1. සාමාන්‍ය කරුණු**

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉතිරි මැතිවරණ කොට්ඨාශ හතර සඳහා ද, කෘෂිකාර්මික කළමනාකරුවන් පත් කිරීමෙන් එම මැතිවරණ කොට්ඨාශ ද මෙම අධිකාරිය යටතට පත් කරන ලදි. ඒ සමගම, දැන් මුළු සබරගමු පළාතම කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණයට පාත්‍රවී ඇත. සභාපතිතුමා විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ 9 තුළම චාරිකා කරන ලදි.

**2. ගොවි ජන සේවා මධ්‍යස්ථාන**

රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්නේ මැතිවරණ කොට්ඨාශය තුළ නව ගොවි ජන සේවා මධ්‍යස්ථානයක් විවෘත කිරීමෙන් මෙම දිස්ත්‍රික්කයේ ඇති ගොවි ජන සේවා සංඛ්‍යාව තවදුරටත් වැඩි කරන ලදි. එම මැතිවරණ කොට්ඨාශය තුළ තවත් මධ්‍යස්ථානයක් දැනට ඉදිවෙමින් පවතී. වර්ෂ 1987 දී රක්වාන මැතිවරණ කොට්ඨාශය තුළ නව ගොවි ජන සේවා මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා විමධ්‍යගත අය වැය යටතේ අනුකූල මුදල් කොටස වෙන් කර තිබේ. මේ සියල්ලම කරන ලද්දේ සභාපතිතුමා විසින් තම මැතිවරණ කොට්ඨාශ චාරිකාවලදී කරන ලද නිර්දේශ අනුවය. තම ප්‍රාදේශීය නිලධාරීන් සඳහා විශේෂයෙන්ම දුෂ්කර පළාත්වල, නිවාස සැපයීමේ, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ වැඩ සටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ නිල නිවාස 4 ක් ඉදි කරන ලදි.

මෙම කමිටු එක්තරා ප්‍රමාණයක කාර්යක්ෂමතාවයකින් ක්‍රියාකර තිබේ. මධ්‍යස්ථාන සතුටුදායක ලෙස පවත්වාගෙන යනු ලැබූ අතර, අවට පරිසරය නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම සඳහා පියවර ගෙන තිබේ.

අක්කර බදු සම්බන්ධයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ සුළු ප්‍රගතියක් ලබා තිබුණු අතර, රත්නපුර දිස්ත්‍රික්කය පැහැදිලි අඩුවීමක් පෙන්නුම් කළේය.

**3. ආහාර බෝග**

(අ) වී අස්වැන්න/අක්කරයකින්/බුසල්

| කන්නය | දිවයින | කෑගල්ල | රත්නපුරය | උඩවලවෙ |
|---|---|---|---|---|
| 1984 යල ... ... ... | 61.02 | 59.71 | 49.47 | 64.74 |
| 1984/85 මහ ... ... ... | 67.84 | 69.55 | 61.13 | 89.76 |
| 1985 යල ... ... ... | 64.83 | 67.34 | 55.11 | 74.84 |
| 1985/86 මහ ... ... ... | 69.54 | 68.62 | 64.01 | 98.77 |
| 1986 යල ... ... ... | 63.76 | 55.45 | 55.95 | 80.72 |

කෑගල්ල දිස්ත්‍රික්කයේ යල සහ මහ යන කන්න දෙකේම වගා කටයුතුවලට පෙර නොවූ විරූ නියඟයකින් හානි පැමිණියේය. යල කන්නය, කන්න පහකින් අඩුම අස්වැන්නක් ලැබූ කන්නය වූ අතර, මහ කන්නයේ අස්වැන්න ප්‍රමාණයද අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය අක්කරයකින් බුසල් 58/60 පමණ වනු ඇතැයි සිතිය හැක. යල හා මහ යන කන්න දෙකේදී මුළුමනින්ම නොහොත් අඩ වශයෙන් හානි වූ කුඹුරු ප්‍රමාණය පිළිවෙලින් අක්කර 1,700 ක් හා, 1,800 ක් වශයෙන් ගණන් බලා ඇත.

රත්නපුර දිස්ත්‍රික්කයේ වගා කටයුතුවලට කාලගුණ විපර්යාස වලින් එතරම් හානි සිදු නොවූ අතර, කලින් වසරේ යල කන්නය හා සසඳා බැලීමේදී මෙම යල කන්නයේ වඩා වැඩි අස්වැන්නක් ලබා ඇති බැව් පෙනේ. එම කන්නය තුළ බීජී 94/1 විශාල ප්‍රමාණයක් නිකුත් කිරීම මෙම අස්වනු වැඩිවීමට හේතුවී යැයි සැලකිය හැක.

පැළ සිටුවීමේ යන්ත්‍ර දිස්ත්‍රික්ක දෙක තුළම බෙද දෙනු ලැබූ අතර, ප්‍රදර්ශන හා පුහුණු කිරීමේ පන්ති පවත්වන ලදි. කෑගල්ල දිස්ත්‍රික්කය මෙන් නොව, නැවත පැළ සිටවනු ලබන අක්කර ප්‍රමාණය අඩු රත්නපුර දිස්ත්‍රික්කයේ මෙම යන්ත්‍රය උපයෝගී කරගෙන අක්කර 800 පමණ නැවත පැළ සිටුවා තිබේ. මෙය ජයග්‍රහණයක් සේ සැලකිය හැක. ඒකාබද්ධ කළ පළිබෝධ පාලන ක්‍රම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ. කුඹුරුයාය රාශියකදීම ප්‍රදර්ශන පවත්වා ඇති අතර, මෙම ක්‍රමයේ ඇති වැදගත්කම පිළිබඳව කෘෂිකාර්මික අංශයේ නිලධාරීන්ට කරුණු පැහැදිලි කර දී තිබේ. මෙම අංශයෙහි ලා කෑගල්ල දිස්ත්‍රික්කය වැඩි ප්‍රගතියක් ලබා ඇති අතර, 1984 හා සසඳා බැලීමේදී 1986 වර්ෂයේ රසායන ද්‍රව්‍ය අලෙවිය අඩකින් අඩුවී ඇති බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද සමීක්ෂණයකදී අනාවරණය විය.

**(ආ) වෙනත් ක්ෂේත්‍ර බෝග**

රතු ලූනු වගා කරන ලද අක්කර ප්‍රමාණය 1986/87 මහ කන්නයේදී තවදුරටත් වැඩි වූ අතර, කොළොන්නේ සහ රක්වාන මැතිවරණ කොට්ඨාශ තුළ අක්කර 2,900 ක් පමණ බිම් ප්‍රමාණයක රතුලූනු වගා කර තිබුණි. බීජ හා පොහොර නියමිත වේලාවට ලබා දෙන ලදි. ස.තො.ස. මගින් ඇඹිලිපිටියේ ස්ථිර කාර්යාලයක් පිහිටුවා රතු ලූනු මිළට ගැනීම සඳහා එම ආයතනයේ වාහන යොදවා තිබුණු අතර, එය ගොවියන්ට තම නිෂ්පාදන අලෙවිකර ගැනීමටත්, මිළ ගණන් ස්ථාවරව තබමක

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සබරගමුව පළාත—වාර්ෂික වාර්තාව—1986

පවත්වා ගැනීමටත් ආධාර විය. තම නිෂ්පාදන සඳහා ගොවියන්ට කිලෝ ග්‍රෑමයකට රු. 8.00 හා රු. 10.00 අතර මිළක් ලැබුණි. මහ කන්නයේදී අක්කර 5,000 ක පමණ මුං ඇට වගා කරන ලදී. රාජ්‍ය බැංකු මගින් වගා කරුවන්ට මුදල් සපයා දෙනු ලැබූ අතර, දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1.5 ක් විය. ණය මුදල් ආපසු ලබා ගැනීම දිරිගන්වන සුලු වූයේය. රතු ලූනු වගාකරුවන් වෙනුවෙන් රක්ෂණ යෝජනා ක්‍රමයක් සකස් කරන මෙන් කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලයෙන් ඉල්ලා ඇති අතර, අදාල යෝජනා සකස් කර අනුමත කිරීම සඳහා මණ්ඩලය විසින් තම ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබේ.

කොළොන්නේ විදේශීය එළවළු වගාකරුවන්ට අවශ්‍ය සේවා හා යෙදවුම් සපයා දෙන ලදී. විශේෂයෙන්ම රක්වාන සහ මාවනැල්ල මැතිවරණ කොට්ඨාශවල වාරිමාර්ග ජල පහසුකම් ප්‍රමාණවත් නොවූ කුඹුරු, බතල වගාව සඳහා ගොවියන් විසින් යොදගනු ලැබූ අතර එම වගාවලින් සතුටුදයක ලාභ ලබාගත් බව දැනගන්නට ලැබුණි.

4. රුක් වගා

(අ) රබර් (අක්කර)

| | නැවත වගා කිරීම් | අළුත් වගාවන් |
|---|---|---|
| කෑගල්ල දිස්ත්‍රික්කය ... | 2,895 | 969 |
| රත්නපුර දිස්ත්‍රික්කය ... | 1,244 | 762 |

මෙම වගාව සඳහා යොදගෙන ඇති ඉඩම් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වී ඇති අතර, පැළ දශ ලක්ෂයකට අධික ප්‍රමාණයක් බෙදදී තිබේ. අවසාන නිෂ්පාදනයේ තත්ත්වය උසස් කිරීමේ අරමුණ ඇතිව, කණ්ඩායම් වශයෙන් රබර් සකස් කිරීමේ නව මධ්‍යස්ථාන 10 ක් පිහිටුවනු ලදී. උපදේශක සේවා අංශය මගින් ව්‍යාදර්ශන හා පුහුණු කිරීම් පවත්වනු ලැබූ අතර, තම ලියා පදිංචි නොකළ ඉඩම් ලියාපදිංචි කරන ලෙස ගොවීන් උනන්දු කරවන ලදී. රත්නපුර දිස්ත්‍රික්කයේ කරපිංච හි පිහිටුවා ඇති රබර් පර්යේෂණ මණ්ඩලයේ තවානෙන් ප්‍රථම වරට පැළ 30,000 ක් නිකුත් කරන ලදී. කල්යත්ම මෙම තවාන අක්කර 28 ප්‍රමාණයකට ව්‍යාප්ත කරනු ලැබේ.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ ඉල්ලීමක් අනුව වතු සංවර්ධන මණ්ඩලය විසින් තම සේවාවන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත කරන ලද අතර, සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ ප්‍රදාන හා සහනාධාර වශයෙන් කුඩා වතු හිමියන්ට රු. 100,000 ක පමණ ආධාර ලබා දෙන ලදී.

(ආ) තේ

රත්නපුර දිස්ත්‍රික්කයේ සැලකිය යුතු බිම් ප්‍රමාණයක අළුතෙන් තේ වගාකර ඇති අතර, ඊට අඩු බිම් ප්‍රමාණයක කෑගල්ල දිස්ත්‍රික්කයේ අළුතෙන් තේ වගාකර තිබේ. සහනාධාර යටතේ හිස්තැන් පිරවීම සැලකිය යුතු ඉඩම් ප්‍රශ්නයක් තුළ සිදුකර තිබේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති නිලධාරීන් සංඛ්‍යාව ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ උපදෙස් පරිදි වැඩි කරන ලදී. හිඟුලේ පිහිටි කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තවාන ව්‍යාප්ත කර සංවර්ධනය කරන ලදී. ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ මුදල් යොද දූරණියගල මැතිවරණ කොට්ඨාශය තුළ තවත් කුඩා පරිමාණයේ තවානක් පිහිටුවීමට නියමිතව ඇත.

මෙම වර්ෂය තුළ කුඩා තේ වතු හිමියන්ට අවාසිදයක ලෙස අඩු මිළ ගණන් ලැබුණු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් පහත් තත්ත්වයේ වගා ක්‍රම හා කළමනාකරණ විධි යොද ගන්නා ලදී. ආර්ථික වශයෙන් ලාභදයක නොවීමේ හේතුව මත හිඟුලේ පිහිටි කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අයත් කර්මාන්ත ශාලාව වසා දමන ලදී. එහෙත් රත්දෙල හා නව පනන්වැන්නේ පිහිටි කර්මාන්තශාලා කුඩා තේ වතු හිමියන්ට සහාය වීම සඳහා පවත්වාගෙන යන ලදී.

පොල්/සුළු අපනයන බෝග

කෘෂිකාර්මික සංවර්ධන මණ්ඩලය, එහි වැඩ සටහන් මගින්, පොල් වගා මණ්ඩලයටත් සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවටත් තවදුරටත් සහාය විය. මෙම වර්ෂය තුළ අක්කර 545 ක් අළුතෙන් පොල් වගා කරන ලද අතර අක්කර 342 ක නැවත වගා කරන ලදී. අතුරු බෝග වශයෙන් අක්කර 188 ක ගම්මිරිස්, අක්කර 32 ක කෝපි සහ අක්කර 10 ක කොකෝවා වගා කරන ලදී. ඒ සඳහා රෝපණ ද්‍රව්‍ය ලබා ගන්නා ලද්දේ දිස්ත්‍රික්ක තුළ පිහිටා ඇති පොල් වගා මණ්ඩලයට අයත් තවාන් වලිනි.

ආසියානු සංවර්ධන බැංකුවේ මුදල් යොදවා ඇති විශේෂ ව්‍යාපෘතිය යටතේ රඹුක්කන අක්කර 31 දෙමුහුන් පොල් වගා කරන ලදී.

5. සත්ත්ව පාලනය

ආසියානු සංවර්ධන බැංකුව මගින් මුදල් යොදවා ඇති පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූලික පහසුකම් සහ සේවාවන් වැඩිදියුණු කරන ලදී. පශු සම්පත් නිෂ්පාදකයන්ගේ සමිති පිහිටුවා ඇති අතර, එම සමිති මනාව ක්‍රියාත්මක වෙමින් පවතී. එය එසේ වන නමුදු, පශු වෛද්‍යවරුන්ගේ හිඟය තවදුරටත් එලෙසම පවතී. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සපයා දෙනු ලබන ආයතනික සහාය අසතුටුදයක තත්ත්වයක පවතින රත්නපුර දිස්ත්‍රික්කය ආසියානු සංවර්ධන බැංකුව යටතට පත් කළ යුතු වේ.

6. වාරිමාර්ග

රත්නපුර දිස්ත්‍රික්කයේ සැලකිය යුතු වැඩ කොටසක් ඉටුකර ඇති අතර, වාරිමාර්ග පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ විස්සකට ආසන්න මුදලක් ඒ සඳහා වැය කරන ලදී. මෙම මුදල් ප්‍රමාණයෙන් වැඩි කොටසක් ලැබී ඇත්තේ ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන වැඩ පිළිවෙල යටතේය. මෙහි ලා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විශාල වශයෙන් දයක වී ඇති අතර, එම දෙපාර්තමේන්තුවේ වැඩ ප්‍රශංසා කළ යුතු වේ. එහෙත්, කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද (ආසන්න වශයෙන්) රුපියල් දශ ලක්ෂ තුනක් වූ මුදල සම්පූර්ණයෙන් උපයෝගී කර ගත නොහැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වෙන් කරන ලද මුදල් වලින් කොටසක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ආපසු ගන්නා ලදී. මුහුණ දීමට සිදුවූ දුෂ්කරතා හඳුනාගෙන, එවැනි තත්ත්වයන් නැවතත් උදවීම මගහරවා ගැනීම සඳහා පියවර ගන්නා ලදී. කෑගල්ල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පුනරුත්ථාපනය සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කළ යුතු වන අතර, ඒ අරමුණ

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සබරගමුව පළාත—වාර්ෂික වාර්තාව—1986

ඇතිව, විමධ්‍යගත අයවැය යටතේ සැලකිය යුතු මුදල් ප්‍රමාණ මේ සඳහා වෙන් කර දෙන මෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගෙන් ඉල්ලා ඇත.

7. පොහොර

ප්‍රමාණවත් පොහොර තොග දිස්ත්‍රික් ගබඩාවල පවත්වාගෙන යනු ලැබූ අතර, පොහොර හිඟවීම් පිළිබඳ කිසිදු වාර්තාවක් නොලැබුණි. තත්ත්වයෙන් බාල පොහොර මිශ්‍රණ පිළිබඳ පැමිණිලි ලැබුණු සෑම අවස්ථාවකදීම සුදුසු පියවර ගන්නා ලදි. ඒකාබද්ධ කළ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවල සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මුදල් යොදවා ටොන් 10 හා 20 ගබඩා පිහිටුවීමෙන් දිස්ත්‍රික්ක දෙකේ පොහොර බෙදා හැරීම තවදුරටත් ශක්තිමත් කරන ලදි.

8. සමාප්තිය

දුෂ්කර කාර්යයක් පහසු කිරීමෙහිලා දිසා ඇමතිවරුන්ගෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්, දිසාපතිවරුන්ගෙන් සහ අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් ලැබුණු සහයෝගය ගැන අප අපගේ කෘතඥතාව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. සභාපතිතුමාගෙන් ලැබුණු දිරි ගැන්වීම හා මග පෙන්වීම ගැන එතුමාට කෘතඥතාව පළ කරමි.

ආනන්ද පරතිණ
පළාත් අධ්‍යක්ෂ — සබරගමුව.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## නැගෙනහිර පළාත—වාර්ෂික වාර්තාව—1986

### 1. හැඳින්වීම

අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් තවදුරටත් සම්බන්ධීකරණය කරන ලදි. යල සහ මහ කන්නයේදී වගා කරනු ලැබූ ප්‍රධාන බෝග වූයේ වී සහ උක් ය.

තවදුරටත් පැවති ත්‍රස්තවාදී කටයුතු හේතුකොටගෙන, රජයේ දෙපාර්තමේන්තුවල සහ වෙනත් සංවිධානවල වැඩ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යෑම අවහිර විය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මෙම පළාතේ නිෂ්පාදන අංශ ගණනාවක වැඩ කටයුතු කෙරෙහි මෙය සැලකිය යුතු ප්‍රමාණයකින් බල පෑවේය.

### 2. ගොවි ජන සේවා මධ්‍යස්ථාන

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා විසින් කරන ලද නිර්දේශ අනුව අම්පාර දිස්ත්‍රික්කයේ කෝමාරි හා මඩනාගමත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වාන් ඇලත් නව ගොවි ජන සේවා මධ්‍යස්ථාන තුනක් ඉදිකරන ලදි.

ත්‍රස්තවාදීන් විසින් සොරකම් කිරීම, ගිනි තැබීම් නොහොත් විනාශ කිරීම හේතුකොට ගෙන ගොවි ජන සේවා මධ්‍යස්ථාන වැඩි සංඛ්‍යාවක් තවදුරටත් වසා තබන ලද අතර, ප්‍රදේශයේ දැනට පවතින අසහනකාරී තත්ත්වය හේතුකොටගෙන, ආරක්ෂක කටයුතු සඳහා ඇතැම් මධ්‍යස්ථාන හමුදාව විසින් අත්පත් කර ගන්නා ලදි.

### 3. වී

1985/86 මහ කන්නයේ සහ 1986 යල කන්නයේ වී නිෂ්පාදනය පිළිවෙලින් බුසල් දශ ලක්ෂ 11.9 ක් සහ දශ ලක්ෂ 11.2 ක් විය.

1985/86 මහ කන්නයේ සහ 1986 යල කන්නයේ වී වගාවෙන් අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලින් ලබාගත් සාමාන්‍ය අස්වනු ප්‍රමාණයන් පිළිවෙලින් අක්කරයකින් බුසල් 63.75, 50.61, 66.63 සහ 80.15, 70.17, 72.48 ක් විය. දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනයේ සාමාන්‍ය, මහ කන්නයේදී ජාතික සාමාන්‍ය වූ අක්කරයකින් බුසල් 69.54 ට වඩා අඩුවූ අතර, යල කන්නයේදී ජාතික සාමාන්‍ය වූ අක්කරයකින් බුසල් 63.76ට වඩා වැඩි විය.

යෙදවුම් අඩුවෙන් සැපයීම සහ ප්‍රවාහන හා අලෙවි දුෂ්කරතා හේතුකොට ගෙන පළාතේ වගා කරන ලද අක්කර ප්‍රමාණයේ අඩු වීමක් ඇති විය. දැන් පවත්නා ජාති වාදී අසහනකාරී තත්ත්වයන් හේතුකොටගෙන, වර්ෂය තුළ මඩකලපුව දිස්ත්‍රික්කයේ ''කරදියන් ආරු'' සහ අම්පාර දිස්ත්‍රික්කයේ 'මල් වත්ත' යන ප්‍රධාන වී ගොවිපළවල් දෙක ක්‍රියාත්මක නොවීය. කන්තලේ වැව් බැම්ම බිඳී යාම හේතුකොට ගෙන වාරිමාර්ග පහසුකම් නොමැතිවීම නිසා ත්‍රිකුණාමලයේ කන්තලේ වී ගොවිපළේ වැඩ කටයුතු අවහිර විය.

යල හා මහ කන්නයේදී වගා කරන ලද අක්කර ප්‍රමාණයන් හා ලබාගත් අස්වනු ප්‍රමාණයන් පහත සඳහන් වේ:

| දිස්ත්‍රික්කය | 1986 යල (අක්කර) | 1986/87 මහ 86.12.31 දිනට අක්කර |
|---|---|---|
| අම්පාර ... ... | 1,07,464 | 1,17,131 |
| මඩකලපුව ... ... | 35,230 | 76,200 |
| ත්‍රිකුණාමලය ... ... | 12,895 | 20,600 |
| | 1,55,589 | 2,13,931 |

| දිස්ත්‍රික්කය | 1985/86 මහ අස්වැන්න අක්කර/බුසල් | නිෂ්පාදනය බුසල් | 1986 යල අස්වැන්න අක්කර/බුසල් | නිෂ්පාදනය බුසල් |
|---|---|---|---|---|
| අම්පාර ... ... ... | 63.75 | 6,471,000 | 80.15 | 8,199,000 |
| මඩකලපුව ... ... | 50.61 | 2,957,000 | 70.17 | 2,156,000 |
| ත්‍රිකුණාමලය ... ... | 66.63 | 2,449,000 | 72.48 | 866,000 |

(මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

### 4. උක් වගාව

පැලවත්ත හා සෙවනගල ව්‍යාපෘතිවල බලපෑම හේතුකොට ගෙන දැන්, උක් වගාකරුවෝ තම වගාවන් කෙරෙහි වැඩි උනන්දුවක් දක්වති.

මෙම වර්ෂය තුළ, හිඟුරාන හා කන්තලේ පිහිටි ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයට අයත් වගාවේ උක් කැපීමේ හා සීනි නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කරන ලදි. කොන්ත්‍රාත් පිට සේවය කරන කම්කරුවන් නොමැතිවීම සහ උක් වගා දෙකම යම් යම් ත්‍රස්තවාදී පහරදීම්වලට ලක්වීම හේතුකොට ගෙන, උක් කැපීමේ ගැටළු හා ප්‍රමාදවීම් ඇති විය.

වර්ෂය තුළ ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ වගා හා නිෂ්පාදන වැඩ කටයුතු පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## නැගෙනහිර පළාත—වාර්ෂික වාර්තාව—1986

| | හිඟුරාන | කන්තලේ | මුළු ගණන |
|---|---|---|---|
| රෝපණය කිරීම (හෙක්ටාර්) ... ... ... | 1,029 | 469 | 1,498 |
| නිරි වගාව (හෙක්ටාර්) ... ... ... | 1,159 | 1,649 | 2,808 |
| කපන ලද ප්‍රමාණය (හෙක්ටාර්) ... ... ... | 1,917 | 2,093 | 4,014 |
| ඇඹරූ උක් ටොන් ප්‍රමාණය (ටොන්) ... ... | 108,269 | 83,–93 | 191,562 |
| නිෂ්පාදනය කළ සීනි (ටොන්) ... ... ... | 7,979 | 7,223 | 15,202 |
| සීනි ආපසු ලබාගැනීම (%) ... ... ... | 7.34% | 8,09% | — |
| නිපදවූ උක් පැණි (ටොන්) ... ... ... | 6,284 | 4,563 | 10,847 |

(මූලාශ්‍රය : ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය)

නිෂ්පාදනය සංකීර්ණ දෙකේම විභව ධාරිතාවෙන් එකක් පමණ විය.

5. වෙනත් වගාවන්

අතිරේක ආහාර බෝග යටතේ වගා කරන ලද අක්කර සංඛ්‍යාව අඩු මට්ටමක පැවති අතර, එම වගා කටයුතුවලට වර්ෂාවෙන් හානි සිදු විය. බඩ ඉරිඟු, රට කජු හා මිරිස්, වගා කරන ලද ප්‍රධාන බෝග වර්ග විය.

ප්‍රවාහන දුෂ්කරතා හේතුකොට ගෙන ගොවි ජන සේවා මධ්‍යස්ථාන මගින් උයන් වතු රෝපණ ද්‍රව්‍ය හා පොල් පැල සැපයීම සීමා සහිත විය. දැනට පවතින තත්ත්වයන් හේතු කොටගෙන සහනාධාර ක්‍රමයන් යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබා ඇති ප්‍රගතිය ද අල්ප විය.

6. වන වගාව

නැවත වන වගා කිරීමේ සැලසුම් කළ වැඩ පිළිවෙලක් මෙම පළාත සඳහා ඇති කිරීම අතිශයින් වැදගත් වන්නේය- දිසාපති වරයාගේ, උප දිසාපතිවරයාගේ, කැලෑ දෙපාර්තමේන්තුවේ සහ වෙනත් දෙපාර්තමේන්තුවල සහභාගිත්වය ඇතිව, අම්පාර, සමන්තුරේ සහ මුතූර් මැතිවරණ කොට්ඨාශයේ කොටසක ද ගස් සිටුවීමේ වැඩ පිළිවෙල් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් දියත් කරන ලදි.

7. පශු සම්පත්

පශු සම්පත් අංශයෙහි ලා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, කිරි පට්ටි වැඩි දියුණු කිරීම, කිරි නිෂ්පාදනය හා එක්රැස් කිරීම සහ කුකුළු කර්මාන්තය වැඩි දියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. පශු සම්පත් බෙද හැරීම, එන්නත් කිරීමේ වැඩ සටහන් සහ කිරි එක් රැස් කිරීම යන කාර්යයන්හිදී කෘෂිකාර්මික කළමනාකාරවරු සත්ත්ව නිෂ්පාදනය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් ක්‍රියා කළහ. පශු වෛද්‍යවරු පත් කිරීම අප්‍රමාදව කළ යුතු වන්නේය.

8. වාරිමාර්ග

පුනරුත්ථාපනය කිරීමේ, නඩත්තු කිරීමේ හා ඉදි කිරීමේ වැඩ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් කරගෙන යන ලදී. එහෙත් බිම් බෝම්බ වළලා තිබීම හා වාහන සොරකම් කිරීම යන හේතූන් නිසා මෙම අංශයේ නිරතව සිටින නිලධාරීන්ට ප්‍රවාහන දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවීමෙන් විමර්ශන හා ඉදි කිරීම් වැඩ කටයුතු අවහිර වූයෙන් ලැබූ ප්‍රගතිය සීමා සහිත විය.

ගොවියන් විශාල සංඛ්‍යාවකට, වී වගාවට, නිවාසවලට, මංමාවත්වලට, වාරිමාර්ගවල ඉදිකිරීම්වලට සහ ජලාශයේ, වම් සොරොව්වට හානි පමුණුවමින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රධාන ජලාශයේ එනම් කන්තලේ වැවේ වැව් බැම්ම 1986 අප්‍රේල් 20 වැනි දින බිඳී ගියේය. පීඩා ලැබූවන්ට නිවාස පහසුකම්, ආහාර පාන, සෞඛ්‍ය පහසුකම් ආදිය සලසාදීමේ වැඩ කටයුතු වලදී කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්‍ය මණ්ඩලය දිසාපති වරයාට හා සෙසු සංවිධානවලට සහාය විය.

වැව් බැම්ම ඉදිකිරීමේ කාර්යය ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය විසින් බාරගනු ලැබූ අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම වර්ෂය තුළ ක්ෂේත්‍ර හා වාරිමාර්ග ඉදි කිරීමේ හා ලෙවල් කිරීමේ කටයුතුවල නිරත විය. වම් ඉවුරේ සොරොව්වේ වැඩ 1987 දී ආරම්භ කිරීමට නියමිතය. වෙල්ල පිරවීම සඳහා රු. 15,324,881ක් ද වාරිමාර්ග ඇල වේලි අළුත්වැඩියා කිරීම සඳහා රු. 81,42,384ක් ද මෙම වර්ෂය තුළ වැය කරන ලදී.

ගල්ඔය වම් ඉවුරේ පුනරුත්ථාපන ව්‍යාපෘතියේ වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් රු. 1,38,32,080 ක වියදමෙන් මෙම වර්ෂය තුළ කරගෙන යන ලදී. ගල්ඔය පාලන ව්‍යාපෘතිය වූ කලී ශ්‍රී ලංකා රජයේ සහ එක්සත් ජනපදයේ ඒකාබද්ධ ව්‍යාපාරයකි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ. මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වී ඇත්තේ, ජල පාලනය හැකියාවන් සහ වාරිමාර්ග යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමෙහි ලා එමෙන්ම නඩත්තු කිරීමෙහි ලා ගොවියන් ක්‍රියාකාරී ලෙස සහභාගී කරවා ගැනීමේ වැඩ සටහන් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමයි. කෘෂිකාර්මික පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මෙම වැඩ කටයුතු අගැයීමකට දියත් කර තිබේ. එම වැඩ සටහන මගින් ගල්ඔය ගොවීන්ට අර්ථවත් ප්‍රතිඵල ලබා දී ඇත.

මොරවැව, මහදිවුල්වැව, උනිච්චෙයි පුනරුත්ථාපනය කිරීමේ සහ නෙලුඔය ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිබඳ ප්‍රමාද වීමක් ඇති විය. නැගෙනහිර පළාතේ ගම්බද වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු අත්හිටුවීම අවාසනාවන්ත සිද්ධියකි.

9. වී අලෙවි මණ්ඩලය

මැතිවරණ කොට්ඨාශ ගණනාවක් තුළම සිදුවූ සොරකම් නිසාත්, මුහුණපෑමට සිදුවූ ප්‍රවාහන දුෂ්කරතා නිසාත් මෙම වර්ෂය තුළ වී තොග මිළට ගැනීමේ හා නිකුත් කිරීමේ කාර්යයන්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## නැගෙනහිර පළාත—වාර්ෂික වාර්තාව—1986

ඉටු කිරීමට වී අලෙවි මණ්ඩලයට නොහැකි විය. සිත්තාන්ඩි, මුතූර්, වීරමුනෙයි, චවලකඩෙයි සහ ඔලුවිල් හි පිහිටා ඇති වී මෝල් සංකීර්ණවල වැඩ කටයුතු මෙම වර්ෂය තුළ අවහිර විය.

10. ගොවිපළ බලය

මෙම පළාත වෙනුවෙන් කෘෂිකාර්මික ණය පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට අපට සිදු විය. රාජ්‍ය බැංකු සමග කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය ඇතැම් මැති වරණ කොට්ඨාශවල ගොවීන්ට සහාය වෙමින් සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රෝද හතරේ ට්‍රැක්ටර් 17ක්, රෝද දෙකේ ට්‍රැක්ටර් 12 ක්, වතුර පොම්ප 22 ක් සහ ඉසින යන්ත්‍ර 49 ක් නිකුත් කරන ලදි.

11. සමාප්තිය

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ලබා ගත හැකි සම්පත් උපයෝගි කර ගනිමින්, කෘෂිකාර්මික අංශයේ වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීමෙහි ලා උපරිම වශයෙන් දායක වී තිබේ

රාජ්‍ය බැංකු දැනට තම වැඩ කටයුතු පවත්වාගෙන යන්නේ ප්‍රධාන නගරවල පමණක් බැවින්, එම බැංකු ගොවි ජන සේවා මධ්‍යස්ථානවලදී හෝ වෙනත් හැකි ස්ථාන වලදී බැංකු ණය පහසුකම් සලසාදීමෙන් ගොවීනට සහාය විය යුතුයි.

ජාතිවාදී ප්‍රශ්න පළාතේ නොයෙකුත් දුෂ්කරතා ඇති කරමින් වැඩ කටයුතු අඩපණ කළේය. පළාතේ දැනට පවතින තත්ත්වය සතුටුදායක වුවහොත්, වගා කටයුතු වඩා යහපත් තත්ත්වයකට පත් කිරීමටත්, ජනතාවට වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා දීමටත් හැකි වනවා ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මා වෙත දක්වන ලද මග පෙන්වීම හා උනන්දු කරවීම ගැන අප සභාපතිතුමාට මගේ කෘතඥතාව මේ අවස්ථාවේදී පුද කරමි. තවද දිසා ඇමතිවරුන් ගෙන්, දිසාපතිවරුන්ගෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් මෙන්ම සෙසු සියලුම සංවිධානවල හා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලවලින් ලැබුණු සහයෝගය ගැන කෘතඥතාව පළ කරමි. ලබන වර්ෂය තුළ නැගෙණහිර පළාත් වාසී ජනතාවට වඩා හොඳ අනාගතයක් ළඟා කර දීම සඳහා අපගේ සේවය කැපකිරීමට බලාපොරොත්තු වෙමි.

ඩී. එච්. එස්. ඩබ්ලිව්. තිලකරත්න
පළාත් අධ්‍යක්ෂ — නැගෙණහිර පළාත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## පුහුණු හා ප්‍රචාරක—වාර්ෂික වාර්තාව—1986

අරමුණු රාශියක් 1986 වර්ෂය තුළ ඉටුකර ගැනීමට හැකි වූ අතර, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විවිධ අංශවලට අදාල නිලධාරීන්ට සාර්ථක ලෙස පුහුණු පංති පැවැත්වූ බව ඉතා සතුටින් සඳහන් කරමු.

**ප්‍රවිශ්ඨක පුහුණු**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියට මෑතකදී පත් කරනු ලැබූ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරුන් සහ කෘෂිකාර්මික කළමනාකරුවන් සඳහා ගන්නොරුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පස් දින වැඩ පිළිවෙලක් පවත්වන ලදි. මෙම පුහුණු වැඩ පිළිවෙල සඳහා නිලධාරීන් 18 දෙනෙකු සහභාගි වූහ.

**වැඩිදුර පුහුණු කිරීමේ පංති**

කෘෂි සංවර්ධන අධිකාරියේ කෘෂි කළමනාකාර මහතුන් සහ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරුන් සඳහා පහත සඳහන් විෂයන්ට අදාලව එක් දින පුහුණු පන්ති පවත්වන ලදි:

| විෂය | ස්ථානය | සහභාගි වූ ගණන |
|---|---|---|
| 1. පහතරට තෙත් කලාපයේ බෝග නිෂ්පාදනය, නව වී ප්‍රභෙදයන්, වන වගා පාලන ක්‍රම, පලතුරු වගාව, වී වගාවේ කෘමි රෝග පාලනය, පාංශු සංරක්ෂණය සඳහා රෝඩ් ට්‍රෙසරය භාවිතය, යෙදුම් අංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම. | සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, බෝඹුවෙල<br>බස්නාහිර පළාතේ කෘ. සං. අංශයේ නිලධාරීන් සඳහා | 23 |
| 2. වාරිමාර්ග යටතේ කෘෂිකාර්මික වගාවන්, මිරිස් තවාන් පාලනය හා ආර්ථික බව, වර්ෂාපතනය යටතේ කෘෂිකාර්මික වගාවන්, වියළි කලාපීය පළතුරු සහ එළවළු වගාවන් | සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය මහඉලුප්පල්ලම<br>වයඹ නැගෙනහිර සහ උතුරු මැද පළාතේ කෘෂිකාර්මික සංවර්ධන අංශයේ නිලධාරීන් සඳහා | 30 |
| 3. වාරිමාර්ග සපයන්නේ මන්ද, කෙසේ සැපයිය යුතුද, වාරිමාර්ග කටයුතු, සුළු වාරිමාර්ග මහා වාරිමාර්ග යටතේ කෘෂි. සංවර්ධන අංශයේ කාර්ය භාරය | සේවා සංරක්ෂණ අභ්‍යාස ආයතනය අඟුණකොලපැලැස්ස<br>දකුණු පළාතේ කෘ.සං. අංශයේ නිලධාරීන් සඳහා | 18 |
| 4. කහ, ඉඟුරු, බුලත්, මීමැසි පාලනය, පළතුරු අන්නාසි වගාවන් පිළිබඳ | සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, බිඳුනු වැව, බණ්ඩාරවෙල<br>සබරගමු පළාතේ කෘෂි. සං. අංශයේ නිලධාරීන් සඳහා | 17 |
| 5. තේ වගාව පිළිබඳ | තේ පර්යේෂණායතනය, රත්නපුර<br>සබරගමු පළාතේ කෘෂි. සං. අංශයේ නිලධාරීන් සඳහා | 15 |
| 6. වී වගාව | සේවා සංරක්ෂණ අභ්‍යාස ආයතනය, බෝඹුවෙල<br>ගාල්ල දිස්ත්‍රික්කයේ කෘෂි. සං. අංශයේ නිලධාරීන් සඳහා | 14 |
| 7. කිරි පට්ටි පාලනය පිළිබඳ | මහබෙරිය තැන්න ගොවිපළේ සහ නුවරඑළියේ නිව්සීලන්ත ගොවිපළේදී<br>උතුරු මැද පළාතේ කෘෂි. සං. අංශයේ නිලධාරීන් සඳහා | 18 |

**ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ වගා නිලධාරීන් සඳහා පුහුණු කිරීමේ වැඩ පිළිවෙල**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද නව විෂය නිර්දේශය යටතේ, මෙම මූලික පුහුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානවල පවත්වන ලදී. දින 07 ක කාලයක් තුළ පැවති මෙම පුහුණුවලට සහභාගී වූවන් නේවාසිකව සිටින ලදී. පහත සඳහන් දෙපාර්තමේන්තු වල සහ ආයතනවල නිලධාරීන් පුහුණුව සාර්ථකව පවත්වාගෙන යෑමට සහයෝගය දෙන ලදි. එම ආයතන නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ලංකා බැංකු, සුලු අපනයන බෝග දෙපාර්තමේන්තුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කෘෂි රක්ෂණ මණ්ඩලය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව ආදි වේ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## පුහුණු හා ප්‍රචාරක—වාර්ෂික වාර්තාව—1986

**සහභාගි වූ පුහුණු වන්නෝ**

| පළාත් | මැතිවරණ කොට්ඨාශය | වගා නිලධාරි ගණන |
|---|---|---|
| දකුණු පළාත | අම්බලන්ගොඩ | 28 |
| | (මාතර දිස්ත්‍රික්කය (පුහුණු තුනක් පවත්වන ලදි) | 114 |
| මධ්‍යම පළාත | නුවරඑළිය දිස්ත්‍රික්කය | 36 |
| බටහිර පළාත | මහරගම | 16 |
| | කැස්බෑව | 28 |
| සබරගමු පළාත | රුවන්වැල්ල | 17 |
| | යටියන්තොට | 16 |

1986 වර්ෂයේ පුහුණු කරන ලද වගා නිලධාරි සංඛ්‍යාව 255 කි. මේ අනුව 1978 වර්ෂයේ සිට මේ දක්වා මැතිවරණ කොට්ඨාශ 130 ක වගා නිලධාරීන් 4,246 ක් පුහුණු කර ඇත.

**විශේෂ අවධානයට යොමු වූ පුහුණු**

ඉහතින් විස්තර කළ පුහුණුවලට අමතරව කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ විවිධ ක්ෂේත්‍රවලට අයත් නිලධාරීන් විසින් විවිධ වර්ගයේ වෙනත් පුහුණු පාඨමාලා පවත්වන ලදි. එයින් වඩා වැදගත්යැයි සැලකෙන පුහුණු කිරීම් පහත දැක්වේ :

| පුහුණුව | සහභාගිවූවන් | සංවිධායක |
|---|---|---|
| 1. ගැමි තරුණයන් වෙළෙඳ කටයුතුවල නියැලීම | ගැමි තරුණයන් 78 | කෘ.සං.අ. (අලෙවි අංශය) |
| 2. එලුවන් පාලනය | කෘෂි. කළ. සහ වගා නිල | කෘ.සං.අ. (යෙදුම් අංශය) |
| 3. කුකුල් පාලනය | යටියන්තොට ගොවීන්ට | කෘ.සං.අ. (යෙදුම් අංශය) |
| 4. ට්‍රැක්ටර් පුහුණු පංති 10 ක් | ගොවීන් සඳහා | කෘසං.අ. (යෙදුම් අංශය) |
| 5. ට්‍රැක්ටර් පුහුණු පංති 2 ක් | මාතර ට්‍රැක්ටර් හිමියන්ට | කෘ.සං.අ. (යෙදුම් අංශය) |
| 6. කිරි දෙනුන් පාලනය හා නිවෙස් බිම් සංවර්ධන, කෘෂිකාර්මික කටයුතු සංවිධානය පිළිබඳ | වගා නිලධාරීන්ට | කෘෂි කළමණාකරු, හලාවත |
| 7. ගොයම් පැල සිටුවීමේ යන්ත්‍ර ලබාදීම හා පුහුණුව | ගොවීන් 10 | කෘෂි කළමනාකරු, නාවලපිටිය |
| 8. ඒකාබද්ධ කෘමි පාලනය ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම | කෑගල්ල දිස්ත්‍රික්කයේ කෘෂි කළමනාකාර මහතුන්ට | නි.ප.අ. කෑගල්ල |
| 9. ගොවි නායකත්ව පුහුණු පංතියක් | ගොවීන්ට | කෘෂි කළමනාකරු, හෝමාගම |
| 10. පොල් වගාව පිළිබඳ | ගොවීන් 40 | කෘෂි කළමනාකරු, මොනරාගල |
| 11. හතු වගාව | ගොවීන් 7 | කෘෂි කළමනාකරු, මතුගම |
| 12. එළවලු වගාව | ගොවීන් 25 | කෘෂි කළමනාකරු, ආනමඩුව |
| 13. රබර් පැල බද්ධකිරීම සහ තවාන් පාලනය | තරුණයන් 21 | කෘෂි කළමනාකරු, දෑදිගම |
| 14. තේ තවාන් පාලනය | ගොවීන් 59 | කෘෂි කළමනාකරු, නාවලපිටිය |
| 15. ගෙවතු වගාව | තරුණ පිරිස් 47 | කෘෂි කළමනාකරු, මතුගම |
| 16. ඉඟුරු, කහ සහ කුකුල් පාලනය | තරුණියන් 27 | කෘෂි කළමනාකරු, දෑදිගම |
| 17. ද්‍රව ප්‍රවාහන බලපත් සඳහා පුහුණුවක් | කෘෂි කළමනාකාරවරුන් 9 | නි.ප. අධ්‍යක්ෂ, කෑගල්ල |
| 18. ගැමි නායකත්ව පදනමේ ගොවි පුහුණුවක් | ගොවීන් 50 | කෘෂි කළමනාකරු, වාරියපොල |
| 19. කුකුල්, මී මැසි, වී සහ එළවලු පිළිබඳ | ගොවීන් 30 | කෘෂි කළමනාකරු, අරනායක |
| 20. කෘෂිකාර්මික සහ සත්ව පාලන වැඩ සටහන | ග්‍රා.ම. සභාපති/ව.නි. | කෘෂි කළමනාකරු, කැළණිය |
| 21. ගව පාලනය පිළිබඳ | ගොවීන්ට | කෘෂි කළමනාකරු, කඹුරුපිටිය |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## පුහුණු හා ප්‍රචාරක—වාර්ෂික වාර්තාව—1986

**දිළිඳු ගැමියන් සංවිධානය කිරීම සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීම**

'සර්ඩැප්' ආයතනයේ අනුග්‍රහය යටතේ, කෘෂි සංවර්ධන අධිකාරිය මෙහෙයවීමෙන් ඉහත පුහුණුවේ අවසන් පසු වැඩ පිළිවෙල හසලක අධ්‍යාපන කාර්යාලයේදී වගා නිලධාරි 21 දෙනෙකුට 1986 පෙබරවාරි මස 22 සිට 23 දින දක්වා පවත්වන ලදී.

**ප්‍රශංසා සහතික පත්**

1986 වර්ෂය තුළදී යටිනුවර, හඟුරන්කෙත, හක්මන යන මැතිවරණ කොට්ඨාශවල ගොවීන්ට ප්‍රශංසා සහතික පත් නිකුත් කරන ලදී.

**ප්‍රචාරක කටයුතු**

(අ) කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය සම්බන්ධව ගුවන් විදුලි සාකච්ඡාවක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ 'සාරභූමි' වැඩ සටහන යටතේ පවත්වන ලදී.

(ආ) පැල්වත්ත සීනි කම්හලේ විවිධ සංවර්ධන අවස්ථා පිළිබිඹු කරන රූපවාහිනී වාර්තා චිත්‍රපටයේ වැඩ කටයුතු 1986 මැයි මාසයේදී නිම කරන ලදී.

(ඇ) කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ මැතිවරණ චාරිකාවන් අළලා ගුවන් විදුලි වැඩ සටහන් 2 ක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 'ස්වදේශීය' සේවය ඔස්සේ ප්‍රචාරය කරන ලදී.

(ඈ) පුවත්පත් වාර්තාකරුවන්ට 1985 කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව බෙදා දුන් අතර, පුවත් පත් වාර්තාකරුවන් සමග සභාපතිතුමා සාකච්ඡාවක් පවත්වන ලදී.

රටේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් කරන ලද අගනා සේවය පිළිබඳ පුළුල් ප්‍රචාරයක් පුවත් පත්, ගුවන් විදුලිය සහ රූපවාහිනිය මගින් ලබා දෙන ලදී.

**එන්. යූ. අයි. පෙරේරා**
අධ්‍යක්ෂ, පුහුණු හා ප්‍රචාරක.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික යෙදවුම් අංශය—වාර්ෂික වාර්තාව—1986

ගොවිපළ මට්ටමේදී අවශ්‍යවන කෘෂිකාර්මික යෙදවුම්, නියමිත ප්‍රමාණයෙන් හා තත්ත්වයෙන් කලට වේලාවට සැපයීමෙහි ලා විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත පැවරී ඇති කාර්යයන් සම්බන්ධීකරණයේ හා ඒකාබද්ධ කිරීමේ වැදගත් මෙහෙය කෘෂිකාර්මික යෙදවුම් අංශය විසින් තවදුරටත් ඉටු කරන ලදී.

### කාර්ය මණ්ඩලය

සත්ව පාලන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන් සේවය කළ ජේ. සේනක සොයිසා මහතා 1986 සැප්තැම්බර් මාසයේදී කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගියෙන් එම පුරප්පාඩුවට 1986 ජූනි මාසයේ දී ආර්. එම්. බී. ප්‍රනාන්දු මහතා පත් කරනු ලැබීය. කෘෂිකාර්මික ණය හා රක්ෂණ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන් සේවය කළ එන්. කේ. අධිකාරම්ගේ මහතා 1986 ඔක්තෝබර් මාසයේ දී කෘෂි-කාර්මික සංවර්ධන අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගියේය.

යෙදවුම් අංශයේ එක් එක් කාර්යභාරයක් මගින් ඉටු කරන ලද වැඩ කොටස පහත දක්වා ඇත.

### බීජ හා රෝපණ ද්‍රව්‍ය

#### බිත්තර වී

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ බිත්තර වී ලබා ගැනීමේ හැකියාව ප්‍රසංශනීය තත්ත්වයක පැවතුනි. බිත්තර වී වැඩ පිළිවෙළේ ඉලක්ක සපුරාගත හැකි වූ නමුදු අසතුටුදායක කාලගුණ තත්ත්වයන් හේතුකොටගෙන බිත්තර වී අලෙවියට බාධා පැමිණියේය. පසුගිය කන්න ගණනාවකදීම මෙය නියත ලක්ෂණයක්ව පැවති අතර, එහි ප්‍රතිඵලය වශයෙන් දිගු කාලීන වන බිත්තර වී සැලකිය යුතු ප්‍රමාණයක් පරිභෝජනය සඳහා සකස් කර ගැනීමට සිදුවිය. දැනට ඇති ගබඩා පහසුකම්, බිත්තර වී දිගු කල් ගබඩා කිරීමට සලසා නොමැත. හදිසි අවස්ථාවක දී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි බිත්තර වී තොග පවත්වාගෙන යෑමට ඇති ප්‍රධාන බාධකය වශයෙන් මෙය පෙන්වා දිය හැක.

1986 යල කන්නයේ හා 86/87 මහ කන්නයේ බිත්තර වී සැපයුම ප්‍රමාණවත් විය. ඊසාන දිග මෝසම් වැසි අසාර්ථක වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වගා කටයුතු පමාවීම හා සීමාවීම හේතුකොටගෙන, විශේෂයෙන් ඊසාන දිග මෝසම් වර්ෂාවෙන් පෝෂණය වන ප්‍රදේශවල අඩු මාස් වී සඳහා වැඩි ඉල්ලුමක් පැවති අතර, වැඩි මාස් වී සඳහා පැවතියේ සීමිත ඉල්ලුමකි. මෙම අනපේක්ෂිත වෙනස්වීම නිසා, 1987 යල කන්නය සඳහා රැස්කර තිබුණු අඩු මාස් බිත්තර වී තොගය ක්ෂයවීමට ඉඩ තිබේ.

#### බීජ අර්තාපල්

බදුල්ල දිස්ත්‍රික්කයේ බීජ අර්තාපල් බෙදා හැරීම පිළිබඳ යමක් සඳහන් කිරීම සුදුසු වන්නේය. කාඩිනල් බීජ අර්තාපල් විශේෂය අර්තාපල් වගාකරුවන් අතර බලෙන් බෙදා හැරීම ගැන ඔවුහු කලකිරීමට හා විමතියට පත් වූහ. මෙම බීජ අර්තාපල් වර්ගය හඳුන්වාදීම කෙරෙහි ගොවීහු විරුද්ධත්වය පළ කර තිබේ. බීජ නිෂ්පාදන වැඩ පිළිවෙළ තීරණය කිරීමේදී ගොවියන් කැමති වර්ග කෙරෙහි නිසි පරිදි සැලකිලිමත් වීම වැදගත් වේ.

#### වන වගා වැඩ පිළිවෙල

කැලෑ දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති අංශයේ සහයෝගීත්වය යටතේ මෙම අංශය විසින් ගස් සිටුවීමේ ව්‍යාපාරයක් දියත් කරන ලද අතර, බලවත් උනන්දුවකින් ක්‍රියාත්මක විය. අදාල ප්‍රාදේශීය කැලෑ තවාන්වලින් රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමෙහි ලා කළුතර හා රත්නපුර දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික කළමනාකරුවන්ට දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විය. පැල 500,000 අධික සංඛ්‍යාවක් සාර්ථක ලෙස බෙදා දෙන ලදී.

### ගොවිපළ බලය හා උපකරණ

ගොවිපළ යන්ත්‍රෝපකරණ සැපයීමේ ආයතනවල ක්‍රියාකාරිත්වයන්ගේ සමීප සම්බන්ධීකරණය මගින් ගොවීනට ගොවිපළ යන්ත්‍ර හා උපකරණ ක්ෂේත්‍ර මට්ටමේදී වර්ෂය පුරා සැපයීම සහතික කරන ලදී. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින්, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ අලෙවියෙන් පසු නඩත්තු කිරීමේ වැඩ කටයුතු සමීප වශයෙන් සෝදිසි කරන ලදී. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිත කිරීමේ දී අනුගමනය කළ යුතු ආරක්ෂක පියවර කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.

#### උදළු තල

උදළු තල මෙරටට ආනයනය නොකරනු ලැබූ බැවින්, මුළු අවශ්‍යතාව දේශීය නිෂ්පාදකයා විසින් සපයනු ලැබූ අතර, නිෂ්පාදනය හා අලෙවිය නොකඩවා සෝදිසි කරන ලදී. වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලද මුළු උදළු ප්‍රමාණය 5,18,953ක් වූ අතර, වර්ෂය තුළ අලෙවිය 5,09,262 ක් විය. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් ජාතික ගොවිපළ යන්ත්‍රෝපකරණ කමිටුව වෙත කරන ලද කරුණු ඉදිරිපත් කිරීමක් අනුව, උදළු තල මත ශ්‍රී ලංකා ප්‍රමිති ලාංඡනය තැබීමට ක්‍රියා කරගෙන යනු ලැබේ.

#### රෝද 2 හා රෝද 4 ට්‍රැක්ටර්

ග්‍රාමීය කෘෂිකාර්මික අංශයේ රෝද හතරේ ට්‍රැක්ටර් සඳහා වෙළඳපොළේ ප්‍රධාන වශයෙන් පැවතියේ ඌන පූරණය සඳහා වූ ඉල්ලුමකි. වර්ෂය තුළ රෝද දෙකේ ජපන් ට්‍රැක්ටර් අලෙවියේ පැහැදිලි වෙනස් වීමක් දක්නා ලදී. වඩා ජනප්‍රිය වූ කුබෝටා ට්‍රැක්ටරයේ මිළ සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රු. 20,000කින් පමණ වැඩි කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් බිම් සකස් කිරීමේ වියදම ද වැඩි විය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අලෙවි කරන ලද, මුළු ට්‍රැක්ටර් සංඛ්‍යාව කලින් වර්ෂයේ අලෙවි කරන ලද ට්‍රැක්ටර් සංඛ්‍යාවට වඩා 1,000ක් පමණ අඩු විය. ප්‍රධාන වශයෙන් මිලෙහි ඇති වෙනස හේතුකොටගෙන කොරියාවේ සාදන ලද ට්‍රැක්ටර් ගොවීන් අතර ජනප්‍රිය වෙමින් පවතී.

#### පැළ සිටුවීමේ හා වල් නෙලීමේ යන්ත්‍ර

පැළ සිටුවීමේ යන්ත්‍ර මිළට ගැනීමට පෙර, සුදුසු ගොවීන් තෝරාගෙන ඔවුන් වෙනුවෙන් අවශ්‍ය පුහුණු කිරීමේ වැඩ කටයුතු පිළියෙල කිරීමෙන්, පැළ සිටුවීමේ යන්ත්‍ර ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමෙහි ලා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය සමග සහයෝගයෙන් ක්‍රියා කරන ලදී. පැළ සිටුවීමේ

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික යෙදවුම් අංශය—වාර්ෂික වාර්තාව—1986

යන්ත්‍ර භාවිත කිරීම හේතුකොටගෙන වල් නෙලීමේ යන්ත්‍ර සඳහා ඉල්ලුම ද වැඩි වී ඇති අතර, කලට වේලාවට වල් නෙලීමේ යන්ත්‍ර සැපයීම පිණිස කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය වැලිසර පිහිටි ගොවිපළ යන්ත්‍රෝපකරණ කම්හල සමග සහයෝගයෙන් ක්‍රියා කරගෙන යයි.

### කෘෂිකාර්මික වතුර පොම්ප හා ඉසින යන්ත්‍ර

අඟල් 2 කෘෂිකාර්මික වතුර පොම්ප සඳහා අධික ඉල්ලුමක් පැවතුණි. වතුර පොම්පවල මිළ ද සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී තිබේ. මැතිවරණ කොට්ඨාශ මට්ටමේ දී වතුර පොම්ප නඩත්තු කිරීම වර්ෂය තුළ තවදුරටත් කරගෙන යන ලදී. නැප්සැක් ඉසින යන්ත්‍ර බෙදා දීමේ උත්සව දෙකක් ආනමඩුව හා වාරියපොල මැතිවරණ කොට්ඨාශ තුළ පවත්වනු ලැබූ අතර, එම උත්සවවලදී යන්ත්‍ර 125 අධික සංඛ්‍යාවක් බෙදා දෙනු ලැබීය. මැතිවරණ කොට්ඨාශ මට්ටමේ දී ඉසින යන්ත්‍ර වැඩි ප්‍රමාණයක් නඩත්තු කරවා ගැනීම පිණිස ප්‍රධාන පෙළේ ඉසින යන්ත්‍ර නිෂ්පාදන ආයතනයක් සමග සම්බන්ධීකරණයෙන් ක්‍රියා කරන ලදී. මරුනාකා ඉසින යන්ත්‍ර නඩත්තු කිරීමේ ජංගම ඒකකය මගින් ගොවි ජන සේවා මධ්‍යස්ථානවල දී ඉසින යන්ත්‍ර නඩත්තු කිරීම තවදුරටත් සිදු කරන ලදී.

### නොගැඹුරු නළ ළිං

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් 1985 දී දියත් කරන ලද මෙම වැඩ පිළිවෙළ තවදුරටත් පවත්වාගෙන යනු ලැබූ අතර, අඩු වියදම් තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සුළු පරිමාණයේ ගොවීන් සඳහා නොගැඹුරු ළිං විශාල සංඛ්‍යාවක් ඉදි කරන ලදී.

### කොළ මඩින යන්ත්‍ර

වෙනස් කරන ලද අයි. ආර්. ආර්. අයි. වර්ගයේ කොළ මඩින යන්ත්‍රය ගොවීන් විශාල සංඛ්‍යාවක් අතර ජනප්‍රිය කෘෂිකාර්මික යන්ත්‍රයක් බවට පත් වී තිබේ. කොළ මඩින යන්ත්‍ර හේතු කොටගෙන අත් තුවාලවීම පිළිබඳ වෛද්‍ය වාර්තාවක් අනුව කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් සමීක්ෂණයක් පවත්වන ලදී. ගොයම් කොළ මඩින යන්ත්‍ර භාවිත කිරීමේදී අත් තුවාලවීම් වලට වැඩි වශයෙන් භාජනය වී ඇත්තේ දකුණු පළාතේ ගොවීන් බව මෙම සමීක්ෂණයේදී අනාවරණය විය. තුවාලවීම් වලට ප්‍රධාන හේතුව වී ඇත්තේ නුපුහුණු පුද්ගලයන් විසින් යන්ත්‍රය පරිහරණය කිරීමයි. අතිරේක ආරක්ෂක පියවර ගන්නා අතරම ප්‍රචාරක හා පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් සංවිධානය කිරීමට පියවර ගන්නා ලදී.

### අස්වනු නෙලීමේ උපකරණ

සාර්ථක පර්යේෂණ හා සංවර්ධන වැඩ පිළිවෙලකින් පසු, ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානයේ ඉංජිනේරුවරුන්ගේ මාර්ගෝපදේශ යටතේ අස්වනු නෙලීමේ ආබද්ධ උපකරණයේ අනුරුවක් නිෂ්පාදනය කරන ලදී. පළමුවැනි අනුරූ 25 ලබන 86/87 මහ කන්නයේදී පොළොන්නරුවේ ගොවීන්ට භාරදීමට අපේක්ෂා කෙරේ.

### ආදර්ශන

මොණරාගල, රත්නපුර, කෑගල්ල, කුරුණෑගල සහ මාතලේ යන දිස්ත්‍රික්කවල ගොවීන්ගේ ඉල්ලීමක් අනුව, එම ගොවීන්ට ලබාගත හැකි අලුත් මාදිලියේ කෘෂි යන්ත්‍රෝපකරණ පිළිබඳ අවබෝධයක් ඔවුන්ට ලබා දෙනු වස්, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ආදර්ශන පවත්වන ලදී. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සැපයීමේ ආයතන 20 ආසන්න සංඛ්‍යාවක් මෙම ආදර්ශන වලට සහභාගී වූහ.

### පුහුණු කිරීම

ගොවිපළ යන්ත්‍රෝපකරණ භාවිත කරන ගොවීන්ගෙන් වැඩි සංඛ්‍යාවක් තුළ ඒ පිළිබඳ කිසිදු පුහුණුවක් නොමැති බව යෙදවුම් අංශයට අවබෝධ විය. නාරාහේන්පිට පිහිටි, ට්‍රැක්ටර් සංස්ථාවේ අභ්‍යාස පාසැලේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව, පුහුණු කිරීමේ වැඩ පිළිවෙළවල් 10ක් පවත්වා, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ට්‍රැක්ටර් හිමියන් 300ට අධික සංඛ්‍යාවක් පුහුණු කරවන ලදී.

රෝද දෙකේ ට්‍රැක්ටර් හා උපකරණ නඩත්තු කිරීමේ හා පාලනය කිරීමේ ඒ හා සමාන වැඩ සටහන් මාතර දිස්ත්‍රික්කය තුළත් අනුරාධපුරයේ ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානයේදීත් ගොවීන් 150 දෙනෙකු සඳහා පවත්වන ලදී.

### පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය

#### පොහොර

කලින් වර්ෂයේ පොහොර භාවිතය හා සසඳා බැලීමේ දී, 1986 වර්ෂය තුළ සියලු බෝග සඳහා පොහොර භාවිත කිරීමේ සුළු වැඩිවීමක් පෙනෙන්නට තිබේ. වී වගා අංශයේ 15% වැඩිවීමක් පෙන්නුම් කරන අතර, වැවිලි අංශයේ පොහොර භාවිත කිරීම අඩුවීමක් දකින්නට ලැබේ.

රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව විසින් යූරියා නිෂ්පාදනය නොකරනු ලැබූ බැවින්, රජය මගින් ඇමෝනියම් සල්ෆේට් සඳහා සහනාධාර ක්‍රමය නැවතත් ඇති කළෙන්, එහි ප්‍රතිඵලය වූයේ මෙට්‍රික් ටොන් එකක මිළ රු. 850/- කින් අඩුවීමයි. සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ සෙසු සියලුම ද්‍රව්‍යවල මිළ ගණන් නොවෙනස්ව පැවතුණි. පොල් සඳහා දැනට පවතින අඩු මිළ ගණන් නිසා බලවත් පීඩාවකට පත්ව සිටින පොල් වගාකරුවන්ට සහයවීමක් වශයෙන්, 1986 අගෝස්තු පළමුවැනි දින සිට මෙට්‍රික් ටොන් එකක් සඳහා රු. 150/- ක මුදලක් පොල් නගා සිටුවීමේ අරමුදලෙන් ප්‍රදානය කරන ලදී.

ආනයන කිරීමේ මිශ්‍ර කිරීමේ, හා බෙද හැරීමේ ප්‍රධාන ආයතන මගින් දිවයින තුළ පොහොර බෙදා හැරීම සතුටුදායක ලෙස සිදු කරන ලදී. උතුරු පළාතේ අවශ්‍යතා සපුරාලනු වස් ලංකා පොහොර සංස්ථාව විසින් පොහොර තොග කීපයක් නැව් මගින් කන්කසන්තුරේට යවන ලදී. වෙළඳසැල්වල අලෙවිය සඳහා තබා ඇති පොහොරවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහාත්, වෙනත් ද්‍රව්‍ය පොහොර සමග මිශ්‍ර කිරීම ආදී කරුණු සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි ගැන සොයා බැලීම සඳහාත් ලංකා පොහොර සංස්ථාව විසින් ජංගම පරීක්ෂණාගාර සේවයක් දියත් කරන ලදී.

රෝලර් යන්ත්‍ර අබලන් වීම හා අවශ්‍ය අමතර කොටස් විදේශවලින් ගෙන්වා ගැනීමේ ප්‍රමාදය හේතුකොටගෙන වසරේ මුල් කාර්තුව තුළ එප්පාවල රොක් පොස්පේට් නිෂ්පාදනය කිරීමෙහි ලා දුෂ්කරතාවලට මුහුණ පෑමට රාජ්‍ය පතල් කැණීමේ හා ඛණිජ සම්පත් සංවර්ධන සංස්ථාවට සිදු විය.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික යෙදවුම් අංශය—වාර්ෂික වාර්තාව—1986

ආනයනය කළ රොක් පොස්පේට් හා ටීඑස්පී සඳහා ආදේශයක් වශයෙන් උපයෝගී කර ගැනීමෙහි ලා අයිඑෆ්ඩීසී සහභාගිත්වයෙන් නිෂ්පාදනය කළ අර්ධ අල්පාම්ලික පොස්පේට් රොක්වල ඇති යොග්‍යතාව නිශ්චය කිරීමේ සක්‍යතා අධ්‍යයනයක් රාජ්‍ය පතල් කැනීම් හා ඛනිජ සම්පත් සංවර්ධන සංස්ථාව දියත් කර තිබේ.

කාබනික පොහොර භාවිතයෙන් පස හා එහි තෙතමනය වර්ධනය කිරීමට බොහෝ සෙයින් ඉඩකඩ ඇති බැවින්, ඇතැම් අදාල පර්යේෂණ ආයතන කාබනික පොහොර භාවිත කිරීම පිළිබඳ උපදේශාත්මක චක්‍රලේඛ ප්‍රකාශයට පත් කර ඇති අතර, ඇතැම් ආයතන ඒවා සකස් කිරීමෙහි දැනට නියැලී සිටිති.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ජා.පො.ලේ./කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආදර්ශ වැඩ සටහන, ආ.කෘ.සං./කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර පරීක්ෂණ හා හරිවැරදි බැලීමේ වැඩ සටහන:, සමූහ වැඩ සටහන, ජා.පො.ලේ./ර.ප.ආ. රබර් පිළිබඳ ආදර්ශන සහ ආ.කෘ.සං./පො.සං.අ. පොල් පොහොර ආදර්ශන වැඩ සටහන් පවත්වන ලදී.

### කෘෂි රසායනික ද්‍රව්‍ය

දිවයින තුළ පළිබෝධනාශක භාවිත කිරීම හා බෙදා හැරීම සඳහා පලිබෝධ නාශක ලේඛනගත කිරීමේ නිලධාරියා විසින් වැඩ කටයුතු අරඹන ලදී. බලය ලත් නිලධාරීන් පත්කර වඩා බහුල වශයෙන් භාවිත කෙරෙන පළිබෝධනාශක සඳහා ප්‍රාග්–අස්වැන්න විරාම කාල සීමා හා උපරිම අවශේෂ සීමා ගැසට් කරන ලදී.

ආනයනය කිරීමේ හා නියමයන් සකස් කිරීමේ ප්‍රධාන සංවිධාන මගින් කෘෂි රසායන බෙදා හැරීම සතුටුදායක ලෙස සිදු කරන ලදී.

### වාරිමාර්ග

ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ සහාය ඇතිව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව පිළිවෙලින් මහ පරිමාණයේ හා සුලු පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබේ. අවශ්‍ය මුදල් නොලැබීම නිසා සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මෙම ක්ෂේත්‍රයෙහි ලා ජාතික තරුණ සේවා සභාව මගින් ඉටු කරන ලද වැඩ කටයුතු බෙහෙවින් අල්ප විය. වාරිමාර්ග ක්ෂේත්‍රයෙහි වැඩ කටයුතු ඉහත සඳහන් ආයතන සමග තවදුරටත් සම්බන්ධීකරණය කරන ලදී.

1986 මුල් භාගය තුළ සාමාන්‍ය කාලගුණ තත්ත්වයන් පැවති නමුදු, වර්ෂයේ පසු භාගය තුළ ඊසාන දිග මෝසම් වැසි අසාර්ථක වීම වියළි කලාපයේ මහ කන්නයේ වගා කටයුතු කෙරෙහි බෙහෙවින් අහිතකර බලපෑම් ඇති කළේය. වඩාත්ම හානි සිදුවූයේ වයඹ පළාතටය.

දැනට පවතින අසහනකාරි තත්ත්වය නිසා දිවයිනේ උතුරු හා නැගෙණහිර පළාත්වල ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන වැඩ කටයුතු හා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලවල් අත්හිටුවා තිබේ. වාරිමාර්ග හා ගොවි ජන සේවා දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන සාමාන්‍ය නඩත්තු වැඩ පිළිවෙලවල් ද අවහිර වී ඇත.

### සුළු වාරිමාර්ග

සුළු වාරිමාර්ග වැඩ කටයුතු සඳහා රුපියල් මිලියන 48.8 ක මුදලක් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට වෙන්කර තිබේ. මෙයින් රුපියල් මිලියන 45.78 ක මුදලක් පුනරුත්ථාපනය වැඩ කටයුතු සඳහා දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරුන් අතර බෙදා දී ඇති අතර, රුපියල් මිලියන 3.01 ක් නම් කළ වැඩ කීපයක් ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මාරු කරන ලදී. වර්ෂයේ පසු භාගය තුළ පැවැති වියලි කාලගුණ තත්ත්වය, ආරම්භ කළ වැඩ නිම කිරීමට බෙහෙවින් උපකාර විය. වෙන් කරන ලද මුළු මුදලම වැය කරනු ඇතැයි මෙම වාර්තාව සකස් කරන අවස්ථාවේදී අපේක්ෂා කෙරේ.

ලෝක බැංකුව මගින් මුදල් සපයා ඇති ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ කරගෙන යනු ලබන ජල කළමනාකරණ වැඩ පිළිවෙල 1986 දී තව දුරටත් ක්‍රියාත්මක වූ අතර, රුපියල් මිලියන 25.985 ක මුදලක් ඇස්තමේන්තු කළ නව වැඩ 150 ක් ආරම්භ කරන ලදි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ක්රෝලර් ට්‍රැක්ටර් 26 ක් හා ඩෝසර ෂවල් 4 ක් යොදා ගම්බද වැව්වල රොන්මඩ ඉවත් කිරීම තවදුරටත් සිදු කරන ලදී. මෙම වැඩ සටහන සඳහා අවශ්‍ය මුදල්, එමගින් සහන සැලසෙන අයගෙන් රැස්කර ගැනීමේ වැඩ පිළිවෙල කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ ගණනාවක සාර්ථක වී තිබේ. සෙසු මැතිවරණ කොට්ඨාශවල රොන් මඩ ඉවත් කිරීමේ වැඩ සටහන, විමධ්‍යගත අය වැය යටතේ ලැබුණු මුදල් මත රඳා පැවතුනි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශවල හා පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව මැතිවරණ කොට්ඨාශයේ ගංවතුරෙන් සිදුවූ අලාභහානි අළුත්වැඩියා කිරීම සඳහා බුල්ඩෝසර් උපයෝගී කරගන්නා ලදි.

නිම කරන ලද වැඩ භාර ගැනීමේදී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට මතුවූ ගැටළු මෙතෙක් නිරවුල් කර නැත. එය එසේ වුවද, නිම කළ සැනෙකින් එම වැඩ භාර දීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව ක්‍රියා කරගෙන යයි.

### මහා පරිමාණයේ වාරිමාර්ග

පහත සඳහන් මහ පරිමාණයේ වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ තවදුරටත් කරගෙන යන ලදි:

- කිරිදිඔය ජලාශ ව්‍යාපෘතිය
- ගල්ඔය පුනරුත්ථාපනය
- නිල්වලා ගඟ ගංවතුර ආරක්ෂක යෝජනා ක්‍රමය

කිරිදිඔයේ වැඩ කටයුතුවලින් විශාල කොටසක් දැන් නිමකර තිබේ. වාරිමාර්ග පහසුකම් සැපයීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

ගල්ඔය පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර ඇල මාර්ගවල ඉතිරි වැඩ මුළුමනින්ම වාගේ නිමකර තිබේ.

නිල්වලා ගඟ ගංවතුර ආරක්ෂක යෝජනා ක්‍රමයේ 11 වන අධියර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ආරම්භ විය.

දැනටමත් ගම්බද වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතට පත්කර ඇති දිස්ත්‍රික්කවලට අමතරව කොළඹ හා කළුතර

## කෘෂිකාර්මික යෙදවුම් අංශය—වාර්ෂික වාර්තාව—1986

දිස්ත්‍රික්ක නිර්දේශ කර ඇත. 1987 මුල් අවදියේ ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත ලෝක බැංකුවේ නියෝජිත පිරිස මේ සම්බන්ධයෙන් සතුටුදයක තීරණයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. 1986 වර්ෂයේ දී රුපියල් මිලියන 188.51 ක ඇස්තමේන්තු වියදමකින් වැඩ 237 ක් සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩ ආරම්භ කර ඇති අතර, මෙම වැඩ සටහන යටතේ වාරිමාර්ග වැඩ කටයුතු ඉදිරි වර්ෂය තුළ විශාල උනන්දුවකින් කරගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජපන් ආධාර යටතේ ගම්පහ දිස්ත්‍රික්කය සඳහා වූ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ සියලු මූලික වැඩ කටයුතු නිමකර ඇති අතර, දැනටමත් බොහෝ සෙයින් ප්‍රමාද වී ඇති අත්තනගලු ඔය යෝජනා ක්‍රමයේ පුනරුත්ථාපන වැඩ කටයුතු නිම කිරීමේ ලකුණු දැන් මොනවට පැහැදිලි වේ.

### සාමාන්‍ය කරුණු

විවෘත ළිං කැණීමේ යෝජනා ක්‍රමය යටතේ පහළ ඌව ප්‍රදේශයේ තවත් බිම් එළවළු වගාව ව්‍යාප්ත කර තිබේ.

හොරබොක්කගම පිහිටි පළමුවැනි සාර්ථක කෘෂිකාර්මික නළ ළිඳ නියාමක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කර, එයින් ලබන අත්දැකීම් අනුව වැඩ සටහන නැවත පන ගැන්වීමට තීරණය කරන ලදී.

### කෘෂිකාර්මික ණය හා රක්ෂණය

කෘෂි ණය ප්‍රති උපලේඛනගත කිරීම මහජන බැංකුව විසින් 1986 ජනවාරියේ සිට ආරම්භ කරන ලද අතර, එමගින් දිවයිනේ ගොවියන් 1,50,000 කට සහන සැලසී තිබේ. මෙය සාර්ථක කිරීම පිණිස මහජන බැංකුවට පූර්ණ සහයෝගය සලසා දෙන මෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සිටින ලදී. මෙම යෝජනා ක්‍රමය පිළිබඳව ගොවීන්ට කරුණු පැහැදිලි කරදීම සඳහා කෘෂිකාර්මික කළමනාකරුවන් විසින් මහජන බැංකුවේ කළමනාකරුවන් සමග ක්ෂේත්‍ර මට්ටමේ රැස්වීම් සංවිධානය කර තිබේ.

මාතලේ, මහබැංකුවේ එකඟත්වය ඇතිව, දේවහුවේ සෝයා බෝංචි වගා කිරීම සඳහාත් සීගිරිය ප්‍රදේශයේ බොම්බයි ලූනු වගා කිරීම සඳහාත් දේවහුවේ හා කිඹිස්සේ ව්‍යාපෘති දෙකක් ආරම්භ කරන ලදී. තවද, ඒ සමගම, මාතලේ මහා බැංකුවේ සහාය ඇතිව කිඹිස්ස ප්‍රදේශයේ විවෘත ළිං කැනීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

ගම් මට්ටමේ උක් මඩින යන්ත්‍ර සුදුසු ස්ථානවල පිහිටුවීම සඳහා මුදල් ආධාර සලසාදීමේ අරමුණ ඇතිව උක් වගා කරන ගොවියන් සමග සාකච්ඡා පවත්වන ලදී.

මුදල් අගහිඟකම්වලට මුහුණ පෑ අවස්ථාවලදී විවිධ පුද්ගලයන්ට තම කුඹුරු උකස්කර ඇති ගොවියන් සමග ගිවිසුමක් ඇතිකර ගෙන, තම ණය ප්‍රති උපලේඛනගත කිරීම සඳහා කුරුණෑගල මැතිවරණ කොට්ඨාශයේ වීල්ගම්දෙමටාවේ මුදල් ණයට දෙන්නන් සමග කටයුතු පිළියෙල කරන ලදී. ගිවිසුම අත්සන් කිරීමෙන් පසු, මුදල් හිමියන් විසින් කුඹුරු ඉඩම් අයිතිකරුවන් වෙත පවරනු ලබන අතර, ගොවියන් විසින් තම තමන් ලබාගෙන ඇති ණය මුදල් පොලියත් සමග කොටස් වශයෙන් ආපසු ගෙවනවා ඇත.

මහජන බැංකුවේ, ලංකා බැංකුවේ හා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව ඉරිඟු වගා කිරීමේ ව්‍යාපෘතියක් මහියංගනයේ ආරම්භ කරන ලදී. අස්වැන්න නෙලා ගැනීමෙන් පසු එම ඉරිඟු, තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය විසින් මිළට ගන්නවා ඇත. නියාමක ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කරන ලද මෙම වගාව අක්කර 250 කට සීමා විය.

### සත්ත්ව පාලනය

ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය හා පෝෂණ මට්ටම නගා සිටුවීම සඳහාත් ඔවුනට අතිරේක ආදයම් මාර්ග සලසා දීම සඳහාත් සත්ත්ව පාලනය වැදගත් මෙහෙයක් ඉටු කරයි.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, එහි ප්‍රධාන ක්‍රියාකාරිත්වය වන සම්බන්ධීකරණය මගින් සත්ත්ව පාලනය අංශයේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය නංවාලීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයකින් දයක වී තිබේ.

### සත්ත්ව ආහාර

දිවයිනේ වියළි සාන්ද්‍ර සත්ත්ව ආහාර කර්මාන්තය ප්‍රමාණය අතින් මෙන්ම තත්ත්වය අතින් ද දියුණු වී තිබේ. විශේෂයෙන් ම කුකුළන් බෝ කිරීමේදී උසස් වර්ගයේ සතුන් මෙරටට හඳුන්වා දීමත් සමග උසස් තත්ත්වයේ සත්ත්වාහාර සඳහා ඉල්ලුම වැඩිවී තිබේ. ශ්‍රී ලංකාවේ කුකුළු කර්මාන්තයේ අවශ්‍යතාවලින් වැඩි කොටසක් සපයන, රාජ්‍ය අංශයේ ප්‍රධාන සත්ත්වාහාර නිෂ්පාදන ආයතනය වන ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය, තම නිෂ්පාදන සඳහා දේශීය වශයෙන් නිපදවන (ශක්ති ජනක) ද්‍රව්‍ය උපයෝගී කර ගනී. මෙම කර්මාන්තයට සැලකිය යුතු ප්‍රමාණයකින් දයකවන සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම වර්ෂ 1986 තුළ තම නිෂ්පාදන සඳහා ආනයනය කළ අමු ද්‍රව්‍ය උපයෝගී කර ගත්තේය. අඩු ධාරිතාවයකින් ක්‍රියාත්මක වන්නේ වී නමුදු, ආසන්න වශයෙන් දිනකට බිත්තර ලක්ෂ පහක් පමණ නිෂ්පාදනය කරන බිංගිරිය මැතිවරණ කොට්ඨාශයේ කුකුළු කර්මාන්තයේ අවශ්‍යතාවලින් වැඩි ප්‍රමාණයක් සපයන පෞද්ගලික වියළි සත්ත්වාහාර නිෂ්පාදකයන්ගෙන් ඉටුවන සේවය ද සැලකිය යුතු වන්නේ ය.

බලපත්‍ර නිකුත් කිරීමේ බලය ලත් ආයතනය මෙන්ම ශ්‍රී ලංකාවේ නිපදවනු ලබන සත්ත්ව ආහාරවල සම්මතයක් ලියා පදිංචි කිරීම පැවරී ඇති ආයතනය වන පශු පර්යේෂණ ආයතනය දැන් නීතිගත ආයතනයක් බවට පත් වී තිබේ. මෙම නීතිගත කිරීම, දේශීය වශයෙන් නිපදවනු ලබන සත්ත්ව ආහාරවල තත්ත්වය හා සම්මතයන් වැඩිදියුණු කිරීමෙහි ලා අත්‍යාවශ්‍ය කාර්යයක් ලෙස සැලකිය හැක.

### නිර්රෝමන්ථක කර්මාන්තය

ශ්‍රී ලංකාවේ කුකුළු කර්මාන්තයේ විශාල ප්‍රගතියක් 1986 දී පෙනෙන්නට තිබුණි. අළුතෙන් බලය ලත් නියෝජිතයන් ක්‍රියාකාරී වූ නමුදු, දවසක් වයසැති කුකුළු පැටවුන් සහ බ්‍රොයිලර් පැටවුන් සඳහා වැඩි ඉල්ලුමක් පැවතුනි. යෙදවුම්, ප්‍රධාන වශයෙන් කුකුළු පැටවුන් සැපයීමෙන්, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය කුකුළු පාලනය ග්‍රාමීය ප්‍රදේශ තුළ ව්‍යාප්ත කිරීමෙහි ලා

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික යෙදවුම් අංශය—වාර්ෂික වාර්තාව—1986

බෙහෙවින් ක්‍රියාත්මක විය. නිෂ්පාදනය අතින් සැලකිය යුතු වෙනසක් පෙන්නුම් නොකළ නමුදු, ඌරන් ඇති කිරීමේ කර්මාන්තය සංවර්ධනය වෙමින් පැවතුනි. එතකුදු වුවත්, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, එහි සම්බන්ධීකරණ වැඩ කටයුතු මගින්, පැටවුන් හා පුහුණු කිරීමේ වැඩ සටහන් ලබා දීමෙන් විශේෂයෙන්ම බහුල වශයෙන් ඌරන් ඇති කරනු ලබන ප්‍රදේශවලින් (හලාවත සිට කළුතර දක්වා) බැහැර මෙම කර්මාන්තය දියුණු කිරීමෙහිලා දයක විය.

**රෝමන්ථක කර්මාන්තය**

කිරි පට්ටි අංශයේ සංවර්ධනය වැඩි නිෂ්පාදනයක් ලබාදෙන ගවයන් බෝකිරීමේ අවශ්‍යතාව කෙරෙහි විශාල බලපෑමක් ඇති කළේය. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මෙන්ම වෙනත් පෞද්ගලික අංශයේ ගොවිපළවල්, කිරිපට්ටිකරුවන්ගේ ඉල්ලුම සපුරාලීමෙහි ලා අපොහොසත් වූ බැවින් බෝකරන සතුන්ගේ බරපතල හිඟයක් පැවතුනි.

මූලික වශයෙන් තම පවුලේ පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීම සඳහාත්, ඉන්පසු ආදායම් ඉපයීමේ මාර්ගයක් වශයෙනුත් ගොවි පවුලක් විසින් යටත් පිරිසෙයින් එක කිරි එළදෙනෙක් හෝ ලබා ගන්නා ලෙස කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් ගොවියන් උනන්දු කරවනු ලැබේ.

ස්වාභාවික පට්ටි දැමීම මගින් හා කෘතිම සිංචන වැඩ පිළිවෙල වල් මගින් තම ගව පට්ටිය දියුණු කිරීම උනන්දු කරවන අතර, ග්‍රාමීය ගොවියන් හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතයන් අතර, එවැනි වැඩ පිළිවෙලවල් සම්බන්ධීකරණය කරනු ලැබේ.

මිහින්තලේ හා මැදවච්චිය මැතිවරණ කොට්ඨාශවල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල එළුවන් බෝ කිරීමේ ව්‍යාපෘතිය තුළින් උතුරු මැද පළාතේ එළුවන් සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් සම්බන්ධීකරණය කරන ලදී. මෙය වනාහි පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ වැනි වෙනත් දිස්ත්‍රික්ක කරා ව්‍යාප්ත කිරීමට පෙර ආරම්භ කරන ලද නියාමක ව්‍යාපෘතියක් වන්නේය.

**පශු සේවා**

පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨවලට බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 25 සිට 45 දක්වා වැඩි කරනු ලැබූ නමුදු, එහි වැඩදායක ප්‍රතිඵල මෙතෙක් ලැබී නැත. පශු ශල්‍ය වෛද්‍ය ඇබෑර්තු තවමත් පවතින අතර, පශු විද්‍යා සහායක කාර්ය මණ්ඩලයේ ද පුරප්පාඩු තිබේ. පශු විද්‍යා සහායක කාර්ය මණ්ඩලයට නිලධාරීන් ලබා දීමේ වගකීම දැනට පැවරී ඇත්තේ වැලිසර හා මහකනදරාවේ පිහිටා ඇති සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුහුණු කිරීමේ ආයතන වෙතය.

**පශු සම්පත් නිකුත් කිරීම**

| ගවයන් වැස්සියන් | දෙනුන් | වස්සන් | දිනක් වයසැති කුකුළු පැටවුන් බිත්තර සඳහා | මස් සඳහා |
|---|---|---|---|---|
| 120 | 70 | 225 | 45,000 | 10,000 |
| ඌරු පැටවුන් | | | | එළුවන් |
| 350 | | | | 180 |

**සමාප්තිය**

මෙම අංශයට සභාපතිතුමාගෙන් ලැබුනු මහ පෙන්වීම හා අගනා සහාය ගැන අපි එතුමාට අතිශයින් ණයගැති වෙමු. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අප වෙත දක්වන ලද නොමසුරු සහයෝගය ගැන විවිධ අමාත්‍යාංශවල, රජයේ දෙපාර්තමේන්තුවල හා සංස්ථාවල, රාජ්‍ය බැංකුවල සහ පෞද්ගලික අංශයේ සංවිධානවල නිලධාරීන්ට අපගේ කෘතඥතාව පළ කරමු.

1987.02.27
කොළඹ.

ආර්. ටී. සී. පීරිස්,
අධ්‍යක්ෂ — යෙදවුම්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## අලෙවි අංශය—වාර්ෂික වාර්තාව—1986

**කෘෂිකාර්මික සංවර්ධනයෙහි අලෙවිකරණය**

"අලෙවි සංකල්පය" සුළු වශයෙන් අගය කිරීමට නැඹුරුවක් මෙම වසර තුළ දක්නට ලදී. කෘෂි අලෙවියෙහි පවතින ස්වාභාවික යාන්ත්‍රණවලට රජයේ නිලධාරීන්ගෙන් ඇතිවන ඇඟිලි ගැසීම් පෙරට වඩා මෙම වසරේ අඩු වූ බව පෙනෙන්නට තිබුණි. තවද, "පුද්ගලික වෙළෙන්ද" විවේචනය කිරීමේ අඩු වීමකුත් දක්නට ලැබුණි. සමහරවිට පුද්ගලික වෙළෙන්ද කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලියේ වැදගත් සහභාගිකරුවෙකු වශයෙන් පිළිගැනීමට ශ්‍රී ලංකාවේ පරිසරය සැකසෙනවා විය හැකිය.

> " නිපදවන ඕනෑම දෙයක් විකිණීමට වෑයම් කළ යුගය දැන් ඉවරයි. දැන් අප කළ යුත්තේ වෙළඳ පළට අවශ්‍ය දේ පමණක් නිපදවීමට ඉගෙන ගැනීමයි."

යනුවෙන් කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ ඇමතිතුමා සැප්තැම්බර් මස කළ ප්‍රකාශයෙන් "අලෙවිකරණය" කෙරෙහි මෙවැනි හිතකර ආකල්පමය වෙනස මුදුන්පත් වූවා යයි අපට සිතිය හැක.

එසේ වුවද, පරිපාලනමය වශයෙන් තීරණය කරන ලද මිල ගණන් කුමන අන්දමින් ප්‍රයෝජනවත් වේදැයි යන කරුණ සැක සහිත වුවත් වාරික වශයෙන් 'අවම මිල' ගණන් තීරණය කිරීම සඳහා නිෂ්පාදන පිරිවැය දත්ත පිරික්සීම නොනවත්වාම තවමත් කෙරීගෙන යයි.

නමුත්, අද පවතින වෙළඳ වාතාවරණයට අනුකූලව වඩාත් වැදගත් වන්නේ වෙනත් කරුණු අගැයීමත් ඒවා සාකච්ඡා කිරීමත් වේ. උදාහරණයක් වශයෙන්, අපි ජාත්‍යන්තර වෙළඳ රටාවේ බලවේග නොසලකා "අවම මිල නියම කිරීමේ විජ්ජා" මගින් ක්‍රම ක්‍රමයෙන් මිල උසස් කර ලෝක වෙළඳපොළෙන් අපව ඉවතට තල්ලු වී ඇත්ද? වසර කිහිපයකට ඉහත දී රටකජු සඳහා නියම කරන ලද අවම මිල වෙළඳපොල මිලට වඩා වැඩි වූ නිසා හොඳින් නොපැසුනු සහ නොවේලුනු රටකජු සැපයීමට ගොවීන් පෙළඹුනි. එපමණක් නොව උස් වූ අවම මිලවල් නියම කිරීමෙන් රජයේ ආයතනවල ගබඩා කිරීමේ කාලය වැඩිවීම කරනකොට ගෙන ඇති වූ ප්‍රමාදයන් හේතු වෙන් අවසානයේ දී බොහෝ පිළිකා කාරක විෂ (carcinogenic afflatoxins) එම කෘෂි භාණ්ඩ ඇතුළත හට ගත්තේය. මෙවැනි ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් අපගේ ජාත්‍යන්තර වෙළඳපොළේ සුභදතාවය පලුදු වූවාට සැක නැත. එමෙන්ම උසස්වූ කුරුඳු මිලවල් පවත්වාගෙන යෑමෙන් "කැසියා" නැමැති ආදේශ භාණ්ඩයකට පුරුදුවීමට විදේශ පාරිභෝගික යාට රුකුල් දීමක් කෙරුණි. දැන් ලෝක වෙළඳපොළේ අපගේ කුරුඳුවලට ඇති වන ඉල්ලුම බොහෝ සේ අඩු වී ඇත. දේශීය වෙළඳපොළේ පැවතුනු සමතුලිත මිලට ඉහළින් මිලක් අවම මිල වශයෙන් කල ඇට සඳහා පවත්වා ගෙන ගිය හෙයින් රජයේ මිල සහන ආයතනයන්හි ගබඩාවලට තල ඇට වලට එකතු වී අපද්‍රව්‍ය ද ගලා යාමට රුකුලක් විය. මෙමගින් වෙළඳ උමං මාර්ගය (marketing channel) තුළ දී ද ගොවි නිපැයුම් වල තත්ත්වය ක්‍රමයෙන් හීන වී යාම නිසා අවසාන වශයෙන් ඒවා සඳහා පිටරට ගැනුම්කරුවන්ගේ ඉල්ලුම පිරිහී ගියේය.

**වෙළඳ පොළවල් (විදේශ) දිනාගත හැක්කේ තාවකාලිකව ගොවීන්ට උදව් කිරීම සඳහා පරිපාලනමය වශයෙන් කෙටි කාලීන මිල නියම කිරීමේ ප්‍රතිපත්ති බිහි කිරීමෙන් නොවන බවත් ගනුදෙනුකරුවා/ගැනුම්කරුවා තෘප්තිමත් කිරීමට තුඩු දෙන තරඟකාරී වූ මිල කිරීමේ ප්‍රතිපත්ති වලින් සහ දිගුකාලීන උපායශීලී අලෙවිකරණ සැලසුම් වලින් බවත් අප විසින් අවබෝධ කර ගැනීමට කාලය දැන් එළඹී ඇත.**

ජාත්‍යන්තර සම්මුතියක් හේතුවෙන් ඉන්දියාවට ගලා යන කරාබු සඳහා තීරු බදු අඩු වීමෙන් මේ වනතෙක් මෙරට නිපදවන කරාබු සඳහා වෙනත් විදේශ වෙළඳපොළවල් සෙවීමට ඇති අපගේ උනන්දුව අඩු වී ඇත. ඒ නිසා තරඟකාරී අවස්ථාවකට මුහුණ දීමට අපගේ සූදානම ද අඩු වී ඇත. පාරිසරික සාධක වෙනස් වුවහොත් කුමක් සිදු වේ ද යන්න අනුමාන සහිතය. බුලත් අපනයනය කිරීමේ ඒකාධිකාරිය තවමත් රාජ්‍ය අංශය අතට පත්කර තිබීමෙන් තායිලන්තය වැනි දුරස්ථ තරඟකරුවන් ටද පාකිස්ථාන් වෙළඳපළට ඇතුල්වීමට අවකාශ වැඩි වෙමින් පවතී. පාකිස්ථාන් ගැනුම්කරුවන්ගේ අවධානය දිනෙන් දින අපගේ බුලත් කොලයෙන් ඉවත් වේ!!

කරදමුංගු සහ කරාබු සඳහා "අනිවාර්ය වෙන්දේසි" ක්‍රමයක් ඇති කිරීමෙන් මෙම කෘෂි ද්‍රව්‍යවල තත්ත්වය හෝ වෙළඳ පොළ විනිවිද වීමේ (market transparency) හැකියාව හෝ දියුණු වීමක් ඇති වී නැත. අලෙවියට මෙවැනි පහසුකම් ඇති නොවූ නමුත්, ඊට හාත්පසින්ම අහිතකර සිදුවීම් අනිවාර්ය වෙන්දේසි ක්‍රමය නිසා හටගෙන ඇත. ගැනුම්කරු හා විකුණුම් කරු එකම පුද්ගලයා වන "ජිමී ගොඩවල්" නොහොත් "බොරු හුවමාරු" සහ "පඹ ගනුදෙනු" වැඩි වී ඇත. ඇත්තෙන්ම මෙම අනිවාර්ය වෙන්දේසි වලින් ඇති වී ඇත්තේ අනවශ්‍ය බ්‍රෝකර් ගාස්තු සහ වැඩි වියදම් සහිත කොළඹ ගබඩා කිරීම වැඩි වීමත් ය. මෙහි ප්‍රතිඵලය වනුයේ අලෙවි තීරුව නොහොත් සමාජයට අලෙවි වියදම වැඩි වීමයි. අලෙවි තීරුව වැඩි වන විට අනිවාර්යයෙන්ම විකුණුම් මිල ද වැඩිවනු ඇත. එම නිසා මිල දී ගන්නා ප්‍රමාණය නියත වශයෙන්ම අඩුවනු ඇත. මෙවැනි අස්වාභාවික හැසිරීම් රටාවන් ඇති වී ඇත්තේ පරිපාලනමය බලපෑම් නිසා වේ. ඒවා වාණිජයේ හා වෙළඳාමේ අවශ්‍යතාවයන් මතුපිට හටගත් ක්‍රියා පිළිවෙලවල් නොවේ. වෙළඳපොළේ ක්‍රියාකාරිත්වයට මෙවැනි ඇඟිලි ගැසීම් ගොවීන්ගේ යහපතට අහිතකර වන අතර, ඒවායින් අවසාන වශයෙන් බොහෝ සේ පීඩා විඳින්නේ සුළු ගොවීන්ය.

අපනයනය සඳහා "සේවා සපයන හා බෙද හැරීමේ" මධ්‍යස්ථානයක් වශයෙන්, කන්ටේනර් ගාලක් වශයෙනුත්, අපනයනය සඳහා ගබඩා කිරීමේ, සැකසීමේ සහ ඇසිරීමේ කාර්යයන් පවත්වාගෙන යන ස්ථානයක් වශයෙනුත්, අපනයන කටයුතු කිරීම සඳහා බැංකු හා රක්ෂණ සේවා පවත්වා ගෙන යායුතු ස්ථානයක් වශයෙනුත් දැන් තදබදය අධිකව පවතින පිටකොටුව ප්‍රදේශය පාවිච්චි කිරීමේ ඇති අවශ්‍යතාවය එන්ට එන්ටම වැඩි වෙමින් පවතී. එසේ වුවත් මෙම පිටකොටුව ප්‍රදේශය පලතුරු හා එළවළු, අර්තාපල්, ලූනු, මිරිස්, තල යනාදිය සඳහා වූ කොළඹ තොග වෙළඳ පොළක් වශයෙන් තවදුරටත් පාවිච්චි කරගෙන යයි. ආහාර තොග බෙද හැරීමේ කාර්‍ය්‍ය සම්පූර්ණයෙන්ම කොළඹ නගර පර්යන්තයට ගෙන යාමේ තීරණය ප්‍රතිපත්ති පාලකයන් විසින් ගැනීමට අපොහොසත් වීමෙන් කොළඹ වරාය ප්‍රදේශය ලෝකයේ මෙම කලාපයේ භාණ්ඩ යළිත් අපනයනය (trans-shipment centre) කරන, මධ්‍යස්ථානයක් වශයෙන් දියුණු වීම ද පමා කෙරෙයි.

**කෘෂිකාර්මික අලෙවිය දියුණු කිරීමටත් එමගින් කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීමටත් අප විසින් ගත හැකි වැඩදායී පියවරක් නම් කෘෂිකාර්මික අලෙවිකරණය ව්‍යාප්ති සේවයක් (කෘ.අ.ව්‍යා.සේ.) ඇති කිරීමයි. මෙම කෘ.අ.ව්‍යා.සේ. ය "පුද්ගලික වෙළෙන්ද" සහ "සුළු ගොවියා" අතර සම්බන්ධය ශක්තිමත් කිරීමට යොද ගන්නා උපකරණයක්වනු විනා, මෙම සහභාගිකරුවන් දෙකොටස බෙද කිරීමට යොද ගන්නා "පවුරක්" නොවිය යුතුයි. කෘෂිකර්මයට සම්බන්ධව කටයුතු කරන නිලධාරීන් වෙළඳුන් කෙරෙහි "පොලිස් කාරයන්"**

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## අලෙවි අංශය—වාර්ෂික වාර්තාව—1986

**මෙන් හැසිරීමත් ගොවීන් කෙරෙහි ''දිලිසෙන සන්නාහ සන්නද්ධ සැරසුමෙන් යුත් නයිට් වරයෙකුගේ'' කාර්යභාරය දරන්නන් මෙන් හැසිරීමත් නැවැත්වීමට කාලය දැන් උදවී ඇත.** කෘ.අ.ව්‍යා.සේ. ය ගොවීනට උදව් කිරීමට අදාල වන කාර්ය අංශ කිහිපයක් ඇත. සමහරක් නම් ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවයන් මනාව සපුරාලීමට ගොවීන් දිරි ගැන්වීමත්, වෙළඳපළ ඉල්ලුමට ගැලපෙන වගා කිරීමේ රටාවක් ඔවුනට ඉගැන්වීමත්, සත්‍ය තත්ත්වය අනුව කෘෂි භාණ්ඩ ශ්‍රේණිගත කොට විකිණීමත්, ඉල්ලුමට අනුව අස්වනු නෙලීම ගැලපීමත් හා දෙපාර්ශ්වය (ගොවියා හා වෙළෙන්ද) අතර අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කරන වෙනත් කාර්යයන්ය. මෙසේ ගොවියන් උනන්දු කරවීමෙන් වෙළෙන්දට සේවය කිරීම කරණ කොටගෙන වෙළඳපොළේ තිබෙන තරඟකාරිත්වය වැඩිකර ගැනීමට එසේ කිරීම උපක්‍රමයක් වනු ඇත.

**දෙවනුව ගොවීන් විසින් වෙළෙඳුන්ට අවශ්‍ය මූලික පහසුකම් සැකසීමටත්, ඔවුන්ට පහසුකම් සැපයීමේ සේවාවන් පවත්වා ගෙන යාමටත් ගොවීන් යොමු කිරීම කෘ.අ.ව්‍යා.සේ.හි සේවක** පිරිසේ වගකීමක් වනු ඇත. ''විරුද්ධ පාර්ශ්වයේ අවාසිය'' (opponent pain) යන ක්‍රමයට හාත්පසින්ම වෙනස් ක්‍රියා පිළිවෙලක් වූ ''විරුද්ධ පාර්ශ්වයේ වාසිය'' (opponent gain) යන ක්‍රමය සහභාගිකරුවන් කණ්ඩායම් දෙක අතර විශ්වාසය වැඩි දියුණු කර ගැනීමට නියත වශයෙන්ම උපකාරි වනවා ඇත. මෙවැනි අදහස් ගොවීන්ගේ දෙරකඩටම වෙළඳුන් ගෙන්වා ගැනීමට අනුගමනය කළ යුතුව ඇති ක්‍රම වේ. මෙවැනි ''විරුද්ධ පාර්ශ්වයේ වාසිය'' යන සංකල්පය යටතේ කෘ.අ.ව්‍යා.සේ. යට ඇතුලත් වන කටයුතු රාශියක් වෙති. උදාහරණයක් වශයෙන් වාහනවලට ගාල් කිරීමේ ස්ථාන නොමැති වීම පිළිබඳව වෙළෙඳුන්ට ප්‍රශ්නයක් විය හැක. එවැනි ප්‍රශ්නයක් විසඳීම මෙම සංකල්පය යටතේ යොදාගත හැකි උපායක් වේ. බොහෝ අවස්ථාවල දී වාහන ගාල් කිරීමට, පසු දින උදයවන තෙක් නිදා ගැනීමට, ඔවුනට මුහුණ සෝදා ගැනීමට යනාදී පහසුකම් වෙළෙඳුන්ට නොමැත. තම ජීවිතය සහ දේපළවල ආරක්ෂාව වෙළෙඳුන්ට ඇති අවශ්‍යතාවයකි. වාහන අළුත්වැඩියා කර ගැනීම සහ ටයර්වලට පැච් දමා ගැනීම යන පහසුකම් සලසා දීම පාඩු මගහරවා ගැනීමට තුඩු දෙනු ඇත. එසේ නැතහොත් වෙළෙඳුන් ගෙන් කොල්ල කා ගැනීම් හෝ සොරා ගැනීම් හෝ මර්ධනය කිරීමට ගොවීන් විසින් ''සාමූහිකව කටයුතු'' කිරීම වේ. ''සරදියෙල්'' රඟපෑ චරිතය මෙන් සංචාරක වෙළෙඳුන්ගෙන් බිය ගන්වා මංකොල්ල කෑම සාමාන්‍යයෙන් නිතරම ශ්‍රී ලංකාවේ සිදුවන දෙයකි. මහමඟ හරස් කොට සහ බඩුබාහිරාදිය ඩැහැ ගනිතියි යන බිය නිසා ඉතා පාන්දරින්, හොඳටම එළිවීමට පෙර වෙළෙඳුන් ගම්බද පොළවලට ළඟා වීමට මැලිකමක් දක්වති. මෙවැනි අධික අවදානමක් ඇති වාතාවරණයක් කෘෂිකාර්මික සංවර්ධනයට හිතකර නොවේ.


**ග්‍රාමීය වෙළඳ පොල පවත්වන භූමිය තුල මුදල් සහ බැංකු පහසුකම් නොමැති වීම අලෙවි සංවර්ධනයට පසු බසින සුළු තවත් අඩුපාඩුවකි.** පොළ භූමියක් ඇතුළත හෝ අසල ග්‍රාමීය බැංකු කටයුතු පවත්වන බව ක්ෂේත්‍රයේ දක්නට නොලැබේ. ග්‍රාමීය වෙළෙඳුනට ප්‍රයෝජනවත් වන, පහසු වේලාවන්හිදී ග්‍රාමීය බැංකු විවෘත නොකෙරේ. කෘ.අ.ව්‍යා.සේ. යේ සේවක මණ්ඩලයට, වෙළඳුන් විසින් මුහුණ පාන මෙම ප්‍රශ්න විසඳා ගැනීමට උදව් විය හැකි අතර, මෙවැනි ප්‍රශ්න පවතින බවට ගොවීන්ගේ අවබෝධය වැඩි කළ හැක.

**ග්‍රාමීය වෙළඳපොළවල් පිළිබඳව සුපරීක්ෂාකාරීව කටයුතු කිරීමේ දී එම වෙළඳපොළවල් ක්‍රියාකරනාකාරය හදරා එම වෙළඳපොළවල කළමනාකරණයට මඟ පෙන්වීමට** කෘ.අ.ව්‍යා.සේ. සේවක පිරිසට මූලිකත්වයක් ගත හැක. පළාත් පාලන ආයතන විසින් පොළ බිම් කෘෂි නිෂ්පාදන වෙළඳ කටයුතු පහසු කරන ආයතන වශයෙන් යොදා නොගනී. ඒවා යොදා ගන්නේ එම පළාත් පාලන ආයතනයට ආදායමක් ලබාගන්නා මාර්ග වශයෙන් පමණි. මෙම නැඹුරුව කෘෂි කාර්මික සංවර්ධනයට තුඩු දෙන ලෙසට හැරවීමේ වගකීම පැමිණෙන්නේ කෘ.අ.ව්‍යා.සේ. යටයි. ග්‍රාමීය වෙළඳපොළ, දත්ත හා තොරතුරු එක්රැස් කිරීමේ හා විකාශනය කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් ගැමි පරිසරයට ඉතා වැදගත් ආයතනයකි. එම නිසා ගොවිජන සේවා මධ්‍යස්ථානය පොළ භූමියේ පිහිටුවීමෙන් ''යෙදවුම් සැපයීමේ'' කාර්යයන් ද ''නිමැවුම ගලා යැවීමේ'' කටයුතු ද එකම ස්ථානයක සම්බන්ධ කිරීම කෘෂි රටාවට මහත් සේ ඵලදායිතාවය වැඩි වන ක්‍රියා පිළිවෙලක් බව සිහි තබාගත යුතුව ඇත. මෙම කාර්යයේ ප්‍රයෝජනය පරීක්ෂා කර සනාථ කිරීමේ වගකීම කෘ.අ.ව්‍යා.සේ. යේ කටයුතු වලට ඇතුළත් වේ.

ඉහත සඳහන් කළ මෙම අදහස් වලට අමතරව, ''තරුසවෙපු'' **(කෘෂි නිෂ්පාදන වෙළඳාමේ නියැලීමට ග්‍රාමීය තරුණ තරුණියන් පුහුණු කිරීම) පාඨමාලාව පවත්වාගෙන යාමෙන් මෙම අංශය විසින් කෘෂිකාර්මික අලෙවිකරණය තවදුරටත් නගා සිටුවීමට උත්සාහ කරයි.** මෙම ''තරුසවෙපු'' පාඨමාලාව පදනම් වී තිබෙන මූලික ප්‍රතිපත්තිය නම් ''ස්වයං ශක්තිය'' හා ''ස්වයං ධෛර්යය ''වැඩි වර්ධනය කිරීම විනා ''අනුන්ගෙන් නඩත්තු වීම'' හා ''අනුන් මත යැපීම'' නොවේ. මෙම වසර තුළ කුරුණෑගල මොනරාගල, පොලොන්නරුව, මහනුවර බදුල්ල හා කෑගල්ල යන දිස්ත්‍රික්කවල තවත් අභ්‍යාසලාභීන් 74 දෙනෙක් පුහුණු කරන ලදී.

පුහුණුවෙන් පසු වාණිජ හැකියාවන් දියුණු කර ගත් පුහුණුව ලත් අය සිටින බව පසු ව්‍යාපෘති විමසීම් වලින් හෙළිදරව් වේ. සමහර අය ක්‍රමානුකූලව ශ්‍රේණිගත කිරීමෙන් වෙළඳ කටයුතු වර්ධනය කරගෙන තිබුණි. ඇතැම්හු වී කෙටීමේ සහ තැම්බීමේ කටයුතු අරඹා තිබුණි. වෙනත් අය වෙළඳපළවලට භාණ්ඩ සැපයීමේ දී පාරිභෝගික අවශ්‍යතා අනුව හැඩ ගැසීමෙන් වෙළඳ ව්‍යාපාර දියුණු කරගෙන තිබුණි. කෘෂි භාණ්ඩ එක්රැස් කිරීමේ දී ව්‍යාපාරය පවත්වාගෙන යාමට වඩාත් සුදුසු ස්ථානය කොතැන විය යුතු ද යන කරුණ ගැන අවධානය යොමු කර එමගින් ලාභ වැඩි කරගෙන තිබුණි. බොහෝවිට ''තරුසවෙපු' පුහුණු වූවන්ගේ වාණිජ හැසිරීම අලෙවි සංකල්පය අනුව හැඩ ගැසෙයි.

පෙර වතාවල දී ''තරුසවෙපු'' පාඨමාලාව හදරා සාර්ථකව වෙළඳ කටයුතු කරන පුහුණු වූවන්, පවත්වාගෙන යන ''තරුසවෙපු'' වැඩ සටහන් වල අභ්‍යාසලාභීන් පුහුණු කරන්නන් නැතහොත් දේශක මහතුන් වශයෙන් සහභාගී වෙයි. මෙම ක්‍රමය අනුගමනය කිරීමෙන් අලුත් අය තුළ ''තරුසවෙපු'' පාඨමාලාව පිළිගැනීම වැඩිවනු ඇත. තමාගේ මෙන්ම සමාන අත්දැකීම් හා සමාන පසුබිම් ඇති පුහුණුව ලත් වෙළඳ මහතුන්ගේ අත්දැකීම් ඇසීමෙන් අලුත් අභ්‍යාසලාභීන්ට වඩා පහසුවෙන් අවබෝධ කර ගැනීමට හැකිවෙනු ඇත.


RICE PRICES
PRICES Rs/kg
STOCK ('000 mt)
SAMBA RICE
Gr I
Gr II
LEVEL OF STOCKS OF [ALL] RICE WITH GOVT. AGENCIES MEASURED AT END OF EACH MONTH
Gr I '85
Gr II '85
Gr I '86
Gr II '86
J F M A M J J A S O N D
RAW RICE
R - Red
W - White
R '85
W '85
R '86
W '86
Rs/kg
PAR BOILED RICE
K - Kora
N - Nadu
K '85
K '86
N '85
N '86

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## අලෙවි අංශය—වාර්ෂික වාර්තාව—1986

වගු අංක 1 සහල් සහ පිටි සැපයුම: 1980–1986 ('000 මෙ.ටො.)

| | සහල් | | | පිටි | එකතුව |
|---|---|---|---|---|---|
| වර්ෂය | සමාන වී ප්‍රතිදානය | ආහාර පාලක විසින් ආනයන | මුළු සහල් (2+3) | | (4+5) |
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 1980 | 1,431 | 189 | 1,620 | 378 | 1,998 |
| 1981 | 1,486 | 157 | 1,643 | 441 | 2,084 |
| 1982 | 1,431 | 161 | 1,591 | 423 | 2,014 |
| 1983 | 1,653 | 123 | 1,776 | 432 | 2,208 |
| 1984 | 1,598 | 28 | 1,626 | 416 | 2,042 |
| 1985 | 1,752 | 172 | 1,924 | 402 | 2,326 |
| 1986 | (1) 1,700 | 220 | 1,920 | 451 | 2,371 |

(1) වී ප්‍රතිදානය = 80.8 බුසල් දශලක්ෂ (මහ) + 41.6 බුසල් දශලක්ෂ (යල -ගණන් බලා ඇති)
= 122.4 වී බුසල් දශලක්ෂ
= 17,00,000 සහල් මෙට්රික් ටොන්.

විශේෂයෙන්ම වාණිජ ආයතනවලට සහ අපනයනකරුවන්ට අප විසින් පවත්වාගෙන ගිය අලෙවි තොරතුරු සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලිය, ගනුදෙනු වේගවත් වීම පහසු කිරීමේ අදහසින් මෙම වසර තුළ ද පවත්වාගෙන ගියෙමු. කොළඹ වෙළඳපළ මිල ගණන් සම්බන්ධ පවත්වන සතිපතා මිල ගණන් එක්රැස් කිරීමේ සමීක්ෂණය මෙම වසර තුළ ද ප්‍රතිපත්ති සම්පාදනයට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා කරගෙන යන ලදී. 1980 – 1986 දක්වා මෙරටට පිටි සහ සහල් සැපයුම අංක 1 වගුවෙන් පෙන්නුම් කර ඇත. 1985 සහ 1986 යන වසරවල දී විවිධ සහල් වර්ගවල මිල වෙනස්වීම් ප්‍රස්ථාර අංක 1 න් පෙන්නුම් කෙරේ.

දේශීය රතුලූනු, අර්තාපල් හා වියලි මිරිස් අස්වැන්න තක්සේරු කිරීමට මෙම වසර තුළ බොහෝ ක්ෂේත්‍ර අධ්‍යයනයන් කරන ලදී. සතිපතා පවත්වන ජීවන වියදම් මට්ටම පිළිබඳව සලකා බැලීමේ දී මෙම දත්තයන් ප්‍රතිපත්ති සම්පාදනයට ප්‍රයෝජනවත් වෙනු ඇත. වෙළඳ හා නාවුක අමාත්‍යාංශයෙන් ගම්බද ප්‍රදේශවල අලෙවිකරණය සම්බන්ධ පවත්වන ලද වාරික වැඩ සටහන් වලට ද අපනයන අවම මිල කමිටුවට ද අපි සහභාගි වූයෙමු.


(ආචාර්ය උපාලි නානායක්කාර),
අධ්‍යක්ෂ–අලෙවි
කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ව්‍යාපෘති ඇගයීමේ අංශය—වාර්ෂික වාර්තාව—1986

### 1. හැඳින්වීම

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති ඇගයීමේ අංශය සතු කාර්ය භාරයන් වනුයේ රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශවල කෘෂි ව්‍යාපාරික වැඩ කටයුතු හඳුනා ගැනීම ක්‍රමවත් කිරීම, ඇගයීම සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් නිසි පරිදි යොමු කිරීමත් ය. ව්‍යාපාරික අවස්ථා ගැන තොරතුරු සැපයීමෙන්, අලෙවි තත්ත්වයන් පිළිබඳ දැනුම ලබා දීමෙන්, සක්‍යතා අධ්‍යයන සකස්කර දීමෙන්, රජයේ ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම සඳහා මග පෙන්වීමෙන් සහ වාණිජ හා සංවර්ධන ආයතනවලින් ඒ සඳහා අවශ්‍ය මුදල් ලබා දීමෙන් මෙම අධිකාරිය, කෘෂිකාර්මික ව්‍යාපාරවල මුදල් යෙද වීමේ හැකියාවක් ඇති ආයෝජකයන්ට සහාය වන්නේය.

### 2. කාර්ය මණ්ඩලය

වර්ෂ 1983 දී මෙම අංශය ආරම්භ කළ දිනයේ පටන් එහි අධ්‍යක්ෂ වශයෙන් සේවය කළ ආචාර්ය නෙල්සන් විතානගේ මහතා, එක්සත් ජාතීන්ගේ විදේශීය පත්වීමක් භාර ගැනීම සඳහා මෙම ආයතනයේ සේවයෙන් අස්වී ගියෙන්, එම තන තුරට 1986 අගෝස්තු මාසයේ සිට පහත අත්සන් කර ඇති අය පත්කරනු ලැබීය.

### 3. ශ්‍රී ලං./එ.ජ.ඒ.කෘ.උ.ක

ශ්‍රී ලංකා/එක්සත් ජනපද ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුවේ ලේකම්වරුන් වශයෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය තවදුරටත් ක්‍රියා කළේය. පෞද්ගලික අංශයේ එක්සත් ජනපද හවුල්කරුවන්ගේ සහයෝගීතාවය ඇතිව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය හා කෘෂි ව්‍යාපාර නංවාලීමේ අරමුණ ඇතිව වර්ෂ 1983 දී මෙම කමිටුව පිහිටුවන ලදි. මෙම කමිටුවේ ව්‍යාපෘති සම්බන්ධයෙන් කෘෂිකාර්මික අධිකාරියේ ව්‍යාපෘති අංශය ක්‍රියා කරයි. යූ.එස්.ඒ.අයි.ඩී. මාර්ගයෙන් ආහාර සකස් කරන්නන්ට තාක්ෂණික සහාය හා තොරතුරු සපයන 'ව්‍යාපෘති නඩත්තු කිරීමේ වැඩ පිළිවෙල ''සම්බන්ධීකරණය කරන්නේද මෙම කමිටුව මගිනි.

විවිධ ව්‍යාපෘති පිළිබඳ 1986 දී පැවති තත්ත්වය පහත දක්වා ඇත.

### 3.1. මඤ්ඤොක්කා

මේ වූ කලී ශ්‍රී ලංකාවේ කාර්මික රසායන සමාගමේ සහ එක්සත් ජනපදයේ වික්ස්බර්ග් රිෆයිනිං සමාගමේ ඒකාබද්ධ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත්තේ මඤ්ඤොක්කා වගා කර එම මඤ්ඤොක්කා අලවල පිටි වලින් ඩෙක්ස්ට්‍රින් නමැති මැලියම් නිෂ්පාදනය කිරීමයි. මෙම ව්‍යාපෘතියේ වැඩ කෙරීගෙන යන අතර, මැලියම් සකස් කරන ඒකකයේ වැඩ දැන් නිම වෙමින් පවතී. වාණිජ බැංකුවකින් ණය ලබා ගැනීමේ ප්‍රමාදයක් ඇති වූ බැවින්, 1986 ඔක්තෝබර් මාසයේදී මෙය ජාතික සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කරන ලදි. ඇස්තමේන්තුකර ඇති මූලධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 6.5 කි.

### 3.2. කිරි ගවයන්

මේ වූ කලී මූලික ගව ගාලක් උපයෝගී කර ගනිමින් දේශීය ගවයන්ගේ තත්ත්වය උසස් කිරීමේ කිරි පට්ටි සංවර්ධන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකාවේ කෘෂිකාර්මික තාක්ෂණවේදී ආයතනය (ඒ.ටී.ඒ.) විදේශීය සහභාගිකරුවන් වන අතර, සීමාසහිත ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්ලිව්.ඊ.) දේශීය කොටස්කරුවන් වේ. 1986 ජූනි මාසයේදී ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගමේ සභාපති ඇමෙරිකාවේ කෘෂිකාර්මික තාක්ෂණවේදී ආයතනයේ (ඒ.ටී.ඒ.) ජේ. ආර්. රයින්හාට් මහතා සහ වෙනත් අය සමග මෙහි සක්‍යතා වාර්තා පිළිබඳ කටයුතු අවසන් කිරීම සාකච්ඡා කරන ලදි. සක්‍යතා වාර්තාව සමාප්ත කිරීමේ දේශීය කණ්ඩායම තම ආයතනය වෙත එවන මෙන් අමෙරිකාවේ කෘෂිකාර්මික තාක්ෂණවේදී ආයතනය ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගමේ සභාපතිගෙන් ඉල්ලා ඇත. පෝබ්ස් පිනැන්ෂල් සර්විසස් සමාගම විසින් සියලුම වාර්තා අධ්‍යයනය කර ඇති අතර යථා කාලයේදී ව්‍යාපෘතියේ ක්‍රියාකාරී වාර්තාව ඉදිරිපත් කරනවා ඇත.

### 3.3. කන්තලේ හා හිඟුරාන සීනි කර්මාන්ත

මෙය වූ කලී කන්තලේ හා හිඟුරාන දැනට පිහිටා ඇති සීනි සංකීර්ණ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියකි. එක්සත් ජනපදයේ ආසියාන් එන්ටප්‍රයිසස් සහ ශ්‍රී ලංකාවේ සීමාසහිත මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම මෙම ව්‍යාපෘතියේ අනුග්‍රාහකයෝ වෙත්. ව්‍යාපෘති යෝජනාව වන්නේ ආසියාන් එන්ටප්‍රයිසස්/සීමාසහිත මර්කන්ටයිල් ක්‍රෙඩිට් සහ ශ්‍රී ලංකා රජය සහභාගී කරුවන් වශයෙන් යොදවාගෙන ඒකාබද්ධ ව්‍යාපාර සමාගමක් පිහිටුවීමයි. කළමනාකරණ වැඩ සටහනේ අංගයක් වශයෙන්, කර්මාන්තශාලා හා කෘෂිකාර්මික පුනරුත්ථාපනය සංවර්ධනය කරා, ක්‍රියාත්මක කර, වර්තමාන සීනි නිෂ්පාදනය අවුරුදු 3 ක් නොහොත් 5 ක් ඇතුළත දෙගුණ කිරීමට ආසියාන් එන්ටප්‍රයිසස්/සීමාසහිත මර්කන්ටයිල් ක්‍රෙඩිට් යෝජනා කරයි. ආසියාන් එන්ටප්‍රයිසස්/සීමාසහිත මර්කන්ටයිල් ක්‍රෙඩිට් මගින් යෝජනා කර ඇති පරිදි ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා, මෙය ක්‍රියාත්මක කෙරෙන පළමු වසර තුළ නව ප්‍රාග්ධන වශයෙන්, එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 6 කට ආසන්න මුදලක් යෙදවිය යුතු වන්නේය. මෙම පුද්ගලික සමාගමක් බවට පත් කිරීම සඳහා ඉදිරිපත් වී ඇති යෝජනාව සළකා බලා තීරණයක් ගැනීම පිණිස ඇමති මණ්ඩලය වෙත යොමුකර තිබේ.

### 3.4. මස් ගවයන්

මේ සඳහා එක්සත් ජනපදයේ සීමා සහිත මූස්හිල් සමාගම විදේශීය සහභාගිකරුවන් වන අතර, සීමාසහිත සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් සමාගම දේශීය සහභාගිකරුවෝ වෙත්. ශ්‍රී ලංකාවේ මස්, ගව, හා භෝජනාගාර ව්‍යාපෘතියක් ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. විදේශීය ආයෝජන උපදේශක කමිටුවේ, අනුමතිය ලැබීම දක්වා මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගමන් කර ඇති අතර, මේ පිළිබඳ, කෝල්ඩ් ස්ටෝර්ස් සමාගමේ කිසියම් දෙගිඩියාවක් පවතින බවක් පෙනෙන්ට තිබේ. මෙම ව්‍යාපෘතිය සඳහා වෙනත් දේශීය ගොවිකාර්මික කණ්ඩායමක් මෙහෙයවීමට කොළඹ ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව දැන් අදහස් කරයි. මේ සඳහා ඇස්තමේන්තු කළ මුළු ප්‍රාග්ධන වියදම ඇමෙරිකානු ඩොලර් 5,00,000 කි.

### 3.5. සුදු ළූණු

මේ වනාහි නිෂ්පාදනයෙන් 75% ක් අපනයනය කිරීම සඳහා සුදු ළූණු වගා කිරීමේ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය විදේශීය ආයෝජන උපදේශක කමිටුව විසින් 1986 ජූනි මාසයේ දී අනුමත කරන ලදි. ඇමෙරිකා එක්සත් ජනපදයේ සී. ජෝන් ජෙනුආඩ් මහතා මේ සඳහා විදේශීය හවුල්කරු වන අතර, සීමාසහිත පී. එන්. ජේ. කෘෂිකාර්මික නිෂ්පාදන (පෞද්ගලික) සමාගම දේශීය අනුග්‍රහකයෝ වෙති. අපේක්ෂිත මුළු ආයෝ-

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## ව්‍යාපෘති ඇගයීමේ අංශය– වාර්ෂික වාර්තාව—1986

ජනය රුපියල් මිලියන 17.4 වන අතර, එයින් රුපියල් මිලියන 2.4 ක් විදේශීය හවුල්කරුගේ ආයෝජක දයක මුදල වේ.

### 3.6. කාබනිකෘත තේ

ඇමෙරිකා එක්සත් ජනපදයේ අලෙවිය සඳහා ශ්‍රී ලංකාවේ සාන්ද්‍රණය කළ තේ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදි. මේ සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ මිසිසිපිහි විධා සංයුක්ත මණ්ඩලයේ මයිකල් වෙනි මහතා විදේශීය අනුග්‍රාහකයා වූ අතර, ශ්‍රී ක්‍රිෂ්ණා සංයුක්ත මණ්ඩලය දේශීය හවුල්කරුවන් වූහ. ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණ මණ්ඩලය විසින් මේ සඳහා රසායනාගාර මට්ටමේ සාම්පල් සාදා ඇති අතර, එම සාම්පල්වලින් එක්සත් ජනපදයේ මිළට ගන්නෝ සැහීමකට පත් වූහ. මෙම පානය අපනයනය කිරීම සඳහා වාණිජ වශයෙන් නිෂ්පාදනය කිරීමේ ඒකාබද්ධ ව්‍යාපාර යක් සඳහා ශ්‍රී ක්‍රිෂ්ණ සංයුක්ත මණ්ඩලය තේ පර්යේෂණ ආයතනය හා තේ මණ්ඩලය සමග ක්‍රියා කරයි.

### 3.7. වැනිලා

ශ්‍රී ලංකාවේ නිපදවන ලද හොඳින් සකස් කළ වැනිලා කරල් වර්ෂයකට මෙට්‍රික් ටොන් 300 ක් දක්වා ප්‍රමාණයක් මිළට ගැනීමට ඇමෙරිකා එක්සත් ජනපදයේ මේරිලන්ඩ් හි මැක් කොමික් සමාගම අදහස් කරයි. ශ්‍රී ක්‍රිෂ්ණා සංස්ථාව මෙම ව්‍යාපෘතිය කෙරෙහි උනන්දුවක් දක්වා ඇතත්, වාණිජමය මට්ටමකින් වැනිලා වගා කිරීමට ඔවුන්ට නොහැකි වී තිබේ. ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව දන්, වැනිලා වගා කිරීම කෙරෙහි සුළු ඉඩම් හිමියන් සහභාගි කරවා ගැනීමේ අටියෙන්, ගම්බද අපනයන නිෂ්පාදන සංවිධානය කිරීමෙහි ලා අපනයන සංවර්ධන මණ්ඩලයේ බලධාරීන් සමග සාකච්ඡා පවත්වති. මේ සඳහා මහවැලි අධිකාරියෙන් සහ රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ඉඩම් ලබා ගැනීමටද සාකච්ඡා පවත්වාගෙන යනු ලැබේ. කෘෂිකාර්මික තොරතුරු සැපයීම සඳහාත් උසස් තත්ත්වයේ වියලීම සඳහා තමන්ගේම සකස් කිරීමේ ක්‍රම සලසාදීම සඳහාත් මැක්කොමික් සමාගම පස් අවුරුදු සංවර්ධන සැලැස්මක් සලකා බලාගෙන යයි.

### 4. විමසුම් අවධියේ ඇති ව්‍යාපෘති

4.1 පැපොල් වගා කිරීම හා පැපේන් සකස් කිරීම
4.2 වැල්දෙඩම් වගා කිරීම හා වැල් දෙඩම් යුෂ සකස් කිරීම
4.3 ගර්කින් වගා කිරීම හා අපනයනය සඳහා ගර්කින් සකස් කිරීම
4.4 සීනි නිෂ්පාදනය හා සකස් කිරීම
4.5 සොයා කිරි
4.6 පොල් ලෙලි කැබලි
4.7 කොකෝවා වගා කිරීම

### 5. ව්‍යාපෘති සකස් කිරීම

වියළි කලාපයේ නොගැඹුරු කෘෂි ළිං 11,000 ක් ඉදි කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් පිළියෙල කර 1986 ඔක්තෝබර් මාසයේදී රජය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වාරිමාර්ග පහසුකම් සැපයීමෙන් වියළි කලාපයේ වැඩි ඉඩම් ප්‍රමාණයක් තුල වේගවත් ලෙස/සාර්ථක ලෙස අතිරේක ආහාර බෝග වගා කිරීමයි. ආරම්භයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහ උතුරු පළාතේ ඉඩම් මෙම ව්‍යාපෘතියට ඇතුළත් කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සඳහා වන මූල ධන ආයෝජනයට රුපියල් දශ ලක්ෂ 330 ක් වනු ඇතැයි ගණන් බලා තිබේ. සහනාධාරයක් වශයෙන් රජයෙන් යෙදවීමට යෝජනා කර ඇති මුදල රුපියල් දශලක්ෂ 165 කි. අක්කර දෙකක ගොවිපළකින් ලැබිය හැකි දළ ආදයම රුපියල් 37,200 ක් යැයි ගණන් බලා ඇති අතර, අක්කර 22,000 න් ලබාගත හැකි මුළු ආදයම ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 409 ක් වන්නේය. ඒ අනුව ඉතිරි විය හැකි විදේශ විනිමය ප්‍රමාණය ඒ හා සමානවනවා ඇත. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගන්නා ලදී.

කුකුළු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා කුකුළන් බෝ කිරීමේ ගොවිපොළක් හා බිත්තර රකින තැනක් සඳහා සක්‍යතා අධ්‍යයනයක් සකස් කරන ලදි. ඉන්කියුබේටර් (බිත්තර රකින) යන්ත්‍රයේ ප්‍රතිදනය වර්ෂයකට කුකුළු පැටවුන් 1,00,000 කි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ වියදම රුපියල් දශ ලක්ෂ 1.9 කි. ව්‍යාපෘති කාලය අවුරුදු 10 ක් ය යන පදනම මත අභ්‍යන්තර ලාභ ප්‍රමාණය 17.5% කි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දවසක් වයසැති බිත්තර කුකුළු පැටවුන් හා මස් පිණිස ඇතිකරන කුකුළු පැටවුන් සඳහා ඇති ඉල්ලුම වැඩි වෙමින් පැවති නිසා ඉන්කියුබේටර් යන්ත්‍රයක් පිහිටුවීමෙහි ඇති මූල්‍යමය වාසිදයක බව මුදල් ආයෝජකයන්ට මග පෙන්වීමක් වශයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

### 6. පිරික්සීම හා ඇගයීම

මෙම අංශය පැල්වත්ත සීනි සංකීර්ණය භෞතික වශයෙන් ලබන ප්‍රගතිය පිරික්සන අතරම, මෙම සමාගමේ පාලක පක්ෂය හා සංගම් සමග එකමුතුව ක්‍රියා කරයි. 1986 දෙසැම්බර් අවසාන යේදී මෙම ව්‍යාපෘතිය මගින් ඉඩම් අක්කර 17,295 ක් එළි පෙහෙළි කර තිබුණු අතර, අක්කර 10,960 ක උක් වගා කර තිබුණි. සීනි කර්මාන්තශාලාවේ වාණිජ වැඩ කටයුතු 1986 ජූනි මාසයේදී ආරම්භ කරනු ලැබූ අතර, වර්ෂය අවසානයේදී පැල්වත්ත සීනි කම්හල මගින් නිෂ්පාදනය කරන ලද සුදු සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 13,116 ක් විය. පැල්වත්ත සීනි සමාගම විසින් උක් වගා කරන ගොවීන් 185 දෙනෙක් පදිංචි කරවනු ලැබූ බවත්, වර්ෂ 1986 දී එක් එක් පවුලක් මගින් සමාගමට තම පළමු වැනි උක් අස්වැන්න විකිණීමෙන් සාමාන්‍ය-යෙන් රු. 34,000 ක ශුද්ධ ආදයමක් ලබා ගත් බවත් සැලකිය යුතු කරුණකි. ඉඩම් කොටස් යෝජනා ක්‍රමය යටතේ ඉතිරිව ඇති ඇබෑර්තු 1,100 සඳහා සීනි සමාගම වෙත දනට ඉල්ලුම් පත්‍ර 20,000 ක් ලැබී තිබේ. අමු ද්‍රව්‍ය වශයෙන් උක් පැණි උපයෝගී කරගෙන ශ්‍රී ලංකාවේ පාන් පිළිස්සීම සඳහා භාවිත කෙරෙන යීස්ට් නිෂ්පාදනය කර අලෙවි කිරීමේ යෝජනාවක් පිළිබඳව ඇගයීමක් කරන ලදී. මේ වූ කලී පෝබ්ස් හා වෝකර් සමාගමේ උපකාරක සමාගමක් වන, ස්පයිසස් ඇන්ඩ් එසන්ස් (ලංකා) සහ ඕස්ට්‍රේලියාවේ සීමා සහිත මයුරිපුඩ්ස් සමාගම්වල (බාර්න්ස් හා පිලිප්ස් සමාගමේ උපකාරක සමාගමක් වන) ඒකාබද්ධ අනුග්‍රහයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවකි. අවුරුදු පතා යීස්ට් මෙට්‍රික් ටොන් 1,200 කට අධික ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන බැවින් මෙම ව්‍යාපෘතිය සලකා බැලිය යුතු වන්නේය. වර්ෂ 1985 දී රුපියල් දශ ලක්ෂ 82.5 ක් වටිනා යීස්ට් මෙට්‍රික් ටොන් 1,216 ක් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 106 කි. මෙම යෝජනාව අනුමතිය සඳහා විදේශීය ආයෝජන උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කර තිබේ.

රජරට ආහාර ධාන්‍ය සකස් කිරීමේ සමාගමේ සභාපතිතුමාගේ උපදෙස් පරිදි, ඉදිරියට බලපවත්වන කොන්ත්‍රාත්තුවක් මගින්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ව්‍යාපෘති ඇගයීමේ අංශය— වාර්ෂික වාර්තාව—1986

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවියන්ගෙන් සෝයා බෝංචි මිළට ගැනීම සඳහා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය සමග ගිවිසුමක් අත්සන් කරන ලදි. 1986 වර්ෂය තුළ මෙම සමාගම මගින් ගොවියන්ගෙන් මිළට ගනු ලැබූ සෝයා බෝංචි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 122.7 ක් විය.

**7. කාරක සභා මගින් කරුණු ඉදිරිපත් කිරීම**

කුඩා තේ, පොල් හා රබර් වතු හිමියන්ගේ අංශය සඳහා 1985 සිට ක්‍රියාත්මක වන මධ්‍යකාලීන ආයෝජන වැඩ පිළිවෙලක් සකස් කරන කාරක සභාවක මෙම අංශය කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය නියෝජනය කරයි.

මෙම අංශයේ අධ්‍යක්ෂ ශ්‍රී ලංකා/ජපන් ව්‍යාපාර සහයෝගතා කමිටුව ද නියෝජනය කරන්නේය. අන්‍යෝන්‍ය සහයෝගතා ඉලක්ක වෙත යොමු වූ වෙළඳාම හා ආයෝජන මෙම කමිටුව මගින් ඉහළ නංවනු ලැබේ.

**8. සාමාන්‍ය කරුණු**

ශ්‍රී ලංකාවේ වාණිජ හා කර්මාන්ත සමිති සම්මේලනයේ හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතියේ සහභාගිත්වය ඇතිව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලදුව, 1986 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලද "සංක්‍රාන්ත සංස්ථා සමග ඒකාබද්ධ ව්‍යාපෘති සාකච්ඡා කිරීම" යටතේ පවත්වන ලද නේවාසික වැඩ මුළුවකට මෙම අංශයේ අධ්‍යක්ෂ සහභාගි විය.

**ඒ. බී. ඩී. පී. වික්‍රමරත්න**
අධ්‍යක්ෂ — ව්‍යාපෘති අංශය
1987.03.13.
කොළඹ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් අවුරුද්දේ ශේෂ පත්‍රය

| | | | 1986 | 1985 |
|---|---|---|---|---|
| | | | රු. ශ. | රු. ශ. |
| (අ) ප්‍රයෝජනයට ගත් සම්පත් | | | | |
| අනුමත ප්‍රාග්ධනය ... ... | | | 20,000,000.00 | 20,000,000.00 |
| ලබාගත් ප්‍රාග්ධනය | | | | |
| රජයේ දායක මුදල් ... ... | | | 500,000.00 | 9,951,300.00 |
| පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙනාවා... | | | 37,902,499.00 | 27,951,199.00 |
| | | | 38,402,499.00 | 37,902,499.00 |
| අඩුකළා : | රු. ශ. | | | |
| 85.12.31 දිනට ක්ෂයවීම් වශයෙන් අඩුකළා | 13,523,931.44 | | | |
| 86.12.31 දිනට ක්ෂයවීම් වශයෙන් අඩුකළා | 3,755,823.03 | | 17,279,754.47 | |
| | | | 21,122,744.53 | |
| අඩුකළා : | | රු. ශ. | | |
| 85.12.31 දිනට ආදායම හා වියදම ශේෂය | | 2,512,706.06 | | |
| කලින් වර්ෂය සඳහා සකස් කිරීම ... | | (701,636.14) | | |
| ප්‍රවර්තන වර්ෂයේ හිඟය ... | | (1,445,158.31) | 365,911.61 | (11,011,225.38) |
| | | | 21,488,656.14 | 26,891,273.62 |

| (ආ) නියෝජනය කළා : ස්ථාවර වත්කම් | සටහන | ගත් මිළ | සමුච්චිත ක්ෂයවීම | ශුද්ධ අගය | |
|---|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උපලේඛනය අනුව ... ... | 1 | 36,659,098.22 | 16,256,821.55 | 20,402,276.67 | 25,019,548.80 |
| ව්‍යාපාර ප්‍රාග්ධනය ජංගම වත්කම් ... ... | 2 | — | 1,797,445.50 | | 7,070,919.53 |
| අඩු කළා : ජංගම බැරකම් ... ... | 3 | — | 711,066.03 | 1,086,379.47 | 5,199,194.71 |
| | | | | 21,488,656.14 | 26,891,273.62 |

ආර්. විජේරත්න මහතා
සභාපති

එච්. එම්. සී. කපිලරත්න මහතා
මණ්ඩල අධ්‍යක්ෂ

එස්. සී. හතරසිංහ මිය
ප්‍රධාන ගණකාධිකාරී

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් අවුරුද්දේ ශේෂ පත්‍රය

| | | | 1986 | 1985 |
|---|---|---|---|---|
| | | | රු. ශ. | රු. ශ. |
| **(අ) ප්‍රයෝජනයට ගත් සම්පත්** | | | | |
| අනුමත ප්‍රාග්ධනය ... ... | | | 20,000,000.00 | 20,000,000.00 |
| **ලබාගත් ප්‍රාග්ධනය** | | | | |
| රජයේ දායක මුදල් ... ... | | | 500,000.00 | 9,951,300.00 |
| පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙනාවා... | | | 37,902,499.00 | 27,951,199.00 |
| | | | 38,402,499.00 | 37,902,499.00 |
| **අඩුකළා :** | රු. ශ. | | | |
| 85.12.31 දිනට ක්ෂයවීම් වශයෙන් අඩුකළා | 13,523,931.44 | | | |
| 86.12.31 දිනට ක්ෂයවීම් වශයෙන් අඩුකළා | 3,755,823.03 | | 17,279,754.47 | |
| | | | 21,122,744.53 | |
| **අඩුකළා :** | | රු. ශ. | | |
| 85.12.31 දිනට ආදායම හා වියදම ශේෂය | | 2,512,706.06 | | |
| කලින් වර්ෂය සඳහා සකස් කිරීම ... | | (701,636.14) | | |
| ප්‍රවර්තන වර්ෂයේ හිඟය ... | | (1,445,158.31) | 365,911.61 | (11,011,225.38) |
| | | | 21,488,656.14 | 26,891,273.62 |

| **(ආ) නියෝජනය කළා :**<br>ස්ථාවර වත්කම් | සටහන | ගත් මිළ | සමුච්චිත ක්ෂයවීම | ශුද්ධ අගය | |
|---|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උපලේඛනය අනුව ... ... | 1 | 36,659,098.22 | 16,256,821.55 | 20,402,276.67 | 25,019,548.80 |
| ව්‍යාපාර ප්‍රාග්ධනය<br>ජංගම වත්කම් ... ... | 2 | — | 1,797,445.50 | | 7,070,919.53 |
| අඩු කළා :<br>ජංගම බැරකම් ... ... | 3 | — | 711,066.03 | 1,086,379.47 | 5,199,194.71 |
| | | | | 21,488,656.14 | 26,891,273.62 |

**ආර්. විජේරත්න මහතා**
සභාපති

**එච්. එම්. සී. කපිලරත්න මහතා**
මණ්ඩල අධ්‍යක්ෂ

**එස්. සී. හතරසිංහ මිය**
ප්‍රධාන ගණකාධිකාරී

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1986 වර්ෂය අවසානයේ ආදායම් සහ වියදම් ගිණුම්

| ආදායම | සටහන් | 1986 රු. ශ. | 1986 රු. ශ. | 1985 රු. ශ. |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර මුදල් | | 24,650,000.00 | 24,650,000.00 | 19,500,000.00 |
| වෙනත් මාර්ගවලින් ලැබුණු ආදායම ... | 4 | | 57,265.45 | 52,976.09 |
| | | | 24,707,265.45 | 19,552,976.09 |
| **අඩු කළා :** | | | | |
| පරිපාලන හා පොදු වියදම් ... ... | 5 | 15,394,101.00 | | |
| ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු වියදම් ... | 6 | 9,447,713.50 | 24,841,814.50 | 23,501,088.75 |
| | | | (134,549.05) | (3,948,112.66) |
| **එකතු කළා :** | | | | |
| ස්ථිර වත්කම් අලෙවියෙන් සිදුවූ පාඩුව ... | 7 | | 1,310,609.26 | — |
| ආදායමට වඩා වැඩි වියදම ... ... | | | (1,445,158.31) | (3,948,112.66) |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## 1986-12-31 දිනට ස්ථාවර වත්කම් පිළිබඳ උපලේඛනය

සටහන — 1

| ශීර්ෂය | මුලදී ගත් මිල | | | | ක්ෂය වීම | | | | ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 85/12/31 දිනට | එකතු කලා | විකිණා | 86/12/31 දිනට | 85/12/31 දිනට | මෙම වර්ෂයේදී | විකිණා | 86/12/31 දිනට | 86/12/31 |
| මෝටර් රථ ... | 35,812,365.05 | — | 2,689,535.76 | 33,122,829.29 | 12,440,795.52 | 3,464,442.60 | 1,244,288.50 | 14,660,949.62 | 18,461,879.67 |
| කාර්යාල උපකරණ | 2,252,830.12 | 128,600.00 | — | 2,381,430.12 | 1,064,235.74 | 237,718.88 | — | 1,301,954.62 | 1,079,475.50 |
| ලී බඩු ... | 539,620.95 | 4,635.75 | — | 544,256.70 | 157,466.71 | 38,215.42 | — | 195,682.13 | 248,574.57 |
| කාර්යාලීය සුළු උපකරණ ... | 160,019.70 | 450,562.41 | — | 610,582.11 | 82,789.05 | 15,446.13 | — | 98,235.18 | 512,346.93 |
| එකතුව ... | 38,764,835.82 | 583,798.16 | 2,689,535.76 | 36,659,098.22 | 13,745,287.02 | 3,755,823.03 | 1,244,288.50 | 16,256,821.55 | 20,402,276.67 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## 1986-12-31 දිනට ක්‍රියාකාරි මූල් මුදල පිළිබඳ උපලේඛන

සටහන : 2

| ජංගම වත්කම් | 1986 | 1985 |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| ලිපි ද්‍රව්‍ය තොගය ... ... ... ... | 75,887.19 | 104,861.71 |
| ඉදිරියට ගෙවූ වියදම් (සටහන 2.1) ... ... ... | 394,967.68 | 35,643.12 |
| ඉන්ධන තැන්පතු ... ... ... ... ... | 283,300.00 | 259,050.00 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය ... ... ... ... | 104,061.97 | 104,061.97 |
| අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ... ... ... ... | 48,092.55 | 48,092.55 |
| විශේෂ අත්තිකාරම් ... ... ... ... | 1,800.00 | — |
| උත්සව අත්තිකාරම් ... ... ... ... | 61,270.00 | 43,220.00 |
| සේවක මණ්ඩල ණය ... ... ... ... | 36,967.80 | 19,741.17 |
| වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ... ... ... ... | 25,644.35 | 23,864.11 |
| විධායක නිලධාරීන් සඳහා අත්තිකාරම් ... ... ... | 58,569.91 | 713.75 |
| සේවක මණ්ඩලයෙන් ආපසු ලැබුණු මුදල් ... ... ... | 1,336.43 | 1,061.53 |
| අතැති මුදල් ... ... ... ... ... | 3,920.00 | 3,920.00 |
| විවිධ ණයකරුවෝ ... ... ... ... | 9,557.00 | 17,396.55 |
| ඒ. ඈෆ්. එම්. ඒ. (කලින් කරන ගෙවීම්) ... ... ... | 13,880.50 | 14,494.60 |
| ආපසු ලබා ගත යුතු මුදල් මහජන බැංකු මූලස්ථානය ... ... | 4,050.00 | — |
| වියලි කලාප කෘෂිකර්ම ව්‍යාපෘතිය — අනුරාධපුරය ... ... | 200,000.00 | — |
| සේ. අ. අ. හිඟ මුදල් 10% (1983 හා 1984) ... ... ... | 474,140.12 | — |
| ව්‍යාපෘති අධ්‍යක්ෂවරු ... ... ... ... | — | 3,641.77 |
| බැංකුවේ තැන්පත් මුදල් ... ... ... ... | — | 3,789,856.70 |
| භාණ්ඩාගාරයෙන් ආපසු ලබාගත යුතු මුදල් ... ... ... | — | 2,601,300.00 |
| | 1,797,445.50 | 7,070,919.53 |

සටහන : 2.1

| ඉදිරියට ගෙවූ වියදම් — 1987 | |
|---|---|
| | රු. ශ. |
| දයක මුදල් (පුවත් පත්) ... ... ... ... | 6,627.68 |
| ආදායම් බලපත්‍ර ... ... ... ... ... | 360,800.00 |
| සේවක හදිසි අනතුරු රක්ෂණය ... ... ... ... | 27,540.00 |
| | 394,967.68 |

සටහන : 3

| ජංගම බැරකම් | 1986 | 1985 |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| උපචිත වියදම් 1986 (සටහන 3 : 1)) ... ... ... | 280,000.00 | 5,195,000.00 |
| මැතිවරණ කොමසාරිස් ... ... ... ... | 3,819.06 | 3,819.06 |
| ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ... ... ... | 241.80 | 241.80 |
| සී. අයි. ආර්. ඩී. ඒ. පී. ... ... ... ... | 47.85 | 133.85 |
| බැංකු අයිරා ... ... ... ... ... | 426,957.32 | — |
| | 711,066.03 | 5,199,194.71 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## 1986-12-31 දිනට ක්‍රියාකාරී මූල් මුදල පිළිබඳ උපලේඛන

සටහන : 3 — 1

| උපචිත වියදම් | 1986 |
|---|---|
| | රු. ශ. |
| යැපීම් දීමනා ... ... ... ... ... | 25,000.00 |
| ඉන්ධන ... ... ... ... ... | 100,000.00 |
| වාහන අළුත්වැඩියා කිරීම් (සාමාන්‍ය) ... ... ... | 90,000.00 |
| ටයර් සහ ටියුබ් ... ... ... ... ... | 15,000.00 |
| මැතිවරණ කොටඨාශ සඳහා විවිධ වියදම් ... ... ... | 10,000.00 |
| විගණක ගාස්තු ... ... ... ... | 10,000.00 |
| දුරකථන ගාස්තු ... ... ... ... ... | 25,000.00 |
| ගෙවල් කුලී ... ... ... ... ... | 5,000.00 |
| | 280,000.00 |

සටහන: 4

| විවිධ ආදායම් | 1986 |
|---|---|
| | රු. ශ. |
| පාවිච්චි කළ ටයර්/ටියුබ්/පුවත්පත් අලෙවියෙන් ... ... ... | 42,866.00 |
| වේතන ආපසු ගෙවීම් ... ... ... ... | 3,649.00 |
| ඉපිල් ඉපිල් බීජ අලෙවියෙන් ... ... ... ... | 800.00 |
| ඡායාරූප පිටපත් කිරීමෙන් ... ... ... ... | 70.00 |
| දඩ මුදල් ... ... ... ... ... | 125.00 |
| පොලී ... ... ... ... ... | 6,863.22 |
| ව්‍යාපෘති ... ... ... ... ... | 2,892.23 |
| | 57,265.45 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1986 වර්ෂය අවසානයේ ආදායම් වියදම් ගිණුම්

**සටහන :–5**

**පරිපාලන සහ සාමාන්‍ය වියදම් :**

| | | 1986<br>රු. ශ. | 1985<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ගාස්තු | 12,700.00 | 16,300.00 |
| 2. | වැටුප් හා වේතන | 11,780,872.56 | 9,177,345.13 |
| 3. | සේ.අ.අ. හා සේ.භා.අ 15% | 1,753,459.72 | 1,363,815.51 |
| 4. | අතිකාල දීමනා | 37,778.52 | 25,551.77 |
| 5. | තැපැල් ගාස්තු | 102,558.75 | 74,332.65 |
| 6. | ලිපි ද්‍රව්‍ය/මුද්‍රණ වැඩ | 340,601.39 | 264,632.26 |
| 7. | දුරකථන ගාස්තු | 288,987.54 | 313,952.49 |
| 8. | වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම | 74,852.00 | 81,241.00 |
| 9. | දන්වීම් | 47,989.75 | 49,099.50 |
| 10. | විදුලිය | 9,630.60 | 10,824.00 |
| 11. | ගෙවල් කුලී | 486,903.84 | 466,409.51 |
| 12. | කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම් | 39,171.85 | 76,355.85 |
| 13. | කාර්යාල ගොඩනැගිලි වැඩි දියුණු කිරීම | 17,404.28 | 10,968.45 |
| 14. | වැසිකිළි උපකරණ හා පොලිෂ් | 5,275.15 | 4,619.75 |
| 15. | නිල ඇඳුම් | 41,460.00 | 10,215.00 |
| 16. | දායක මුදල් | 37,166.09 | 8,954.16 |
| 17. | සුභසාධක වියදම් | 16,676.95 | 13,224.25 |
| 18. | සභාපතිගේ සංග්‍රහ | 16,293.35 | 9,338.57 |
| 19. | විවිධ වියදම් | 79,314.38 | 138,717.62 |
| 20. | බැංකු ගාස්තු | 3,391.00 | 6,607.95 |
| 21. | විගණක ගාස්තු | 10,000.00 | 10,000.00 |
| 22. | පාරිතෝෂික දීමනා | 40,778.40 | 27,313.00 |
| 23. | සේවක හදිසි අනතුරු රක්ෂණ | 26,892.28 | 2,710.64 |
| 24. | කුලී රිය ගාස්තු | — | 3,625.00 |
| 25. | ජේ. ඒ. සී. සී. | 40,000.00 | 71,081.18 |
| 26. | නීතිඥ ගාස්තු | 28,792.60 | — |
| 27. | ටෙලෙක්ස් | 55,150.00 | — |
| | එකතුව | 15,394,101.00 | 12,237,235.24 |

**සටහන් — 6**

**ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු කිරීමේ වියදම්**

| | 1986<br>රු. ශ. | 1985<br>රු. ශ. |
|---|---|---|
| ඉන්ධන සේවා ආදිය | 3,506,916.28 | 2,969,146.44 |
| වාහනවල සාමාන්‍ය අළුත්වැඩියා | 2,742,147.22 | 2,453,456.49 |
| ටයර් සහ ටියුබ් | 1,208,544.20 | 996,006.91 |
| පාඨමාලා ගාස්තු සහ සම්මන්ත්‍රණ වියදම් | 4,080.00 | 11,816.12 |
| වාහන රක්ෂණ | 557,753.75 | 419,285.23 |
| වාහන බලපත්‍ර ගාස්තු | 375,960.00 | 588,510.00 |
| විදුලිය සැපයුම සඳහා වියදම් | 71,708.49 | 59,925.73 |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | 875,069.19 | 937,858.39 |
| පුහුණු කිරීම් සහ ප්‍රචාරක කටයුතු | 29,313.25 | 1 4,302.60 |
| ග්‍රාමීය යෞවනයන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙල (ටෘටැජ්) | 76,221.12 | 71,944.27 |
| | 9,447,713.50 | 8,522,252.18 |

**සටහන් — 7**

ස්ථාවර වත්කම් අලෙවියෙන් සිදු වූ පාඩුව :

| | රු. ශ. |
|---|---|
| මෝටර් රථ මිළට ගැනීමේදී ගෙවූ මිළ | 2,689,535.76 |
| අඩුකළා : | |
| සංචිත ක්ෂයවීමේ මුදල | 1,244,288.50 |
| | 1,445,247.26 |
| අඩුකළා : | |
| අලෙවි කිරීමෙන් ලත් මුදල | 134,638.00 |
| අලෙවියෙන් සිදු වූ පාඩුව | (1,310,609.26) |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කිරීමේදී පොදු ව්‍යාපාරික විගණන සමාගමක් මට සහාය විය. (මුදල් පණතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව සවිස්තරාත්මක වාර්තාවක් 1987 මැයි 05 දින සභාපතිවරයා වෙත යවන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යයි මවිසින් අදහස් කරන මාගේ නිරීක්ෂණයන් පහත දැක්වෙන ඡේදවල සඳහන්වේ.

1.1 **විගණන විෂය පථය**

මෙම වාර්තාවේ අඩංගු විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචන සහ ප්‍රමාණවත් ගණුදෙනු නියැදි පරීක්ෂණයන් මත පදනම් වී ඇත. එම සමාලෝචන සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පණතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපතිට අභිමතානුසාරී බලතල පැවරේ.

2. **ගිණුම්**

2.1 **විගණන මතය**

ඉදිරිපත් කර ඇති ගිණුම්, මෙම වාර්තාවේ පහත සඳහන් ඡේදයන්හි දැක්වෙන අදහස් දැක්වීම් වලට යටත්ව ඉකුත් වර්ෂයේ අනුගමනය කරන ලද පදනමට අනුකූලව පොදු පිළිගත් ගණක මූලධර්ම පදනම් කරගෙන සතුටුදයක ලෙස පිළියෙල කර ඇති බව මගේ මතයයි.

2.2 **මූදල්මය ප්‍රතිඵල**

ගිණුම්වලට අනුව, 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු. 14,45,158 ක ආදයම් ඉක්ම වූ වියදම් අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා රු. 39,48,112 ක ආදයම ඉක්ම වූ වියදම් අතිරික්තයක් විය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 1986 | | 1985 | |
| | රු. | රු. | රු. | රු. |
| **ආදයම** | | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ දයකය ... | 2,46,50,000 | | 2,00,08,700 | |
| අඩුකළා: කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත අයමුදල් පැවරීම ... ... | — | 2,46,50,000 | 5,08,700 | 1,95,00,000 |
| විවිධ ආදයම් ... ... | | 57,265 | | 52,976 |
| | | 2,47,07,265 | | 1,95,52,976 |
| අඩුකළා: වියදම් පරිපාලන සහ පොදු ... ... | 1,53,94,101 | | 1,22,37,235 | |
| මෙහෙයුම් සහ නඩත්තු ... ... | 94,47,713 | | 85,22,252 | |
| (*) ක්ෂය ... ... | — | 2,48,41,814 | 27,41,601 | 2,35,01,088 |
| | | (1,34,549) | | (39,48,112) |
| එකතුකළා: ස්ථාවර වත්කම් විකුණුම් අලාභ ... | | (13,10,609) | | — |
| ආදයම ඉක්ම වූ වියදම් අතිරික්තය ... ... | | (14,45,158) | | (39,48,112) |
| ඉකුත් වර්ෂය සඳහා ගැලපීම ... ... | | (7,01,636) | | (27,06,431) |
| | | (21,46,794) | | (66,54,543) |
| එකතුකළා: ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභය/(පාඩුව) | (1,10,11,225) | — | | (43,56,682) |
| (*) 1979 සිට 1985 දක්වා අයකළ ක්ෂය ආපසු බැරකිරීම ... ... | 1,35,23,931 | 25,12,706 | | |
| ඉදිරියට ගෙන ගිය ශේෂය ... ... | | 3,65,912 | | (1,10,11,225) |

(*) කරුණාකර 2.5.3 ඡේදය බලන්න.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

2.3 මූල්‍ය ව්‍යුහය

1986 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ව්‍යුහය 1985 දෙසැම්බර් 21 දිනට පැවති තත්ත්වය සමග සසඳා පහත දැක්වේ:

| | දෙසැම්බර් 31 දිනට 1986 | 1985 |
|---|---|---|
| | රු. | රු. |
| **සම්පත්** | | |
| දායක ප්‍රාග්ධනය ... ... ... ... | 3,84,02,499 | 3,79,02,499 |
| සමුච්චිත ක්ෂය ප්‍රතිපාදනය ... ... ... ... | (1,72,79,754) | — |
| සමුච්චිත අතිරික්තය (අලාභය) ... ... ... ... | 3,65,911 | (1,10,11,225) |
| | 2,14,88,656 | 2,68,91,274 |
| **උප යෝජනය** | | |
| අඩුකළ වටිනාකමට ස්ථාවර වත්කම් ... ... ... | 2,04,02,277 | 2,50,19,549 |
| ශුද්ධ ජංගම වත්කම් ... ... ... | 10,86,379 | 18,71,725 |
| | 2,14,88,656 | 2,68,91,274 |

2.4 අරමුදල් ප්‍රභවය සහ යෙදවීම

සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ අරමුදල් ප්‍රභවය සහ යෙදවීම පහත ප්‍රකාශයෙන් දැක්වේ:

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| **අරමුදල් ප්‍රභවය** | | | |
| ප්‍රාග්ධන දායකය ... ... ... | | | 5,00,000 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් මුදල ... ... | | | 1,34,638 |
| | | | 6,34,638 |
| **අරමුදල් යෙදවීම** | | | |
| ආදායම ඉක්මවූ වියදම් අතිරික්තය ... ... | (14,45,158) | | |
| අඩුකළා: ස්ථාවර වත්කම් විකුණුම් අලාභ ... ... | 13,10,609 | | |
| වර්ෂයේ කාරක අලාභය ... ... | (1,34,549) | | |
| ඉකුත් වර්ෂය සඳහා ගැලපීම ... | (7,01,636) | (8,36,185) | |
| ස්ථාවර වත්කම් අත්කරගැනීම ... ... | | (5,83,798) | (14,19,983) |
| පහතින් විග්‍රහ කර ඇති පරිදි කාරක ප්‍රාග්ධනයේ අඩුවීම ... | | | (7,85,345) |

| | කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම වැඩිවීම | අඩුවීම | |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බැංකු සහ මුදල් ශේෂ අඩුවීම ... ... ... | | 42,16,814 | |
| අනිකුත් ජංගම වත්කම් අඩුවීම ... ... ... | | 14,83,618 | |
| ජංගම බැරකම් අඩුවීම ... ... ... | 49,15,087 | | |
| | 49,15,087 | 57.00,432 | |
| | | 49,15,087 | |
| කාරක ප්‍රාග්ධනයේ ශුද්ධ අඩුවීම ... ... | | | 7,85,345 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**2.5 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම**

**2.5.1 ගිණුම්වල අත්හැරීම්**

| ගණුදෙනු විෂය | වටිනාකම රු. | අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක අර්ථසාධක දඩ මුදල් | 6,97,979 | 1983, 1984 වර්ෂයන්හිදී සේවක අර්ථසාධක අරමුදල් සඳහා වන දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම තම පැනවූ දඩ මුදල ගිණුම් ගත නොකර තිබිණ. |

**2.5.2 වැරදි හෙළිදරව් කිරීම**

| ගණුදෙනු විෂයය | වටිනාකම රු. | අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවා ගාස්තු | 1,132 | ඉන්ධන වියදම් ලෙස ගිණුම් සකස්කර තිබිණ. |
| (ආ) විවිධ ණයගැතියෝ | 9,557 | අධ්‍යක්ෂ මණ්ඩලයට හා කාර්ය මණ්ඩලයට දෙන ලද විශේෂ ණය එසේ නොදක්වා ණය ගැතියන් ලෙස දක්වා තිබිණ. |

**2.5.3 ගිණුම් තැබීමේ පදනමේ වෙනස්කම්**

| විෂයය | මුදල රු. | අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වර්ෂයේ ක්ෂය කිරීම | 37,55,823 | ඉකුත් වර්ෂය දක්වා ස්ථාවර වත්කම් ක්ෂය ආදයම් වියදම් ගිණුමට එරෙහිව ලියා හරින ලදී. සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලදී ගිණුම් පිළිවෙත වෙනස්කොට සමුච්චිත ක්ෂය යටතේ ප්‍රාග්ධන දායකත්ව යෙන් අඩු කොට දක්වා ඇත. මෙය පොදු පිළිගත් ගණක සම්මතයන්ට පටහැනිය. එසේම සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල සැසඳීම අනර්ථවත් කරයි. |
| (ආ) සමුච්චිත ක්ෂය | 1,72,79,754 | ඉකුත් වර්ෂය දක්වා වූ ගිණුම් පිළිවෙතට පටහැනිව සමුච්චිතය ක්ෂය ප්‍රාග්ධන දායකත්වයෙන් අඩු කොට දක්වා ඇත. |
| (ඇ) පෙර වර්ෂ සඳහා ගැලපුම් | 7,01,636 | ඉකුත් වර්ෂවලදී මෙම ගැලපුම් ආදයම් වියදම් ගිණුමේ ගලපන ලදී. සමාලෝචිත වර්ෂයේදී ගිණුම් පිළිවෙත වෙනස් කොට එම ගැලපුම් සටහන් ශේෂ පත්‍රයේ දක්වා ඇත. |

**2.5.4 විගණනය සඳහා සාධක රු. 4,050/-**

ජංගම වත්කම් යටතේ මහජන බැංකුවෙන් ලැබිය යුතු ලෙස දක්වෙන රු. 4,050.00 ක මුදල මහජන බැංකුව විසින් සනාථ කර නැත. අනිසි ලෙස වෙනස් කළ චෙක්පතක් සඳහා වන මෙහි වගකීම මහජන බැංකුව භාරගත් බවට සාක්ෂි නොමැත.

**2.5.5 පරමාර්ථ නීති රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

පරමාර්ථ නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ:

| පරමාර්ථ, නීතිරීති සහ රෙගුලාසි වලට යොමුව | අවශ්‍යතාවය | අනුකූල නොවීම |
|---|---|---|
| 1. 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 22(3) වගන්තිය | අධිකාරියේ අනුදත් ප්‍රාග්ධනය වැඩිකිරීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය අවශ්‍යය. | රු. 2,00,00,000 සිට රු. 3,84,02,499 දක්වා ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| 2. 1971 අංක 38 දරණ මුදල් පනත (අ) 13(5) බී වගන්තිය | ණයගැතියන්, ණය හිමියන් හා තොග සහ ගබඩා පිළිබඳව විගණකාධිපතිවරයා විසින් අවශ්‍ය කරනු ලබන වාර්තා. | ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 13(5) (සී) වගන්තිය | විගණකාධිපතිවරයා විසින් අවශ්‍ය කරනු ලබන අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා | ඉදිරිපත් කර නොතිබුණි. අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මකව නොතිබුණි. |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

| | | | |
|---|---|---|---|
| (ඇ) | 16(2) වගන්තිය | ණය පහසුකම් ලබාගැනීමේදී මුදල් ඇමති වරයාගේ එකඟත්වය ඇතිව කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුව ඇත. | අදාළ අනුමැතිය නොමැතිව 1986.12.31 දිනට බැංකු ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කර මින් රු. 4,26,957ක අයිරාවක් පෙන්නුම් කර ඇත. |
| (ඈ) | සේවක අර්ථසාධක අර මුදල් ආඥාපනත | සේවක අර්ථසාධක දායක මුදල් අප්‍රමාදව අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කිරීම | 1983 හා 1984 වර්ෂ සඳහා ගෙවිය යුතු රු. 2,01,926ක දායක මුදලක් 1986.12.31 දින ගෙවා නොතිබුණි. |

2.5.6 **ඵලදායී නොවන ගණුදෙනු**

1982 වර්ෂයේදී අධිකාරිය විසින් මිළ දී ගත් වාහන 12ක් 1986 වර්ෂයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා තිබුණි. මෙම වාහන වල විස්තර පහත දක්වා ඇත:

| වාහන ලියාපදිංචි අංකය | මිළ දී ගත් දිනය හා මෝස්තරය | | මිළ දී ගත් වටිනාකම රු. | ක්ෂය කළ වටිනාකම රු. | ධාවනය කළ කි.මී. ගණන | සමීක්ෂණ මණ්ඩලය මගින් තීරණය කරන ලද අඩුම මිළ රු. | විකුණුම් මිළ රු. |
|---|---|---|---|---|---|---|---|
| 31 ශ්‍රී 9132 | 82.09.10 | රුමේනියන් | 2,24,128 | 1,20,437 | 72,546 | 15,000 | 10,000 |
| 31 ශ්‍රී 9153 | 82.09.10 | ,, | 2,24,128 | 1,20,437 | 38,841 | 28,000 | 15,000 |
| 31 ශ්‍රී 9139 | 82.09.10 | ,, | 2,24,128 | 1,20,437 | 38,348 | 10,000 | 6,250 |
| 31 ශ්‍රී 9143 | 82.03.04 | ,, | 2,24,128 | 1,20,437 | 24,000 | 25,000 | 10,100 |
| 31 ශ්‍රී 9151 | 82.09.20 | ,, | 2,24,128 | 1,20,437 | 49,564 | 10,000 | 6,250 |
| 31 ශ්‍රී 9155 | 82.08.26 | ,, | 2,24,128 | 1,20,437 | 23,778 | 25,000 | 12,750 |
| 31 ශ්‍රී 9157 | 82.08.27 | ,, | 2,24,128 | 1,20,437 | 37,786 | 15,000 | 10,500 |
| 31 ශ්‍රී 9131 | 82.08.02 | ,, | 2,24,128 | 1,20,437 | 42,302 | 15,000 | 11,000 |
| 31 ශ්‍රී 9158 | 82.02.12 | ,, | 2,24,128 | 1,20,437 | 48,004 | 25,000 | 15,500 |
| 31 ශ්‍රී 9140 | 82.08.11 | ,, | 2,24,128 | 1,20,437 | 58,837 | 25,000 | 10,100 |
| 31 ශ්‍රී 9159 | 82.08.12 | ,, | 2,24,128 | 1,20,437 | 68,536 | 15,000 | 10,750 |
| 31 ශ්‍රී 9156 | 82.08.11 | ,, | 2,24,128 | 1,20,437 | 44,072 | 30,000 | 18,000 |
| | | | 26,89,536 | 14,45,244 | | 2,38,000 | 1,36,200 |

මේ පිළිබඳ විගණන නිරීක්ෂණයන් පහත සඳහන් පරිදිය:

(i) පිරිවැය හා ක්ෂය කරන ලද වටිනාකම සසඳා බලන විට සමීක්ෂණ මණ්ඩලය විසින් එක් එක් වාහනය වෙනුවෙන් නිශ්චය කරන ලද අවම මිළ ප්‍රමාණවත් නොවන බව පෙනී යයි.

(ii) සියළුම වාහන විකුණා ඇත්තේ සමීක්ෂණ මණ්ඩලය විසින් නිශ්චය කරන ලද මිළට වඩා අඩුවෙනි.

3. **මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රුපියල් ලක්ෂ 14.45ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌනතාවය රුපියල් ලක්ෂ 39.48ක් වූයෙන් රුපියල් ලක්ෂ 25.03ක වැඩිවීමක් දක්විණි. මූල්‍ය ප්‍රතිඵලවල වැඩිවීමට තුඩුදුන් සාධක පිළිබඳ විශ්ලේෂණයක් පහත දක්වේ:

| | හිතකර රු. (ලක්ෂ) | අහිතකර රු. (ලක්ෂ) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකයේ වැඩිවීම | 51.53 | |
| වියදම් වැඩිවීම | | 13.40 |
| ස්ථාවර වත්කම් විකුණුම් අලාභ | | 13,10 |
| | 51.53 | 26.50 |
| අඩු කළා | 26.50 | 26.50 |
| | 25.03 | |

3.2 **අයවැය පාලනය**

අයවැය පාලනය ඵලදායී ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව පෙණින. එක් කාර්යයක් සඳහා වෙන්කර තිබූ මුදල් වෙනත් කාර්යයන් සඳහා වියදම් කර තිබුණි.

**විගණකාධිපති.**